# THE WHITE HACKLE

## JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

## ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව



බ්‍රිගේඩියර් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී පීඑස්සී
නවවන රෙජිමේන්තු අධිපති ලෙස
වර්ණ ධජයට
ආචාර සමාචාර පුද කරමින්...

54th Issue
OCTOBER 2007

# නව නියමුවාණන්ගේ රෙජිමේන්තු සංචාරයේ විශේෂ දසුන්......



නව තනතුරේ වැඩ භාරගනිමින්.....



කැලිප්සෝ කණ්ඩායමේ වගතුග විමසමින්.....



රුක් රෝපණය කරමින්...



සියළු නිල දිවා භෝජන සංග්‍රහය භුක්ති විඳීමට පෙර....

# THE WHITE HACKLE

OCTOBER 2007 VOLUME 13 NO 02 54th ISSUE



නිවැරදි ඉලක්කය ගැනීමට
පෙර පුහුණුවීම් ලබමින්

9 පිටුව



ශක්තිය උරගා
බලනා ජාතික
ශූරතාවයට
හිමිකම් කීමට
මොහොතකට
පෙර....

23 පිටුව




තෙරුවන් නැමද ආශිර්වාද ලබමින්...

30 පිටුව

## Headlines

Page


| | |
|---|---|
| නව රෙජිමේන්තු අධිපති | 3 |
| පාබල සුපිරි තරු | 5 |
| දුම්වැටි භාවිතයෙන් අත්මිදෙමු | 6 |
| තෙවෙනි වසර සමරණ ශ්‍රීලපාහ ජනාධිපති ආරක්ෂක බණ්ඩය | 8-9 |
| ස්වාපනික ප්‍රතිකාර යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? | 13 |
| ළමා අපයෝජනයට වැට බඳිමු | 15 |
| පදක්කම් පළඳනා පිළිබඳ කෙටි සටහන් | 16-17 |
| ඉතිහාසය වනාහි මිනිසෙකුගේ ජීවිතය නැවත දක්වන කැඩපතකි | 18 |
| අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික රයිෆල් තරඟාවලිය | 19 |
| 1 ශ්‍රීලපාහ 57 වන සංවත්සරය | 20-21 |
| මේ ගැන ඔබ සිතන්නේ කුමක්ද? | 24-26 |
| මුදලේ වගතුග | 28-29 |
| ශ්‍රී ලංකා පාබල හමුදා මෑණියන්ගේ 11 වන ළදරුවා බිහි විය | 30 |
| අම්මා කෙනෙක් වෙන්න යන තාත්තා කෙනෙක් | 33 |
| ඉලක්ක ගත ඉලක්කයක් | 38 |


### කවරයේ කථාව.

රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ හි නව රෙජිමේන්තු අධිපති ලෙසින් වැඩ භාරගත් බ්‍රිගේඩියර් කේවීඩීවී කරුණාසේකර ආර්වස්පී පීඑස්සී හට පුදකරන ලද සම්මාන පෙළපාලිය පිළිගනිමින්...

Design & Printed by:
*Dinuka* **Graphic Network**
197, High Level Road, Pannipitiya.

THE WHITE HACKLE

**SRI LANKA LIGHT INFANTRY MAGAZINE**

**Col of the Regt.**
Brig KADA Karunasekara RSP, psc

*The White Hackle, Staff*

| | |
|---|---|
| **Editor-in Chief** | - Col W Weerakkody (Centre Commadant) |
| **Assistant Editor** | - Lt Col L R Santhanam SLLI (SO 1 (A) RHQ SLLI) |
| **Associate Editors** | - Maj HMU Herath RWP RSP psc SLLI (SO 11 RHQ SLLI) |
| | Lt AUKG Yatagama SLLI (OIC White Hackle) |
| **Chief Consultant** | - Maj Gen HV Athukorale VSV, psc, FBIM (Rtd-Reg Force) |
| | Brg AER Abeysinghe KSV (Rtd-Vol Force) |

**Publisher** - Regimental Centre Sri Lanka Light Infantry.

*The White Hackle* is published quarterly under the supervision of the Regimental Centre Commandant to provide the Regiment with information on people, policies, operations, technical developments, views, opinions and ideas about the Sri Lanka Light Infantry ● Manuscripts of interest to the Regiment are invited. ● Direct Communication is authorized to Editor, or Asst Editor, The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 2855204 or 2855356 - 60 Extn. 7380 or 7404. ● Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. ● Publication of this periodical is authorized by the Dte of PA, Army HQCBO by letter No. A/275/27 of 16 Mar '94. ● Use of funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

# Feedback

## අදහස් උදහස් හා විවේචන

## Readers Please Write in

The WHITE HACKLE, the Voice of the Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 54th issue.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome. What is valued is our making the attempt, then we can surely do our bit. Express your thoughts, ideas, opinons, and criticisms, hopes and fears through 'THE WHITE HACKLE' the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience go ahead and write in to the 'THE WHITE HACKLE'. We are willing to accept and use what if of a standard, like sketches, stories and poems, whatever comes from your throughts and your pen.

Our Motto is "Ich Dien" "I Serve". Let' WHITE HACKLE' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

*Editor in Chief*

## හිතවත් පාඨකය, කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න.

ශ්‍රී ලංකා පාබල හමුදාවේ හඬ ඉතා උසස් ලෙස නංවන "වයිට් හැකල්" සඟරාවේ පනස් හතරවන කලාපයත් සමඟ එහි ළදරු අවධිය අවසන්කල අප ඉතා විශ්වාසවන්තව ඉදිරියට පිය මසවමින් පරිනත භාවයට පත් වෙමින් සිටින්නෙමු. රෝම අධිරාජ්‍යය ඉතා කෙටි කලකින් ගොඩ නැගුවක් නොවන අතර අපි ද පියවරින් පියවර ඉතා විශ්වාසවන්තව ස්ථිර අඩිතාලමක් සඳහා ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

එනමුත් අප දනට ලබා ඇති ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැක. තව ඉදිරියට යා යුතු මඟ බොහෝ ය. එය දුෂ්කර ද නැතහොත් බාධාවකින් තොර වන්නේ දයි තීරණය වන්නේ ඔබගෙන් ලැබෙන මහඟු සහයෝගය මතය. 'වයිට් හැකල්' සඟරාවේ ප්‍රගතිය සඳහා අප සියලු දෙනාටම ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. ඔබගෙන් සුළුවෙන් හෝ අප වෙත ලැබෙන සහයෝගය සෑම අවස්ථාවකම අපි අගයමු. අවශ්‍ය වන්නේ ඔබගේ උත්සාහයයි. එයින් අප වඩාත් ධෛර්‍යයමත් වන අතර අපගේ කාර්යය නිසි අයුරු ඉටු කිරීමට අවශ්‍ය පන්නරය ලබන්නෙමු.

මෙම සඟරාව පිළිබඳ හා එහි ලිපි රචනා පිළිබඳ ඔබගේ අවංක අදහස් හා විවේචන අප වෙත එවන්න. එය වයිට් හැකල් සඟරාවේ ඉදිරි ගමනට මහඟු අත්වැලකි. 'වයිට් හැකල්' සඟරාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභිමානවත් ඉතිහාසයකට හිමිකම් කියන පෞඪතම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා පාබල හමුදාව මගින් ත්‍රෛයි මාසිකව පල කරනු ලබයි.

මෙම ප්‍රෞඪ රෙජිමේන්තුවේ සාමාජිකයකු වී සිටීම ගැන ඔබ ඔබ ගැනම ආඩම්බර විය යුතු ය. මෙම රෙජිමේන්තුව අනාධිමත් කලක් රැකගත් විලසට අප විසින් එය ඉදිරියට ද සුරැකිය යුතුය.

ඔබ බලඇණිවල විශේෂ අවස්ථා පිළිබඳ ඔබ හට පැවසීමට ඇත්නම් 'වයිට් හැකල්' සඟරාව වෙත ලියන්න. ඔබගේ ලිපි ඉතා උසස් තත්ත්වයක ඇතැයි අප විශ්වාස කරන අතර එම ලිපි 'වයිට් හැකල්' සඟරාවේ පල කිරීමට අප පුල පුලා බලා සිටින්නෙමු.

එමෙන්ම ඔබගේ උසස් කවි සංකල්පනා හා සිතුවම් සඳහා ද මෙම සඟරාවේ ඉඩ ප්‍රස්ථාව ඇත.

අපගේ ආදර්ශ පාඨය වන **'සේවය කරමි'** මත පිහිටා අප එකිනෙකාට, රෙජිමේන්තුවට, හමුදාවට හා රටට සේවය කරමු. අපගේ පාබල හමුදා ධජය ඉතා විශ්වාසවන්තව, අභිමානයෙන්, ඉතා ඉහලින් ලෙළදුන් විලසටම, තව දුරටත් ලෙළදීමට අවස්ථාව උදා කර දෙමු.

*ප්‍රධාන කර්තෘ*

THE WHITE HACKLE is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We invite readers' views. Under 150 words; A post card will do - and include your name, rank and address. We will withhold your name if you so desire and may condense your views because of space. We cannot publish or answer every one, but we will use representative views. Send your letters to:

**Feedback,**
The White Hackle,
RHQ SLLI, Army Cantonment,
Panagoda, Homagama.



# නව රෙජිමේන්තු අධිපති බ්‍රිගේඩියර් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී පීඑස්සී



ශ්‍රී ලංකා පාබල මෑණියන්ගේ නාමය දිදුලන්නට පෑයු තවත් එක් තරුවක් ලෙසින් 1984 ජනවාරි 14 දින යුද්ධ හමුදාවේ අධිකාරියට පත්ව මාතෘ භූමියේ නිදහස් නිවහල් බව රැකගැනීමට තමන් පාසැල් අවධියේ ලද දැනුම හා යුධ දැනුම උපයෝගී කරගනිමින් බණ්ඩහාර නිලධාරී ලෙසින් පාබල හමුදාවට එක්වුනි. එදා තැබූ පළමු පියවර ක්‍රමක් ක්‍රමයෙන් ඉහලට ඔසවා බණ්ඩ හාර නිලධාරී සිට බළඇණි අණදෙන නිලධාරී දක්වා සෑම තනතුරක්ම හොබවා ඇති මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී වඩමාරච්චි, බලවේගය1,11,වාලම්පුරි,භූමිකම්පා,යාල්දේවි,යනක්‍රියාන්විත වලට සහභාගි වෙමින් එම ක්‍රියාන්විතයන්ගේ ජයග්‍රහණය ලබා ඒ දැනුමත් උපයෝගි කරගනිමින් 7 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ලෙස නායකත්වය ගෙන තමා යටතේ සිටින අයවළුන් ඉතා දක්ෂ ලෙස හසුරුවා සර්ප දෂ්ඨ, බැරල් වෝම්අප් ,ෂේක් හෑන්ඩ් , අකුණු පහර, රිවිරැස, සත්ජය, යන ක්‍රියාන්විතයන් වලදී අනෙකුත් බලඇණි වලට ආදර්ශයක් වෙමින් ඉතා විශිෂ්ඨ ලෙස ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයේ තිබූ ප්‍රදේශ බේරා ගැනීමට හැකිවිය. එම විජයග්‍රහණයන් අතුරින් කිලිනොච්චි නගරය බේරාගෙන පාබල මෑණියන්ගේ ධජය ඉහළට ඔසවා තබන්නට ද හැකිවිය.

එම ජයග්‍රහණ ලබාගැනීමට හදාරන ලද දෙස් විදෙස් පාඨමාලාවන් මහෝපකාරී වූ අතර එම පාඨමාලාවන් සඳහන් කරනවා නම්, අණ හා මාණ්ඩලික පාඨමාලාව - ඉන්දියාව, කමාන්ඩෝ පාඨමාලාව - පකිස්ථානය, තරුණ නිලධාරී පාඨමාලාව - පකිස්ථානය, සාම සාධක පාඨමාලාව - බංග්ලාදේශය ඉන් කිහිපයකි.

මෙසේ හදාරන පාඨමාලාවන්ට අමතරව තම වගකීම් නොපිරිහෙලා ඉටු කිරීම වස් ඒ දැනුම් සම්භාරය යුධ හමුදාවට ලබාදීමට විධායක අධිකාරී - සපුපා අම්පාර, නිලධාරී උපදේශක යුහවිපි දියතලාව, ප්‍රමානි I ක්‍රියා අම පුහුණු අධ්‍යක්ෂක යුහමු, සේනාවිධායක රෙම ශ්‍රීලපාහ, 516 බලසේනාධිපති, 233 බළසේනාධිපති ලෙසින් රාජකාරී ඉටු කරන ලදි. ශ්‍රී ලංකා යුධ හමුදා මෑත ඉතිහාසය වර්ණවත් කරමින් 2004 වර්ෂයේ 750 ක භට පිරිසකගේ අණ දීම් භාර ගෙන ශ්‍රී ලංකාවට ගව් ගණනක් දුරින් වු හයිටි රාජ්‍යයේ සාම සාධක රාජකාරීන් ඉටු කිරීමට අවස්ථාව ලබාගෙන යුධ විශාරදයන් ලෙසින් හඳුන්වන ඇමෙරිකාව, බ්‍රසීලය, චීනය, පකිස්ථානය, චිලී, ඉක්වදෝර්, ජෝර්දාන් , පිලිපීනය, ආජන්ටිනා යන රටවල් වල යුධ නායකයින් විතයට පත්කරමින් හයිටි රාජ්‍යයේ දරුණු සංවිධානයක් වන ෆාඩී සංවිධානය නතු කරගෙන සිටි පෙට්ටිගෝවේ පොලිස් ස්ථානය විනාඩි කිහිපයකින් තම යටතට ගෙන ශ්‍රී ලංකා මෑණියනගේ නාමය බබලවන්නට විය. මෙතෙක් ශ්‍රීලංකා හමුදාවේ රණ ශූරත්වය ගැන අවතක්සේරුවෙන් කථා කල යුධ විශාරදයන්ගේ ඇස් කන් ඇරවන්නට මෙමඟින් හැකියාව ලැබිණි ලක් මෑණියන්ගේ දූ පුතුන් කොතරම් දක්ෂද, එඩිතරද, යන්න අද එම පුද්ගලයින්ට ඒත්තු ගැන්වීම මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ නායකත්වයෙන් හැකිවිය.

මෙවැනි සෙන්පතියන් සිටින රෙජිමේන්තුවේ රාජකාරී කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. ඔබ අපට ආඩම්බරයකි, ශක්තියකි, ධෛර්යයකි. නව රෙජිමේන්තු අධිපති තුමනි ඔබට ශ්‍රීලපාහ සියළුම නිලයින්ගේ උණුසුම් සුභ පැතුම් පුදන්නෙමු...

**වයිට් හැකල් ප්‍රකාශන අංශය**

# රණ විරුවෙකුගේ අභීත පැතුම



අපට නියම රටක් ඇත
ඒ රට හැර අන් රටක් නැත
දෙපයින් නැගිටිය යුතුව ඇත
ඒ රට නුඹ දිනිය යුතු ඇත

එපා දෙන්නට මේ රට උකසට
ණය බර වෙන්න එපා අහසට
අසරණ කරනු එපා මගේ මව් රට
ගෙන යව් විරුවණි මගේ රට ඉදිරියට

කිරට හැරුණේ රුධිරයයි මව්නේ
නුඹේ සවිය අපමණයි මේ රටට වරුනේ
දෙපයින් නැගිට්ටි මේ රණ විරුවනේ
විය ගියත් නැත මේ රට සතුරාට දෙන්නේ

රුධිරය ගැළුවත් රණ බිම තිසාරා
කම්කටොළු නැගුණත් මේ දිවිය පුරා
මේ රට එක්සේසත් කරන තුරා
නැහැමට නින්දක් මේ දිවිය පුරා

මරණය අපට උතුම් මවුනේ ලක් මවුනේ
නැවත ඉපදේවි අප මේ දෙරණේ
මිහිතලය මත ඇති එකම වරුණේ
ඔබ නොවේද මාගේ ලක්මවුනේ

නිර්මාණය :
නි/64064 **කපිතන් කේජීආර්සී කුමාර ආර්එස්පි ශ්‍රීලපාහ**
3 ශ්‍රීලපාහ - සුනභාත අතරමැදි කඳවුර

# සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරව දැක්වීම සඳහායි

# IN HONOUR OF THOSE WHO DIED IN SERVICE

1983 වසරේ සිට මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවි පුදකළ ශ්‍රීලපාහ විරෝධාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් මියගිය අයගේ නාම ලේඛණය 1999 ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පළ කරනු ලැබේ.

| S:No | Regt No | Rank | Name | Unit | Location | Date |
|---|---|---|---|---|---|---|
| 2427 | S/2D01543 | L/Cpl | Thalwatta S | 2(V)SLLI | Kilali | 26-Sep-2000 |
| 2428 | S/312809 | L/Cpl | Wijitha Kumara MDPGR | 7SLLI | Sarasale | 26-Sep-2000 |
| 2429 | S/307044 | L/Cpl | Abeysinghe AMNK | 3SLLI | Kilali | 27-Sep-2000 |
| 2430 | S/302595 | Cpl | Indrarathne KMG | 3SLLI | Kilali | 27-Sep-2000 |
| 2431 | S/13467 | S/Sgt | Kumararathne SA., (RSP) | 3SLLI | Kilali | 27-Sep-2000 |
| 2432 | S/276027 | L/Cpl | Ranathunga EG | 7SLLI | Sarasale | 27-Sep-2000 |
| 2433 | S/311461 | L/Cpl | Rathnayake RMP | 3SLLI | Kilali | 27-Sep-2000 |
| 2434 | O/63278 | Capt | RSC Wasudeva | 3SLLI | Kilali | 27-Sep-2000 |
| 2435 | S/313348 | L/Cpl | Saman Kumara TM | 3SLLI | Kilali | 27-Sep-2000 |
| 2436 | S/2D00904 | S/Sgt | Sunil Jayaweera G | 2(V)SLLI | Kilali | 27-Sep-2000 |
| 2437 | S/11969 | WO1 | TP Pushpakumara, (RSP) | 3SLLI | KIlali | 27-Sep-2000 |
| 2438 | S/2D02483 | Cpl | Udaya Kumara GV | 2(V)SLLI | Kilali | 27-Sep-2000 |
| 2439 | S/285752 | L/Cpl | Wilson TMGAS | 3SLLI | Kilali | 27-Sep-2000 |
| 2440 | S/310859 | L/Cpl | Ravindra Kumara HMCS | 7SLLI | Palley | 28-Sep-2000 |
| 2441 | S/306029 | L/Cpl | Sarath Kumara MG | 7SLLI | Palley | 28-Sep-2000 |
| 2442 | S/303211 | Sgt | Wijethunga SG | 7SLLI | Palley | 28-Sep-2000 |
| 2443 | S/280654 | L/Cpl | Jayalath RGPAN | 6SLLI | Nagarkovil | 30-Sep-2000 |
| 2444 | S/313985 | L/Cpl | Kusum Kumara TGNM | 3SLLI | Kilali | 30-Sep-2000 |
| 2445 | S/285362 | L/Cpl | Nishantha MA | 7SLLI | Sarasale | 3-Oct-2000 |
| 2446 | S/309248 | Cpl | Somarathne KGH | 7SLLI | Sarasale | 3-Oct-2000 |
| 2447 | S/14D00605 | WO11 | Jayathilaka YM | 14(V)SLLI | Kilali | 9-Oct-2000 |
| 2448 | S/313351 | L/Cpl | Pushpakumara GMS | 3SLLI | Kilali | 9-Oct-2000 |
| 2449 | S/286046 | L/Cpl | Jayantha AGS | 6SLLI | Ariyalai | 10-Oct-2000 |
| 2450 | S/285486 | L/Cpl | Bandara WAK | 3SLLI | Nagarkovil | 20-Oct-2000 |
| 2451 | S/304101 | Cpl | Jayalath BWP | 3SLLI | Nagarkovil | 20-Oct-2000 |
| 2452 | S/302635 | Sgt | Senarathne WTN | 3SLLI | Nagarkovil | 20-Oct-2000 |
| 2453 | S/314052 | L/Cpl | Wickramasinghe KMJ | 3SLLI | Nagarkovil | 20-Oct-2000 |
| 2454 | S/302148 | Sgt | Wijesinghe WGP | 3SLLI | Nagarkovil | 20-Oct-2000 |
| 2455 | S/306145 | L/Cpl | Ranjith Y | 7SLLI | Sarasale | 22-Oct-2000 |
| 2456 | S/308392 | Sgt | Sisira Kumara KPGC | 7SLLI | Sarasale | 1-Nov-2000 |
| 2457 | S/2D02172 | Cpl | Jayaruwan KLS | 2(V)SLLI | Kilali | 6-Nov-2000 |
| 2458 | S/306157 | L/Cpl | Hettiyawatta PK | 7SLLI | Sarasale | 19-Nov-2000 |
| 2459 | S/301344 | L/Cpl | Amarasena KWGJ | 4SLLI | Sarasale | 20-Nov-2000 |
| 2460 | S/15277 | S/Sgt | Bandara AMN | 4SLLI | Sarasale | 20-Nov-2000 |
| 2461 | S/285498 | L/Cpl | Gamage SP | 7SLLI | Sarasale | 20-Nov-2000 |
| 2462 | S/315081 | L/Cpl | Chaminda KAIR | 3SLLI | CBO Hos | 29-Nov-2000 |
| 2463 | O/63020 | Lt | KAWW Kodithuwakku | 1SLLI | Mannar | 30-Nov-2000 |
| 2464 | S/305492 | Cpl | Priynatha SHA | 1SLLI | Mannar | 30-Nov-2000 |
| 2465 | S/132754 | L/Cpl | Bandara UHBI | 3SLLI | Chavakachcheri | 5-Dec-2000 |
| 2466 | S/314183 | Cpl | Bopitiyagoda WPS | 3SLLI | Chavakachcheri | 5-Dec-2000 |
| 2467 | S/313780 | L/Cpl | Chandrasiri RD | 3SLLI | Chavakachcheri | 5-Dec-2000 |
| 2468 | S/132729 | L/Cpl | Chintana AKN | 3SLLI | Chavakachcheri | 5-Dec-2000 |
| 2469 | S/310455 | L/Cpl | Daminda Sugath P | 3SLLI | Chavakachcheri | 5-Dec-2000 |
| 2470 | S/132756 | Cpl | Jayamanna SS | 3SLLI | Chavakachcheri | 5-Dec-2000 |
| 2471 | S/307631 | L/Cpl | Jayasundara JMCS | 3SLLI | Chavakachcheri | 5-Dec-2000 |
| 2472 | S/21D00122 | L/Cpl | Susantha Jayasooriya GV | 3SLLI | Chavakachcheri | 5-Dec-2000 |
| 2473 | S/301015 | S/Sgt | Wijesundara DD,(RSP) | 3SLLI | Chavakachcheri | 5-Dec-2000 |
| 2474 | S/285514 | L/Cpl | Kumara GNP | 3 SLLI | Chavakachcheri | 14-Dec-2000 |
| 2475 | S/306937 | L/Cpl | Gunaratna Banda AM | 4 SLLI | Nunawil | 16-Dec-2000 |
| 2476 | O/63790 | Major | KSN De Silva, RSP | 4 SLLI | Nunavil | 16-Dec-2000 |

තව කොටසක් ලබන කලාපයේ

# පාබල සුපිරි තරු





## සෙ/ 317039
## ලාකෝ හේමන්ත කුමාර එස්එල්

1 වන යාන්ත්‍රික පාබල බලඇණියට අයත් දැනට රෙජිමේන්තු පාලන කණ්ඩායමේ රාජකාරී කරනු ලබන ඉහත නම සඳහන් කොනොනි 2007.04.25 දින සිට 2007.08.15 දින දක්වා රෙම ශ්‍රීලංඉ වෙතින් පවත්වනු ලැබූ දමිළ භාෂා උපදේශක පාඨමාලාව හදාරා ඉන් ප්‍රථම ස්ථානය දිනාගෙන ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ නාමය මෙන්ම 1 යාපාබ නාමයද බබලවන්නට සමත්වි ඇති අතර, ඔහු වෙනුවෙන් රෙජි පාලන කණ්ඩායම ශ්‍රීලපාහ විසින් මෙසේ පැසසුම් කර සිටින්නෙමු.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළුආරච්චියාගම පදිංචි ඩීටී තිලකවර්ධන හා ජේඩී අජන්තා යන දෙමාපියන්හට දාව 1979.08.13 වන දින ජගත් දේවගේ හේමන්ත කුමාර ලෙස ජනිත වී මොහු මූලික අධ්‍යාපනය අනු/පලාගම මධ්‍ය මහා විද්‍යාලයෙන් අපොස (සා/පෙළ) දක්වා හදාරා සිටියදී වර්ෂ 1997 ක් වූ ඔක්තෝබර් මස 04 වැනි දින ශ්‍රීලංකා යුධ හමුදාවට බැදී ආධුනික පුහුණු පාඨමාලාව සපුපා අම්පාර වෙතින් සාර්ථකව නිම කර කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල වන කුඩාඔය වෙත ඇතුලත් කර එම පුහුණු පාසල වෙතින් කමාන්ඩෝ උසස් පෙළ පාඨමාලාව දක්වා සාර්ථකව හැදෑරීමෙන් පසු 1999.08.13 වන දින 2 කමාන්ඩෝ රෙජිමේන්තුව වෙත ඇතුලත් කරන ලදි. එතැන් සිට වසර 5 ක් කාලයක් 2 කමාන්ඩෝ රෙජිමේන්තුවේ ඩී කණ්ඩායම සමඟ රාජකාරී කරමින් සිටියදී 2002.01.17 වන දින තම මව් ඒකකය වන 3 ශ්‍රීලපාහ වෙත ඇතුලත් කරන ලදි. 3 වන ශ්‍රීලපාහ ඒකකය සමග රාජකාරී කරමින් සිටියදී 1 විශේෂ බලකාය වාසවිලාන් වෙතින් පවත්වනු ලැබූ විශේෂ ක්‍රියාන්විත ඛණ්ඩ පාඨමාලාවෙන් විශිෂ්ඨ සාමාර්ථයක් ලබාගත් අතර, 2006.12.25 දින සිට 2007.03.25 දින දක්වා ශ්‍රීලයුසේබ පාසැල වෙතින් (තිසාවැව) පවත්වනු ලැබූ ලිපිකරු පාඨමාලාව අංක 67 හදාරා එයින් "බී" සාමාර්ථයක් ලබා ගන්නා ලදි. එම ජයග්‍රහණය ත්‍රිත්වය තුල ශ්‍රීලපාහ රෙජිමේන්තුවට හා 1 යාන්ත්‍රික පාබල බලඇණියට ලබා දී ඇති ගෞරවය හා කීර්තිය ඔහු හා එක්ව රාජකාරී කරනු ලබන ශ්‍රීලපාහ සෙසු සාමාජිකයන්ටද මහත් අභිමානයකි. මෙවැනි දක්ෂතාවයන් ගෙන් පරිපූර්ණ ඔහු සැබෑ දක්ෂයෙක් මෙන්ම රෙජිමේන්තු පාලන කණ්ඩායම් කාර්යාලයේ දක්ෂ ලිපිකරුවෙකු ලෙස ඉමහත් කැපවීමකින් හා මනා සංයමයකින් යුතුව සේවය කරන්නකු වේ. මොහුගේ යුධ හමුදා ඉදිරි ගමන සාර්ථක කර ගැනීමටත් තව තවත් ජයග්‍රහණ කරා ලඟාවීමටත් අවැසි ශක්තිය ධෛර්ය නිරතුරුව ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

**සෙ/306794 සාසෙ රංජිත් ජේඩබ්පී**
**රෙජි පාලන කණ්ඩායම ශ්‍රීලපාහ**

## සෙ/304399
## ලාකෝ සිරිනන්ද ඒජී

8 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් ඉහත නම සඳහන් කොනොනි 2006.09.25 දින සිට 2006.12.22 දින දක්වා වෘත්තිය පුහුණු පාසල ශ්‍රීලයුපොදුසේබ වෙතින් පවත්වනු ලැබූ ලිපිකරු පාඨමාලාව හදාරා ඉන් දෙවන ස්ථානය දිනාගෙන ශ්‍රීලපාහ ඒකකයේ නාමයද බබල වන්නට සමත් වි ඇති අතර, ඔහු වෙනුවෙන් ඒකකය විසින් මෙසේ පැසසුම් කර සිටින්නෙමු. ගාල්ල දිස්ත්‍රික්කයේ අංක 74/ඒ අමුකොටුව, ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ "සිරි සෙවන " පිටිදිගන වත්ත, පිලාන, අගුළුගහ,ගාල්ල ලිපිනයේ පදිංචි ඒපී ධර්මදාස සහ පීපී යසවතී යන දෙමව්පියන්ට දාව 1973.12.12 දින උපත ලද මොහු ගා/දොම්පේ මහ විද්‍යාලයෙන් අපොස (සා/පෙළ) දක්වා සිප්සතර හදාරා ඇති අතර, 1992 අගෝස්තු මස 27 වන දින ශ්‍රී ලංකා යුධ හමුදාවට බැදී මූලික පුහුණුව පාඨමාලා අංක 01 ආලම්පිල් මුලතිව් හීදි ඉතා සාර්ථකව හදාරා 3 ශ්‍රීලපාහ ඒකකය වෙත ඇතුලත් කරන ලදි. පසුව 2004.03.25 දින 8 ශ්‍රීලපාහ ඒකකය නගා සිටුවීම සඳහා එක්ව "ඩී" කණ්ඩායමේ විනය ශාලා ලිපිකරු වශයෙන් කණ්ඩායමට ඉතා විශාල මෙහෙවරක් ඉටුකරනු ලබයි. තත් කොනොනි 2006.09.25 දින සිට 2006.12.22 දින දක්වා වෘත්තීය පුපා ශ්‍රීලයුපොදුසේබ වෙතින් පවත්වනු ලැබූ ලිපිකරු පාඨමාලාව ඉතා සාර්ථකව හදාරා යුධ හමුදා සියලු ඒකකය නියෝජනය කරමින් සිසුන් 54 දෙනෙකු අභිභවා ඔහුගේ හැකියාවන් දක්ෂතාවයන් පෙන්නුම් කරමින් පාඨමාලාවේ දෙවන ස්ථානය දිනාගෙන ඇත. මොහු වැනි කොනොනින් ඒකකයට පමණක් නොව ශ්‍රීලපාහ රෙජිමේන්තුවට ගෞරවයක් වන අතර ඔහු ලද ජයග්‍රහණ පුද්ගලික මෙන්ම ශ්‍රීලපාහ රෙජිමේන්තුවද කීර්තියට පත් කරවන එකකි. මෙම ජයග්‍රහණ ශ්‍රීලපාහ රෙජිමේන්තුව මෙන්ම 8 ශ්‍රීලපාහ ඒකකයද සමස්ත යුධ හමුදාව තුළ ලබාගෙන ඇති ගෞරවය හා ආඩම්බරය තවදුරටත් ඔපමට්ටම් කරන අතර පුද්ගලිකවම ඔහුගේ අභිමාණයටද හේතුවකි. මොහු හට පවරණ සෑම රාජකාරියක්ම ඉතා කැපවීමෙන් හා උනන්දුවෙන් ඉටු කරන විනය ගරුක සෙබළෙකි. 8 ශ්‍රීලපාහ නාමය රඳවා පැමිණි ඔබ හට යුධ හමුදා ඉදිරි ගමන සෑම ලෙසම සාර්ථක කර ගැනීමටත් තව තවත් ජයග්‍රහණ කරා ලගා වීමටත් අවැසි ශක්තිය ධෛර්ය නිරතුරුවම ලැබේවායි ප්‍රාර්ථනය කරන්නෙමු.

**මූලස්ථානය 8 ශ්‍රීලපාහ**



# දුම් වැටි භාවිතයෙන් අත්මිදෙමු



දුම්කොළ ඉරීමේ වඩාත් ප්‍රචලිත, පහසුතම සහ වඩාත් පොදු මාධ්‍ය වන්නේ සිගරැට් භාවිතයයි. දුම්වැටි ලෙස තවත් විවිධාකාර දෑ සමාජයට එකතු වී ඇත. ඒවා සිගරැට්, සුරුට්ටු, පයිප්ප, බීඩි නම් වේ. මීට අමතරව දකුණු ආසියානු කලාපයේ විශේෂයෙන්ම පකිස්ථානය, ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, ඉන්දියාව සහ මැද පෙරදිග හූකා නම් දුම්පානයට ඉතා ජනප්‍රියයි. හූකා යනු දැගරයක ආධාරයෙන් ජලය ඔස්සේ දුම් උරා බීමයි. මේවා අන් ද්‍රව්‍යයන් වලට වඩා සෞඛ්‍යාරක්ෂිත බවට මිත්‍යා මතයක් ද ඔවුන් අතරේ පැතිර ඇත. දුම්වැටි පාවිච්චියේ ආරම්භය ගැන සොයා බලද්දී එය උතුරු සහ දකුණු ඇමෙරිකානු රටවල පාවිච්චියට ගෙන ඇති බවත්, පසුව යුරෝපීය-යන් විසින් ඇමරිකන් මහද්වීපයේ ගවේෂණ කටයුතු වලදී, වෙළඳ කටයුතු වලදී, ලොව පුරා පැතිර ගොස් ඇති බවට අනාවරණය වී ඇත. එමෙන්ම 1වන සහ 11 වන ලෝක යුද්ධ සමයේ සටන් වැද සිටි සෙබළුන් අතර දුම්වැටි භාවිතය ඉතා ඉහළ මට්ටමක තිබූ බවට සාධක ඇත. එමෙන්ම එම සෙබළුන්ගේ ආහාර වට්ටෝරු වල අංගයක් ලෙසට සහ විවිධ පරිත්‍යාගශීලී ආයතන මගින් සිදුකෙරුණු පරිත්‍යාග වලටද සිගරැට් ලබා දී තිබුණි.

විවිධ අසහනකාරී තත්ත්වයන්ගෙන් මිදීමට, පාළුව කාන්සිය මග හරවා ගැනීමට, සමාජශීලී වීමට, හිත මිතුරන්ගෙන් ලැබෙන බලපෑම මත දුම් පානයට හුරුවේ. මනසේ ඇතිවන ව්‍යාකූල තත්ත්වයන්ගෙන් පලා යාමට මෙන්ම හුදු විනෝදය සඳහා ද පුද්ගලයින් දුම්පානයට හුරුවේ. දුම්පානය සඳහා පෙළඹීමට මුල්වන කාලය වයස අවුරුදු 12- 15 දක්වා අතර වකවානුව බව සමීක්ෂණ වලින් සනාථ වී ඇත. මීට අමතරව තම දෙමාපියන්ගේ හෝ භාරකරුවන්ගේ දුම්වැටි පානයට ඇබ්බැහි වී ඇත්නම් ඔවුන්ගේ දරුවන්ද දුම් පානයට හුරු වීමට ඇති ඉඩ කඩ බොහෝය. ඔබ දුම්පානය කරන්නෙක් නම් මේ තත්වයන්ගෙන් කාණ්ඩයකට ඔබද අයිති වනු ඇත. මීට අමතරව චිත්‍රපටි, රූපවාහිනී, නාට්‍ය වැඩ සටහන් සහ සිගරැට් ජාවාරම් කරුවන්ගේ ඉතා සියුම් උපක්‍රම වන ක්‍රීඩා තරග සංවිධානය තුලින් දුම්වැටි සඳහා ලබා දෙනු ලබන සිත් ගන්නා සුළු ප්‍රචාර ද බලපා ඇත.

සිගරැට් පයිප්ප සුරුට්ටු වැනි ක්‍රමවලින් හැඳින්වෙන දුම්වැටි වල සරලම සංසිද්ධිය වන්නේ දුම්කොළ පිළිස්සීමෙන් නික්මෙන දුම් ආග්‍රහණය කිරීම නැතහොත් උරා බීමයි. දුම්කොළ දැවීමේදී නිකොටින් නම් ද්‍රව්‍ය සෑදේ. නිකොටීන් උත්තේජනයක් ලෙස ක්‍රියා කරන අතර දුම්වැටි වලට හුරු වුවත් ඒවා පාවිච්චියෙන් ලැබෙන අතුරුඵල පිළිබඳව අවබෝධයක් තිබුනද නිකොටින් උත්තේජනය හේතුවෙන් ඇබ්බැහිවීම පිටු දැකීමට ක්‍රියා නොකරයි.


දුම්පානය නිසා අනේක විධ රෝගාබාධ වලට ලක්වේ. හෘද සහ පෙනහළු ආශ්‍රිත පිළිකා තත්ත්වයන්, රුධිර සංසරණය ක්‍රියාවලියේ ඇතිවන අපහසුතා, ස්වනාලයේ ඇතිවන පිළිකා, ස්වසන පද්ධතියේ ඇතිවන ආබාධ, මුඛයේ මෙන්ම ගැබ් ගෙල මෙන්ම පියයුරු පිළිකා, ඇදුම, හතිය, රුධිරයේ කොලොස්ටරෝල් වැඩිවීම, ආදී රෝගාබාධ ඉන් සමරහකි. දුම්වල ඇති කාබන්මොනොක්සයිඩ් වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් රුධිර නාලිකා වල ඇති ඔක්සිජන් ප්‍රතිශතය අවම කිරීම හෘද රෝග තත්ත්වයන් ඇතිවීමට මුල් වේ. මීට අමතරව ලිංගික අප්‍රාණිකත්වය ප්‍රධාන තැනක් ගනී. රුධිරයේ ක්ලොස්ටරෝල් ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් රුධිරවාහිනී හීන්වී ශිෂ්නය තුලට රුධිර ප්‍රවාහනය අවම කරවයි. එමෙන්ම නිකොටින් මොළය මත ඇති කරන බලපෑම නිසා ශිෂ්නයේ පටක සංකෝචනය වන අතර එයින් ශිෂ්නයට පිරිසුදු රුධිය ගලා ඒම වළකාලයි. මෙම ක්‍රියාවලිය මගින් ශිෂ්නය අප්‍රාණික වේ. ඉන් අදහස් කෙරෙනුයේ ශිෂ්නය ප්‍රාණවත් නොවීම හෝ ප්‍රාණවත් බවින් පවත්වා ගෙන යාමට නොහැකි වීමයි. තරුණ වයසේ සිටින බ්‍රිතාන්‍ය ජාතිකයින් 120,000 දුම්බීමේ සෘජු බලපෑමේ හේතුවෙන් ලිංගික අප්‍රාණිකත්වයෙන් පෙළෙන බවට බ්‍රිතාන්‍ය වෛද්‍ය සංගමය ප්‍රකාශයන් නිකුත් කර ඇත. තරුණ ඔබ ලිංගිකව දුබල වන බව නොතේරුනද දුම් පානය කරන තුරු මෙම තත්ත්වය වර්ධනය වෙමින් පවතී. හෘද රුධිර නාල වලට වඩා ශිෂ්නයේ රුධිර නාල 1/3 ප්‍රමාණයකින් කුඩාවට පිහිටා ඇත. එහෙයින් දුම්පානය කරන්නන් හෘද රෝග හෝ අංශභාගය වැළඳීමට පෙරාතුව ලිංගික අප්‍රාණිකත්වය ඇතිවීම පුදුම සහගත නොවේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධිත ලෝක සෞඛ්‍ය සංවිධානය (WORLD HEALTH ORGANISATION - W H O) විසින් 2005 පෙබරවාරි මස 28 වන දින දුම්වැටි පානය අවම කිරීම වෙනුවෙන් ප්‍රඥප්තියක් හඳුන්වා දී ඇත.එය (W H O FRAMEWORK CONVENTIONON TOBACO CONTROL (FCTC) නමින් හැඳින්වේ. මෙමගින් දුම්වැටි භාවිතය අවම කිරීමට පියවර රාශියක් ගෙන ඇති අතර මෙමගින් ලෝකය පුරා බිලියන 4 ක පමණ ජනතාවට රැකවරණය ලැබෙන බවට ලෝක සෞඛ්‍ය සංවිධානය විශ්වාසය පළ කරයි. මේ සම්මුතිය සඳහා රටවල් 168 ක් ප්‍රසාදය පළ කරමින් සිය අත්සන යොදා ඇත. මෙමගින් පොදු ස්ථානවල පොදු ප්‍රවාහන මාධ්‍යයන් තුල කාර්යාල සහ ආයතනයන්හි දුම්බීම තහනම් කර ඇත. ශ්‍රී ලංකාවේද දැන් මෙම නීති ක්‍රියාත්මක වේ.

දුම්බීම නිසා ඔබට ඇතිවන සෞඛ්‍ය තර්ජනවලට වඩා අනිසි ප්‍රථිපල රටේ සමස්ථ පොදු ජනතාවටම අත්විඳීමට සිදුවේ. දුම්බීම නිසා විවිධ රෝගයන්ට ගොදුරු වන අයවළුන් ජීවත් කරවීමට අවශ්‍ය වෛද්‍ය පහසුකම් වෙනුවෙන් පිරිවැය දරන්නේ කවුරුන්ද? එහෙයින් දුම්වැටි භාවිතය අවම කිරීමට අත්හැරීමට කාලය පැමිණ ඇත.

**හෙට සිට නොව අද සිටම දුම්පානයෙන් අත්මිදෙමු.**

**කපිතන් (උපා) ආර් බද්දේවිතාරණ යූඑස්පී ශ්‍රීලපාහ**
**231 බසේමූ**



## ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය

බහු වාර්ගික රටක් වූ අප රටට නිදහස ලැබීමෙන් පසුව ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ගේ උරුමය විහිදා දැක්වෙන අයුරින් ජාතික ධජයක් නිර්මාණය විය යුතුයැයි අදහස් කල හෙයින් එය සැලසුම් කරනු සඳහා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ සභාපතීත්වයෙන් යුත් කමිටුවක් පත් කෙරුණි. කමිටුවේ අනිකුත් සාමාජිකයන් වූයේ ශ්‍රීමත් ජෝන් කොතලාවල, ජේ.ආර්.ජයවර්ධන, ටී.බී.ජයා, ශ්‍රීමත් ලලිත් රාජපක්ෂ සහ ජී.ජී. පොන්නම්බලම් යන මහත්වරුන්ය. මෙම කමිටුව විසින් යෝජනා කරන ලද ජාතික ධජයට 1951 මාර්තු 02 වන දා මහජන මන්ත්‍රී මණ්ඩලයේ අනුමැතිය ලැබිණි. දැන් භාවිතා කෙරෙන්නේ එම ජාතික ධජයයි.

කහ පැහැති තීරුවකින් වටවූ රතු පසුබිමක දකුණතින් කඩුවක් ගත් රන්වන් පාට සිංහයෙක් දැක්වේ කොන් සතරේ රන්වන් බෝපත් හතරකි. ධජයේ වම්පස තැඹිලි හා කොළ පාට තීරු දෙකකි.

රතුපාට පසුබිම ශ්‍රී ලාංකිකයින්ගේ ජීවය සංකේතවත් කරයි. දකුණින් කඩුව ලත් සිංහයා එඩිතර ජාතියක් මූර්තිමත් කරයි. එය වටා ඇති කහ පැහැති තීරුවෙන් ප්‍රඥාවත්, කොන් සතරේ ඇති බෝපත් වලින් සතර බ්‍රහ්ම විහරණය (මෙත්තා,මුදිතා,කරුණා, උපේක්ෂා) අදහස් වෙයි. ධජයේ වම් පස තැඹිලිපාට තීරුවෙන් දමිළ ජනතාවත්, කොළපාට තීරුවෙන් අනෙකුත් සුළු ජාතීනුත් නිරූපණය කෙරේ. අපේ ජාතික කොඩිය අපේ අභිමානයයි. එයට ගරු කිරීම අපේ යුතුකම වෙයි.



## ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලංඡනය

1972 මැයි 22 දා ජනරජයක් වූ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය රතු පසුබිමක වූ සිංහ රූපය මධ්‍යය කොට ගෙන සකස් වී ඇත. ඒ වටා පලා පෙති ආකාරයෙන් නිමවූ නෙළුම් මලෙකි. නෙළුම් මල පාරිශුද්ධත්වයේ සංකේතයයි. එය රැඳී ඇත්තේ සෞභාග්‍ය මූර්තිමත් කෙරෙන පුන් කලසක් මතය. පුන් කලසින් පිටවන වී කරල් දෙකක් සිංහ රුව වටකරමින් ඉහළට විහිදේ. පුන් කළස දෙපස ඇති ඉර හඳින් ජාතියේ සදාකාලිත්වයත්, වී කරලින් සශ්‍රීකත්වය ත් දැක්වේ ලාංඡනය මුදුනේ ධර්ම චක්‍රය දිස්වේ. ලාංඡනය වර්ණවත් කරනු සඳහා ජාතික ධජයේ වර්ණ උපයෝගී කොට ඇති අතර, එයට අමතරව නිල්වන් දාරයක් යොදා ඇත.

1972 මැයි මස 23 වන දා නිකුත් කෙරුණු ගැසට් නිවේදනයක් මගින් රාජ්‍ය ලාංඡනය නිල වශයෙන් පිළිගන්නා ලදි. එය භාවිතා කළ හැක්කේ රාජ්‍ය නිල කටයුතු සඳහා පමණෙකි. පෞද්ගලික ලිපි කටයුතු සඳහා රාජ්‍ය ලාංඡනය යොදා ගැනීම සපුරා තහනම් වේ.

**උපුටා ගැනීම පොත පත ඇසුරෙනි.......**

## මෝහිනී වන ගත විය.

දෙමංසලේ නුගරුක් ළග අසල කැලේ
දිය ඇලි අසල ගල් පාමුල ගලන ඇලේ
පිරිමින් වසඟ කරවන පා නිතර බලේ
මෝහිණි සොයා බීඳලම් ඇගේ බලය දැලේ

මේ ගැන විපරමින් ඇය සොයමින් නිතර
මම වෙහෙසෙන්න වී ගෙවුනා අඩ වසර
මෙතුවක් ඇය සොය සොයා සිතමින් මම නිතර
සමහර රෝහිණිලා ලග වූයෙමි නතර

දෑතේ නොදරුවන් නැති මුත් අඳුරු තැන
සිටි මෝහිණියො අත වනමින් සිනා සුන
විමසන විටදී මට කොඳුරා මුදල් ගැන
මග හැර ගියෙමි උන් මෝහිණි නොවුන තැන

ලොව හැම කියන මේ ලස්සන යෞවනිය
හමුවන තුරා මට නිමි හිමි නැති උනිය
අවසානයේ මගෙ මන දොල සපිරුණිය
නිසල තැනක මට හමු වුනි මෝහිණිය

සුදු වත කමල සඳ එළියේ පෙනින මට
ඇගෙ නෙත් පරදවයි නිල්වන් මැණික් කැට
අසරණ බවක් එනමුත් ඒ මුහුණ යට
අනේ අපොයි ඇගෙ දෙනෙතේ කඳුළු කැට

ලෙන්ගතු බවක් හද පතුලෙන් දැනුන නියා
නොහඬා ඉන්න මගෙ සුදු රත්තරන් කියා
විමසා සිටියෙ අතගා හිස ඇයිද කියා
ඇය කියූ දෙයින් මට සිහි සන් නැතිව ගියා

බැලූ බැලූ තැන්වල සතර අත
මගෙ නම ගත්ත අගනුන්ගෙන් පිරී ඇත
සරතයි අද දවස අද මට වැඩක් නැත
කැළඹව වදිමි ඇය පෙන්වයි කඳුළු නෙත

[illegible] - ලාංකෝ ආනන්ද බිච් - 7 ශ්‍රීලපාහ

## Change your course now

*This is the transcript of an actual radio conversation of a US naval ship with Canadian authorities off the coast of Newfoundland in October, 1995.*

*Radio conversation released by the Chief of Naval Operations on November 10, 1995.*

*Americans: Please divert your course 15 degrees to the North to avoid a collision.*

*Canadians: Recommend you divert YOUR course 15 degrees to the South to avoid a collision.*

*Americans: This is the Captain of a US Navy ship. I say again, divert YOUR course.*

*Canadians: No, I say again, you divert YOUR course.*

*Americans: THIS IS THE AIRCRAFT CARRIER USS LINCOLN, THE SECOND LARGEST SHIP IN THE UNITED STATES' ATLANTIC FLEET. WE ARE ACCOMPANIED BY THREE DESTROYERS, THREE CRUISERS, AND NUMBER OF SUPPORT VESSELS. I DEMAND THAT YOU CHANGE YOUR COURSE 15 DEGREES NORTH, THAT IS ONE FIVE DEGREES NORTH, OR COUNTER-MEASURES WILL BE UNDERTAKEN TO ENSURE THE SAFETY OF THIS SHIP.*

*Canadians: This is a lighthouse. You call.*

........ by internet

# තෙවැනි වසර සැමරූ ශ්‍රීලපාහ ජනාධිපති ආරක්ෂක කණ්ඩායම

**2004.04.19** දින එනම් අදින් තෙවසරකට ඉහතදී අරලියගහ මන්දිරයට පැමිණ එවකට රටේ දෙවැනි පුරවැසියා වූ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන් සහ එම පවුලේ අයවලුන්ට මෙන්ම නිල නිවසෙහි ද ආරක්ෂක කටයුතු සැපයූ ශ්‍රිලපාහ ආරක්ෂක කණ්ඩායම ගරු අග්‍රාමාත්‍යතුමන් අතිගරු ජනාධිපති ලෙස පත්වීමෙන් අනතුරුවද පෙර පරිදිම ඉතා ගාම්භිරව එම රාජකාරී මැනවින් ඉටු කරමින් තෙවන වසර සපුරා සිව්වන වසරට පා නගා ඇත. තෙවසරක් සම්පූර්ණ කර සිව්වැනි වසරට පා නගා ඇති ශ්‍රිලපාහ ජනාධිපති ආරක්ෂක කණ්ඩායම 2004.04.19 දින රාජකාරී භාරගැනීමෙන් පසුව ගතවූ දෙවසරෙහි ලබා ඇති ප්‍රගතියත් සිදුවූ සුවිශේෂ සිදුවීම් පිළිබඳවත් 2005,2006 ජුලි කලාපවලින් ඔබ හමුවට ගෙනෙ එන ලදි. ඉන්පසු ඉකුත් වසරේ ශ්‍රිලපාහ ජනාධිපති ආරක්ෂක කණ්ඩායම ඉතා ශක්තිමත් කණ්ඩායමක් ලෙස ලත් ප්‍රගති සමාලෝචනය මේ අයුරින් ඔබ වෙත තබමු.

තෙවැනි වර්ෂය ආරම්භ වී ඉතා කෙටි කාලයකින් එනම් 2006.07.01 දින සිට 2006.07.30 දින දක්වා පුරා මාසයක් ඉන්දියාවේ ''එන්එස්ජී මනේසාර්'' පුහුණු පාසලේ පැවති ප්‍රභූ ආරක්ෂක පාඨමාලාව හැදෑරීම සඳහා දෙවැනි කණ්ඩායම ලෙස ජනාධිපති ආරක්ෂක ඒකකයේ මාණ්ඩලික නිලධාරි ලුතිනන් කර්නල් එච්ඩීජී රණසිංහ ශ්‍රිලපාහ ඇතුළු යුධ හමුදා භට පිරිස සමග මෙම කණ්ඩායමේ ද නිලධාරීන් තිදෙනකු සහ සෙසු නිලයින් 59 දෙනෙකු සහභාගී වූ අතර, සාර්ථකව එම පාඨමාලාව නිමකල ඔවුන් 2006.07.30 දින නැවතත් ලංකාවට පැමිණෙන ලදි.

මේ අතර මෙම කණ්ඩායමේ පුරා වසර දෙකකට අධික කාලයක් 2 වන නිලධාරි අණදෙන ලෙස කටයුතු කළ මේජර් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ශ්‍රිලපාහ ජනාධිපති ආරක්ෂක ඒකකයේ ජී කණ්ඩායමේ නිලධාරි අණදෙන ලෙස පත්වීම් ලැබීම හේතුවෙන් පුරප්පාඩු වූ මෙම කණ්ඩායම් 2 නිලධාරි අණදෙන තනතුර 2006.08.19 දින සිට කපිතන් එච්කේජේයූ ජයරත්න ශ්‍රිලපාහ විසින් භාරගන්නා ලදි.


2007 වසරේ සිංහල හින්දු අවුරුද්ද නිමිත්තෙන් ජනාධිපති ලේකම් කාර්යාලය මගින් සංවිධානය කළ බක්මහ උළෙල 2007.04.07 දින යුධ හමුදා ක්‍රීඩාංගනයේදී පවත්වන ලදි. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් සහභාගී වූ අතර තරඟ ජයග්‍රාහකයින් කීපදෙනෙකුට ත්‍යාග හා අලුත් අවුරුදු සුභාෂිංසන අතිගරු ජනාධිපති තුමන් අතින් පිරිනැමීම එහිදී සිදුවූ සුවිශේෂ සිදුවීමකි.


ගාමිණී මාතා වැඩිහිටි නිවාසයේ පැවති ධර්මදේශණයට සවන් දෙන මෙම කණ්ඩායම් සෙනින් හා එම නිවාසයේ වැඩිහිටි පිරිසක්

වර්ෂයක් පාසා මෙම කණ්ඩායම මගින් සිදුකරනු ලබන සිංහල හින්දු අලුත් අවුරුදු චාරිත්‍ර 2007 වර්ෂයේ ද ඒ අයුරින්ම ඉටු කල අතර ඒ අනුව චාරිත්‍රානුකූලව ලිපගිනි මෙළවීම, වැඩ ඇල්ලීම හා ආහාර අනුභවය සුභ මොහොතින් සිදු කෙරුණු අතර එයට මෙම කණ්ඩායමේ සියලුම නිලධාරීන් හා සෙසුනිලයින් ද ජනාධිපති ආරක්ෂක අංශයේ පොලිස් නිලධාරීන්ද අරලියගහ මන්දිරයේ ආරක්ෂක රාජකාරී වල නියුතු ගුවන් හමුදා භට පිරිස් ද සහභාගී වන ලදි. එමෙන්ම පොල්වත්ත රාජකීය පන්සල මගින් වාර්ෂිකව පැවැත්වීමට යෙදුණු හිසතෙල් ගෑමේ මංගල්‍ය සඳහා නිලධාරීන් හා සෙසුනිලයන් සහභාගීවීමද විශේෂත්වයකි.

2004.12.26 දින ඇතිවූ සුනාමි ව්‍යසනයෙන් අපගෙන් සදහටම සමුගත් සෙ/302791 කෝප්‍රල් අපිත්රත්න ඩබ්ඩබ් එවකට මෙම කණ්ඩායමේ සිටි ජ්‍යෙෂ්ඨතම කෝප්‍රල් වරයා වූ අතර ඔහු ජීවිතක්ෂයට පත්වී දෙවසරකට අධික කාලයක් ගතවීමත් 2007.04.19 දින මෙම කණ්ඩායමට තෙවසරක් සපිරීම නිමිත්තෙනුත් කොළඹ හුණු පිටියේ ගාමිණී මාතා වැඩිහිටි නිවාසයට ස්වාමීන් වහන්සේ නමක් වැඩම කරවා ධර්ම දේශනයක් පැවැත්වීමෙන් අනතුරුව නේවාසික වැඩිහිටියන් හට රාත්‍රී දානයද පිරිනමන ලදි. මීට ඉහත මෙම කාර්‍ය ඉතාමත් චාම් අන්දමින් සිදු කළත් මෙවර ජනාධිපති ආරක්ෂක ඒකක ප්‍රධානි බ්‍රිගේඩියර් කේජේ අල්විස් ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ගේ මග පෙන්වීම මත අප්‍රේල් 19 දිනය ජනාධිපති ආරක්ෂක ඒකකයේ සංවත්සර දිනය ලෙස සලකා, මෙම කණ්ඩායම වෙතින් මෙතෙක් පිළිගැන්වූ දානය ඒකකයේ සියළුම අයවලුන්ගේ සහභාගීත්වයෙන් පිරිනැමීමට කටයුතු යොදන ලදි.මේ අනුව ගාමිණී මාතා වැඩිහිටි නිවාසයේ නේවාසිකයින් හට උදේ, දහවල් හා රාත්‍රී දානය ජනාධිපති ආරක්ෂක ඒකකය වෙතින් පිරිනැමුණු අතර ස්වාමීන් වහන්සේ නමක් වැඩම කරවා ධර්ම දේශණයක් පවත්වා ජනාධිපති ආරක්ෂක ඒකකය සමඟ රාජකාරී කරමින් සිටියදී ජීවිතක්ෂයට පත්වූ සියළුම අයවලුන්ට පිං පැමිණවීම සිදු කරන ලදි. එමෙන්ම මෙවරද මෙම අවස්ථාවට අප අතරින් වියෝ වූ කෝප්‍රල් අපිත්රත්නගේ බිරිඳ දරුවා හා මව ඇතුළු ඥාතීන් සමූහයක් සහභාගී විය. මෙහිදී ජනාධිපති ආරක්ෂක ඒකකයේ සියලුම නිලධාරීන් හා සෙසුනිලයන්ගේ ආධාර මත ධර්මාසනයක්, පිගන් 55ක්, අතුරුපස කෝප්ප 55ක්, සහ හැඳි, ඇඳ ඇතිරිලි 55ක්, ගාමිණී මාතා වැඩිහිටි නිවාසයට පරිත්‍යාග කරන ලදි.

තුන් වැනි වසර සම්පූර්ණ කර සිව්වැනි වසරටත් පා තබා ඇති මේ මොහොතේ මෙම කණ්ඩායම ස්ථාවර අඩිතාලමක සිට සිය රාජකාරිය මැනවින් ඉටු කරනු ලබයි. ඒ අතරට රාජකාරියට බාධාවක් නොවන අයුරින් සෙනින්ගේ යුධ හමුදා දැනුමත් සාමාන්‍ය දැනුමත් වර්ධනයට බදාදා දිනය පුහුණුවීම් සඳහා වෙන්කර ඇත. එමෙන්ම මේ වන විට මේ කණ්ඩායමේ සෙනින් 30 කට අධික ප්‍රමාණයක් රිය පැදවීමේ ප්‍රවීණතා සහතික ලබා ගෙන ඇත. තවද ඔවුන්ගේ සුභසාධනය විනෝදාස්වාදය හා දැනුම තවත් වර්ධනය කර ගැනීමේ අරමුණ



මෙම කණ්ඩායම් වෙසක් නිර්මාණය

ඇතිව 2007.04.19 දින සිට චන්ද්‍රිකා රූපවාහිනී (සැටලයිට් ටීවී) පහසුකම්ද සලසා ඇත. එපමණක් නොව සෑම පොහොය දිනකම ගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ පැවැත්වෙන පිංකම් මාලාවට කණ්ඩායමේ නිලධාරීන් හා සෙසුනිලයින්ගේ දායකත්වය හා සහභාගීත්වය නිරතුරුව නොමදව ලබාදීම සිදුවේ.


2007 වර්ෂයේ වෙසක් උළෙල නිමිත්තෙන් ජනාධිපති ලේකම් කාර්යාලය මගින් සංවිධානය කළ පහන් කූඩු ප්‍රදර්ශනය සඳහා මෙම කණ්ඩායම වෙතින්ද වෙසක් නිර්මාණයක් ඉදිරිපත් කරන ලද අතර අතිගරු ජනාධිපතිතුමා ඇතුළු අමාත්‍යවරුන් මෙන්ම විදේශ තානාපති පිරිසක් විසින් සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දල්වා මෙම කණ්ඩායම් නිර්මාණය මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කරන ලදී.



වෙඩි තැබීම් පුහුණුවීමේදී.....

අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් මත දැයේ දූ දරුවන් හට නොමිලයේ බෙදාදීම සඳහා ජනාධිපති ආරක්ෂක ඒකකය මගින් මුද්‍රණය කළ "**සිරිත් මල් දම**" නම් වූ අනර්ඝ ග්‍රන්ථය මුද්‍රණය කිරීමේ සිට බෙදා හැරීම දක්වා මෙම කණ්ඩායමේ දායකත්වය නොමසුරුව ලබාදුන් අතර පොල්වත්ත රාජකීය පන්සලේ පැවැත්වෙන දහම් පාසල වෙත අදාල පොත් බෙදාදීම 2007.06.25 දින කණ්ඩායමේ 2 නිලධාරී අණදෙන විසින් සිදු කරන ලදී.


මෙම අවස්ථාව වර්ණවත් කර ගැනීම සඳහා මඟ පෙන්වූ ජනාධිපති ආරක්ෂක ඒකකයේ සම්බන්ධීකරණ නිලධාරී බ්‍රිගේඩියර් කේජේ අල්විස් ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී මැතිතුමන්ටද 8 ශ්‍රිලපාහ ඒකකයේ අණදෙන නිලධාරී තුමන්ටද කණ්ඩායම් නිලධාරී අණදෙන මේජර් කේවීඩීආර් ධර්මප්‍රිය ශ්‍රිලපාහ ඇතුළු සියළු නිලධාරී/සෙසු නිලයන්ට ගෞරව ප්‍රණාම ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර ශ්‍රීලපාහ නාමය රැක ගනිමින් තව දුරටත් රාජකාරී කිරීමට මෙම කණ්ඩායමේ සියළු නිලයින්ට අවස්ථාව උදා වේවායි සුභ ප්‍රාර්ථනා කරමි.



ජනාධිපති ආරක්ෂක ඒකකය වෙතින් මුද්‍රණය කළ "සිරිත් මල්දම" නම් වූ කෘතිය පොල්වත්ත රාජකීය පන්සල වෙත ලබාදුන් අවස්ථාව.

**කපිතාන් එච්කේජේයූ ජයරත්න ශ්‍රිලපාහ**
ශ්‍රිලපාහ ආරක්ෂක කණ්ඩායම
අරලිය ගහ මන්දිරය.


# සුභ උපන්දිනයකට ආසිරි... "නෙත්මි සත්සරණි දුවට"



දහසක් දූ පුතුන් ලබනා පිය සෙනෙහේ
මගේ දුව මව් සෙනෙහේ පමණක් ලැබ සැනහේ
පළවෙනි උපන්දිනටත් මා නැත නිවසේ
නෙත්මි දුවට මා ආසිරි දෙයි මෙලෙසේ

එළඹෙන මාසේ අවුරුද්දේ අවසානේ
විසි අට වෙනිදා ඔක්තෝම්බර් සවස පැයේ
ආදරණිය මගෙ සුරතල් දියණියනේ
මතකද ඔබේ අවුරුද්දේ උපන්දිනේ

වවුනියාවෙ සිට කවි පද මම ගොතන
රණ විරු පියා කරනා සේවය නිතින
මගෙ සුදු දියණි නුඹ වෙයි මගෙ මිණිපහන
අම්මා වෙයි දුවගෙ ආලෝකය මවන



**සෙ/315437**
**සාසෙ ආරියරත්න,**
**වව්නියාව**



16 වන රෙජිමේන්තු සේනාවිධායක
ලෙස රාජකාරී ඉටුකල
බ්‍රිගේඩියර්
ඩීඒ අමුණුගම ආර්ඩබ්පී ආර්එස්පී



රෙජිමේන්තු මධ්‍යස්ථානය
ශ්‍රීලපාහ හි
17 වන සේනාවිධායක
කර්නල් ඩබ්ලිව් වීරක්කොඩි

# බ්‍රිගේඩියර් ඩීඒ අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී මැතිතුමණි......
## ස්තූතියි ඔබට.....

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු සේනාවිධායක ලෙසින් රාජකාරී කාලය තුලදී තම යටතේ සිටින අයවළුන්ගේ පාලන රාජකාරීන්ට අමතරව එදිනෙදා සුබසාධක කටයුතු වලට මෙන්ම රෙජිමේන්තුවේ අලංකාරය ඔප් නැංවීමට ඉතා විශාල මෙහෙයක් ඉටු කර යුධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන ආරක්‍ෂක සම්බන්ධීකරණ නිලධාරි ලෙසින් බ්‍රිගේඩියර් ඩීඒ අමුණුගම ආර්ඩබ්පී, ආර්එස්පී තුමන්ට උපහාරයක් ලෙසින් සිදුකරන ලද කාර්‍යයන් වලින් බිඳක් මෙසේ සටහන් තබන වගයි.

රෙජිමේන්තු මධ්‍යස්ථානය තුල වූ මාර්ග ප්‍රතිසංස්කරණය, කාණු පද්ධතිය නවීකරණය කිරීම, සෙසු නිල භෝජනාගාරය අළුත් වැඩියා කිරීම, කොනොනි සමාජ ශාලාවේ පිවිසුම් මාර්ග ය පිළිසකර කිරීම හා ඉදිරි තාප්පය සැකසීම, සිවිල් සේවක මහතුන්ගේ හට නිවාසය ඉදිකිරීම, නිලධාරි නිවස්නය සඳහා නව දෙමහල් ගොඩනැගිල්ල ආරම්භ කිරීමට කටයුතු කිරීම හා නිලධාරි නිවස්නය ඉතා අලංකාරවත් ලෙස නවීකරණය කිරීම සහ නිසි ලෙස නඩත්තු කරගෙන යාමට අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කිරීම හා 11 ශ්‍රීලපාහ නැවත ආරම්භ කිරීමට ඇවැසි සම්බන්ධිකරණ කටයුතු සිදුකිරීම කැපී පෙනෙන අවස්ථාවන් කිහිපයකි.

මෙවන් විශාල මෙහෙවරක් රෙජිමේන්තු මධ්‍යස්ථානය තුල සිදුකිරීමටත්, මාර්ගෝපදේශකත්වය ලබාදීම පිළිබඳව ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපතිතුමන් ඇතුළු සියළුම නිලයින්ගේ ගෞරවනීය ආචාරය මෙසේ පුදකර සිටින අතර ශ්‍රී ලංකා පාබල හමුදාවට පමණක් නොව මුළු සමස්ත යුධ හමුදාවටම මෙවැනිම කාර්‍යභාරයක් කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්‍ය නොඅඩුව ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමු.

**රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ**

# 17 වන රෙජිමේන්තු සේනාවිධායක ශ්‍රීලපාහ
## කර්නල් ඩබ්ලිව් වීරක්කොඩි

1985 මාර්තු 21 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අධිකාරියට පිවිස 1 ශ්‍රී ලපාහ ඒකකයේ බණ්ඩ භාර නිලධාරියෙකු ලෙස තම උපන් මව් බිමට සේවය කිරීම සඳහා පළමු පියවර තබන ලදී. රෙජිමේන්තු සංකල්පයේ ව්‍යාප්තියත් සමඟ බිහිවූ 4 ශ්‍රීලපාහ, 8 ශ්‍රීලපාහ ඒකක වල විවිධ තනතුරු හොබවමින් තම යුතුකම් මනාව ඉටු කරන ලදී.

බළඇණි අණදෙන නිලධාරියෙකු වශයෙන් 7 වන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදාවේ කාර්‍ය නියුක්ත අණදෙන නිලධාරි වශයෙන් 1997 අප්‍රේල් 05 වන දින රාජකාරී භාර ගැනීමෙන් අනතුරුව 2000 ජූනි මස 15 දක්වාම කිලිනොච්චි, පරන්තන් සහ අලිමංකඩ ප්‍රදේශයේ 54 වන සේනාංකය යටතේ ස්ථාපිතව තිබූ සියලුම බළසේනා යටතේ ක්‍රියාත්මක වූ ත්‍රස්තවාදීන්ට එරෙහිව ක්‍රියාත්මක කල ක්‍රියාන්විතයන්හීදි තම බළඇණියට මනා නායකත්වයක් දෙමින් බළඇණිය සාර්ථක ලෙස මෙහෙයවන ලදී.

තම රණකාමිත්වය හා යුධ හමුදා දැනුමේ පරිණතභාවය උපයෝගීකර ගැනීම සඳහා යුධ හමුදා මූලස්ථානය වෙතින් ලබා දෙන දේශිය හා විදේශිය පාඨමාලා රාශියක් හදාරන ලද අතර, ඇමෙරිකා එක්සත් ජනපදයේ සහ එක්සත් රාජධානියේ පැවැත්වූ සාමසාධක වැඩමුළු සහ අභ්‍යාසයන් කිහිපයකදී තම මව් රට නියෝජනය කර ඇත.

තම හමුදා ජීවිත කාලය තුලදී කරන ලද ක්‍රියාන්විත රාජකාරීන්ට අමතරව ශ්‍රීලංකා යුධ හමුදා විද්‍යාපීඨයේ උපදේශක නිලධාරියෙකු වශයෙන් ද කටයුතු කර ඇති මෙම නිලධාරි මාණ්ඩලික නිලධාරියෙකු වශයෙන් 11 සේමු, 55 සේමු, ආසේමු, (යා), ආසේමු (නැ), සහ යුහමු හි විවිධ මට්ටමේ මාණ්ඩලික නිලධාරි තනතුරු වල යෙදෙමින් යුධ හමුදාව තුලින් ලද දැනුම ඉතා අර්ථවත් අයුරින් යුධ හමුදාව වෙත ලබා දීමට සමත් වී ඇත.

රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ හි 17 වන රෙජිමේන්තු සේනාවිධායක වශයෙන් 2007.08.10 දින රාජකාරි භාරගත් මොහු හට ශ්‍රීලපාහ රෙජිමේන්තුව වෙතින් එහි සියලු සාමාජිකයන් අපේක්‍ෂා කරන සේවය මැනවින් ඉටු කිරීමට අවැසි ධෛර්ය සහ ශක්තිය ලැබේවායි රෙජිමේන්තු අධිපති ඇතුළු සියළුම නිලයන් විසින් මෙසේ සුභ ප්‍රාර්ථනා කරමු.

**රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ**

# කඳවුර අහිමි වූ වසු පැටවා

පනාගොඩට අනුබද්දිත    කඳවුරක
කාලය ගත කලා ඌ සමගින්    මවක
මල් පැල පෑගිලා ගුටි ලැබුනත්    වරෙක
කොතරම් රසද ලා තණකොල    කඳවුරක

සුවසේ රැළ සමඟ සිටියේ    නිදැල්ලෙනී
උගේ ඇගේ මැක්කන් ගත්    කුරුල්ලනී
අණසක පෙදෙස නොම දැන ගිය    ඇසිල්ලෙනී
ඌ දැන් බැඳී ඇත්තේ කඹ    කැරැල්ලෙනී

වැලපී හඬා වැතිරී මඩ ඇති    වලෙක
කීවෙම් රැදෙන්නට රිසි බව ඌ    කඳවුරක
නැති බව දැණිනි තෙත් ගතියක්    හදවතක
දඬුවම සමයි හරකකු මුත්    කඳවුරක

ඌ ලොකු උනත් වහු අම්මට කිරි    එරිණී
ඒ කිරි වලින් නිතරම උගේ බඩ    පිරිණී
පැටියයි අම්මයි අද දෙපලක හිර    කෙරිණී
යකඩ ඇණයකින් උගේ නාසය    විදිණී

ළග නැති විටක හඬගා ඌ තුරුළු    කරන්
වැඩි දුර නොයා පුතුනේ මා ලගම    ඉඳින්
කිව් වහු අම්මේ අද දින දුර ඈත    ඉඳන්
උම්බෑ කියා ඌ එනු නොබලාම    ඉඳින්

පින් සිදු වන්න අතහැර සිටියේ    කඳවුරක
දැන් උන් සිටින්නේ දුක් දෙන ගිනි    ගොඩක
මෙහෙවර කරමින් කඹුරන්නට පෙර    පවක
බැඳ දමා ඇත ඌ අද    ගොවිපලක

අපුරුවට සිටි කඳවුර මතක්    වෙලා
ඉබේ හැදුණු වසු පැටියා රංඩු    කලා
සිහිනෙන් සිටින විට ඌ දුක් වී හඬනු    බලා
කවුදෝ ඇවිත් මම නින්දෙන් අවදි    කලා

සත්‍ය සිදුවීමක් පඩැඳුම් කලේ

සෙ/307418
ලාකො ආනන්ද බීව්
7 ශ්‍රීලපාහ

# "සිල්වර් බියුගලර්ස්" ඔබටයි මේ උපහාරය, වයිට් හැකලය, තුලින්

පාබල විරුවන් ඉතිහාසයේ මෙන්ම
අනාගතයටත් කැපවී ඇත.
රටේ සාමය වෙනුවෙන් දක්ෂතාවයන්
යුධ පෙරමුණේ පමණක් ද නොව
වින්දනයක් ලබා දෙන්නට අපහට
සිල්වර් බියුගලර්ස් .........
අංග සම්පූර්ණ සංගීත කණ්ඩායමක් වශයෙන්
අපට අවශ්‍ය හිතට දැනෙන දේ
හදුනන්නන් වශයෙන් රසාස්වාදයක් සමගම
ක්‍රියාන්විත රාජකාරියෙහි නියැලෙන අයවලුන්ගේ
සිත් වලට සංගීතයෙන් අපව අවධිකල
නුඹලා අපිට ප්‍රබෝධයක්ද වින්දනයක්ද
ලබාදෙන්නට රෙජිමේන්තු ශ්‍රිලපාහ
දායාදයක් ද වූ ඔබ ඒකාකාරී ජීවිතයක්
ගෙවන අපට විටක මහත් අස්වැසිල්ලකි
සේවයට වඩා අගනේය ඔබේ කර්තව්‍ය
අද සිවිල් ජන සමාජයේ
හතු පිපෙන්නාක් මෙන් ඝෝෂාකාරී විරූපී
නොතේරුම් සංගීත රටාවෙන් තොර
අරුතක් ඇති සංගීතය අධ්‍යනය කළ
විනයක් ඇතුව රසාස්වාදයක් සපයන්නට
කලාකරුවන් බිහි වීම අපට මෙන්ම අපේ
රෙජිමේන්තු මාතාවටත් මහත් ආඩම්බරයකි
තවතවත් කලා කරුවන් රැසක් බිහි කරමින්
ඔබ තවත් ඉදිරියට සාර්ථක ගමනක්
යනු නොඅනුමානයි
එයට ධෛර්‍ය , ශක්තිය නොඅඩුව ලැබේවා..........
එයයි අපේ ප්‍රාර්ථනය සෙබළ පුතුනි.......
මේ ආචාරය නුඹටයි
පාබල රෙජිමේන්තුවේ කාහල නාදය
ඉදිරියටම.............
,සිල්වර් බියුගලර්ස්,

සෙ/15648 කෝප්‍රල් මොහොමඩ් ටීආර්
10 ශ්‍රීලපාහ ඒ කණ්ඩායම



# ස්වාපනික (මෝහණ) ප්‍රතිකාර යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?



ස්වාපනික (මෝහණ) වෛද්‍ය ශිල්පීය ක්‍රම මගින් කරනු ලබන ප්‍රතිකාරයකි. පළමුව සුවදායක නින්දකට (මෝහණයට) පත්කරනු ලබයි. එවිට ක්‍රියාත්මක වනු ලබන්නේ යටි සිතයි. අනතුරුව කරනු ලබන ස්වාපනික විශ්ලේෂණයේදී රෝග කාරකය හෙළිදරව් කරනු ලැබේ. තම දැනට සිටින තත්ත්වය පිළිබඳ මනා අවබෝධයක් ඔබට ලබාදීමෙන් ප්‍රතිකාරය ඇරඹෙයි. එය අතීතය සහ වර්තමානය මනා ලෙස සම්බන්ධීකරණය කිරීමකි. අතීත සිදුවීම් වර්තමානයට බලපා ඇති සැටිත් ඒවා සිදුවීමට පෙළඹවූ අවස්ථාත් එසේ ඇති වූයේ කුමන හේතුවක් නිසාදැයි නිරාකරණය කර ගැනීමට ඔබට මෙම පිළිවෙළ උදව් වෙයි. මේ අනුව තමාගේ ජීවිතයේ යථා තත්ත්වය විනිවිද දැකීමේ හැකියාවක් ලැබේ. තමාගේ රෝග ලක්ෂණ වලට පාදක වූ මෙතෙක් කල් සැඟවී තිබුණ සියලු රෝග කාරක යථා ස්වරූපයෙන් අවබෝධ වන බැවින් ජීවිතය යළි ක්‍රමානුකූලව හැඩ ගස්සවා ගැනීමට ආශාවන් ශක්ති මාර්ගයත් ලබා ගැනීමට හැකිවේ. එසේම ප්‍රතිකාරයේදී ඔබගේ මනසට හේතුවාදී ධනාත්මක සිතුවිලි ඇතුළු කිරීමේ ක්‍රමයෙන් සාර්ථකව නිරෝගිමත් ජීවිතයකට යළි මග පෑදේ.

**ස්වාපනික (මෝහණ) ප්‍රතිකාරයෙන් පසු ඔබ කෙරෙහි ඇතිවන වෙනස:**

ස්වාපනික මෝහණ චිකිත්සාවෙන් පසු ඔබ ලබන ප්‍රථම වෙනස නම් එතෙක් කල් පැවති රෝග ලක්ෂණ ක්‍රමයෙන් පහව් යාමට පටන් ගැනීමයි. එසේම මානසික සහනයත් සතුටත් වින්දනයත් නොමදව ලැබෙන අතර එය ඔබේ මානසික සෞඛ්‍ය ශක්තිමත් කරලීමට ඉමහත් රුකුලක් වනු ඇත. ඒ අනුව ඔබ ලබන්නාවූ ආත්ම විශ්වාසයත් අධිෂ්ඨාන ප්‍රතිබද්ධ ශක්තියත් නිසා කලින් කිරීමට අසමත් වූ දේවල් කිරීමටත් සතුටින් සිටීමටත් හැකියාවක් ලබා ගනී.

**ස්වාපනික (මෝහණ) වෛද්‍ය ප්‍රතිකාර සම්බන්ධව ජාත්‍යන්තර වෛද්‍ය විශේෂඥයන්ගේ අදහස:**

ස්වාපනික (මෝහණ) විද්‍යාව වර්තමාන ලෝකයේ වෛකල්පිත වෛද්‍ය විද්‍යාවක් ලෙස බෙහෙවින් ජනාදරයට පත්වෙමින් පවතී. බ්‍රිතාන්‍ය වෛද්‍ය සංගමය විද්‍යාත්මක ස්වාපනයෙන් රෝගීන්ට ප්‍රතිකාර කළ හැකි බැව් පිළිගෙන තිබේ. අදාල රෝගියා ස්වාපනයට පත්කර රෝග යට හේතු සොයා එම මානසික බලපෑම් යෝජනා මගින් ඉවත් කිරිම එහි ප්‍රථම පියවරයි. බටහිර බොහොමයක් රටවල නිර්වින්දනය සඳහා මෙම විද්‍යාව බහුලව ප්‍රයෝජනයට ගනිති. දත් ඉගිල්ලීම සහ පිරවීම බිඳුණු ඇට නැවත සවි කිරීමේදී සහ ශල්‍යකර්ම වලදී ස්වාපනය ප්‍රයෝජනයට ගැනේ. දරු ප්‍රසූතියේදී (වේදනා සංසිඳුවාලන) මව්වරුන්ට සහනය ගෙන දෙන විශේෂ ක්‍රමයක් බව සෝවියට් රුසියාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කර ඇත. වෛද්‍ය අංශයට මෙම විද්‍යාවෙන් බලවත් පිටිවහලක් සැලසේ දීර්ඝකාලීනව ඖෂධ ප්‍රතිකාර වලින් සුවයක් නොලබන රෝගීන්ට මානසික ප්‍රතිශක්තිකරණයක් මෙමගින් ලබාදිය හැකිය.
එපමණක් නොව ස්වයංක්‍රීයව ස්නායු පද්ධතිය ප්‍රාණවත් කර ක්‍රමිකව ගතපුරා ස්නායු ශක්තිය බෙදා හැරීමට උදව් කිරීම මෙම විද්‍යාව තුලින් කළ හැකිය.

මිනිසාට වැළදෙන රෝගාබාදයනට ඔහුගේ අතිශයින් අත්භූත ලෝකයක් බඳු වූ යටිසිත බලපාන්නේ නම් ඔහුගේ සෞඛ්‍ය පිළිබඳවද ඒ නියමය අදාල වේ එසේනම්, ස්වාපනය තුළින් මිනිස් සිතේ රෝග නිවාරණ ශක්තීන් ප්‍රබෝධයට පත්කළ හැකිය. හෘදය, පෙනහළු, අක්මාව, ආමාශය, වකුගඩු, ආහාර දිරවීමේ ඉන්ද්‍රියයන්, මළ මූත්‍ර පහ කිරීමේ ඉන්ද්‍රියයන්, ලිංගේන්ද්‍රිය වැනි අවයවයන්ගේ නානාවිධ ග්‍රන්ථීන් මිනිසාගේ අවිඥාණයෙන් ස්වයංක්‍රීයව බලපාන ඉන්ද්‍රිය පද්ධතියක් බව නූතන මනෝ වෛද්‍ය විද්‍යාව හෙළිකරයි. එසේම මිනිසාගේ මනස ලිංගික ජීවිතයට බෙහෙවින් බලපාන බව නූතන මනෝ විද්‍යාඥයන් අවධාරනයෙන් පිළිගනිති.

මනෝ ලිංගික දුබලතා සුවකර ගැනීමේදී ස්වාපනය ඉතාමත් පිටිවහලක් බව අනාවරණය වී තිබේ.
එපමණක් නොව,

1. හිස්ටීරිය තත්ත්වයන්
2. ඖෂධීය ප්‍රතිකාර වලින් සුව නොවුන රෝග.
3. අඹු සැමියන් අතර පවත්නා දීර්ඝ කාලීන ගැටළු
4. අධික ලෙස කෝපයට පත්වීම
5. ඉගැනුම් දුෂ්කර තාවයන්
6. ගොත ගැසීම
7. ඇබ්බැහි වීම
8. අමතක වීම
9. ලිංගික ගැටළු
10. කලකිරීම
11. අලසබව
12. භූතාවේශ
13. චර්මාබාධ
14. සැකය
15. භීතිකා තත්ත්වයන්
16. මනෝකායික රෝග
17. ආතතිය
18. සියදිවි නසා ගැනීමට තැත් කර ගැනීම
19. අධි රුධිර පීඩනය
20. ආතරයිටීස්
21. දිනෙන් දින වැහැරීම
22. ප්‍රශ්ණ වලදී මුහුණ නොදී පැන යාම
23. දරු ඵල නැතිවීම යනාදී තත්ත්වයන් මෝහණය තුලින් සුව කළ හැකිය.

ශ්‍රී ලංකා ස්වාපන
විද්‍යාවේදීන්ගේ සංගමයේ
සභාපති මනෝවිද්‍යා උපදේශක
**ආචාර්ය ජී.ඒ ගමගේ**

**පාඨක ඔබට පැනනගින ගැටලු පිළිබඳව නාමිකව හෝ නිර්නාමිකව මෙම සඟරාව වෙත යොමු කරමින් නිරාකරණය කර ගැනීමට අවස්ථාව සළසා ඇත.**

# "යුද්ධය යන්න සෑම විටම විශ්ව සාධාරණ නොවේ. එනම් ජීවත් වීම යන්න ආශ්වාස ප්‍රාශ්වාස කිරීම පමණක් නොවේ" - මැක්සිම් ගෝර්කි

සිත යනු මිනුම් දණ්ඩකින් මැනිය නොහැකි වස්තුවකි. නමුත් සිතෙහි හට ගන්නා සෑම සිතුවිල්ලක්ම ක්‍රියාවක් බවට පත්වීමට ඉඩ ඇත. එය අතිශ්‍යයෙන්ම දුෂ්කර වනු ඇත. ඊට හේතුව මිළක් කල නොහැකි වස්තුවක් වීමයි.

ජනතාව යන්න තවත් මාතෘකාවකි. ඔවුන් විවිධ උප සංස්කෘතීන් තුල ජීවත් වීම නිසා එකිනෙකාට උපදින චිත්තමය සිතුවිලි සංකීර්ණ වේ.එනමුත් ඕනෑම සංකීර්ණත්වයක් යටතේ 14 (සෙව්) ශ්‍රිලපාහ ඒකකය මුහුණ දීමට පසු බට නොවේ.

513 බලසේනා මූලස්ථානයේ අළුත්ම සාමාජිකයා බවට පත්වී වැඩි කාලයක් නොවේ. දස අවුරුද්දක යාපනය අර්ධද්වීපය තුල සේවය කළ අප ඒකකය 2007.05.27 වන දින චුන්නාකම් ප්‍රදේශයේ රාජකාරී භාරගැනීමෙන් පසු සිවිල් ජනතාව සහ ඔවුන්ගේ ගති පැවතුම් සමඟ රාජකාරී කිරීමට සිදුවීම සුවිශාල වූ කාර්යය භාරයකි. මෙම ඒකකයේ අණදෙන නිලධාරි මේජර් වයිඑම් පුංචි බණ්ඩාර ආර්එස්පී ශ්‍රීලපාහ අනුදැනුමින් යුක්තව 14(සෙව්) ශ්‍රිලපාහ බී කණ්ඩායම ස්ථාපිත වී ඇත්තේ කොකුවිල් - චුන්නාකම් ප්‍රදේශයේය. එම කණ්ඩායමේ නිලධාරි අණදෙන හා බණ්ඩහාර නිලධාරින් සහ සෙසුනිලයන් මඟින් කොකුවිල් හින්දු පාසල් භූමියේ සංවිධානය කරන ලද සිවිල් ජනතාව හා ඔවුන්ගේ අදහස් හුවමාරුකර ගත් කතිකාවක් 2007 ජූලි මස 28 වන දින පවත්වන ලදි.

මෙහිදී ප්‍රධාන මූලසුන හොබවන ලද 513 බලසේනාධිපති කර්නල් ජීජේඩබ් ගලගමගේ යන ජ්‍යෂ්ඨ නිලධාරි විසින් මෙකී ජනතාව අමතන ලදි.සෑම මිනිසෙකුටම කුමන ආකාරයකට හෝ අදහස් ප්‍රකාශ කළ හැකි නමුත් ඔහු එම අදහස් තවකෙකුට අවහිරයක් නොවන පරිදී මෙන්ම සිත් දිනා ගන්නා ලෙස ඉදිරිපත් කිරීම සුළු පටු කාරණයක් නොවේ.කෙසේ හෝ මෙකී අදහස් නිසි පරිදී හිසුරුවමින් දහස් ගණන් ජීවත් වන සිවිල් ජනතාව හෙබි චුන්නාකම් ප්‍රදේශය තුළ තම බුද්ධිමය බලය බෙදා හැරීමට කරලියේ ප්‍රධාන ආමන්ත්‍රකයාට හැකිවීම යනු දෙමළ ජනතාව යුධ හමුදාව කෙරෙහි විශ්වාසය තබාගැනීම විනා වෙන යම් කවරක්ද?

එබැවින් ඒ බැව් විද්‍යමාන කරමින් 14 (සෙව්) ශ්‍රිලපාහ ඒකකය 513 බළසේනා මුලස්ථානයේ ගෞරවයද රැක ගනිමින් ඉදිරියට යන වග මනාව පැහැදිලි වේ."යුද්ධය යන්න සෑම විටම විශ්ව සාධාරණ නොවේ එනම් ජීවත්වීම යන්න ආශ්වාස ප්‍රාශ්වාස කිරීම පමණක් නොවේ - මැක්සිමන් ගෝර්කි විද්වතාගේ කියමන සනාථ කරමින් 14 (සෙව්) ශ්‍රිලපාහ ඒකකය **"සේවය කරමි"** යන පාඨය තුල ජීවත් වනු ඇත.




**513 බළ සේනාධිපති කර්නල් ජීජේඩබ් ගලගමගේ යන ජ්‍යෂ්ඨ නිලධාරි විසින් සිවිල් ජනතාව අමතා ආමන්ත්‍රණය කළ අවස්ථාව**

සැකසුම
නි/6021 ලුතිනන්
**කේ අසිත ප්‍රභාත් එදිරිසිංහ ශ්‍රිලපාහ**
14 (සෙව්) ශ්‍රිලපාහ



එම දේශනයට සවන් යොමු කරන සිවිල් වැසියන්




ළමා අපයෝජනය සියවස් ගණනාවක් පුරා සමාජය තුළ රහසේ ව්‍යාප්ත වූ ළවදුරකි. එහෙත් එය බරපතල සමාජ පිළිලයක් බව හඳුනාගෙන ඊට එරෙහි වීමට තරම් අවධානයක් යොමු වුණේ මෑත දශක කිහිපයක සිටයි. 80 දශකයේ මැද භාගය වන විට ශ්‍රීලංකාව තුළ ළමා කායික දණ්ඩනය වරදක් බවත්, 90 දශකයේ මුල් භාගයේ ළමා ලිංගික අපයෝජනය බරපතල වරදක් බවටත් හඳුනා ගැණුනා. එතැන් සිට ළමා අපයෝජන වලින් සිදුවන කෙටි කාලීන මෙන්ම දිගුකාලීන අයහපත් බලපෑම් පිළිබඳව කටයුතු කිරීම පිණිසත්, ළමයින්ට සිදු කරන විවිධාකාර ප්‍රචන්ඩ ක්‍රියා සහ කෲරත්වයට එරෙහිව පියවර ගැනීම සඳහාත් ශ්‍රීලංකාවට එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය සමග අත්වැල් බැඳ ගනු ලැබුවා.

## ළමා ආරක්ෂාවේ විශේෂ සන්ධිස්ථාන

✲ 1989 එක්සත් ජාතීන් විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ලොවට ඉදිරිපත් කිරීම.

✲ 1991 ශ්‍රීලංකාව එක්සත් ජාතීන්ගෙ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට එකඟත්වය පළ කළ අත්සන් තැබීම.

✲ 1995 දණ්ඩ නීති සංග්‍රහයට ළමා ආරක්ෂාව පිළිබඳ නව නීති ඇතුළත් සංශෝධන ඉදිරිපත් කිරීම.

✲ 1996 දෙසැම්බර් මස ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටු වීම.
(මෙම බලකායේ නිර්දේශ මත සිදු කළ නීතිමය ප්‍රතිශෝධනයන් හි ප්‍රථිඵලයක් ලෙස)

✲ 1998 අංක 50 දරණ පනත මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (National Child Protection Authoruty) පිහිටුවීම.

## ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය

ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස ලොව විවිධ සංවිධාන හා රාජ්‍යයන් ඒකරාශී වීමේ ප්‍රථිඵලයක් ලෙස 1989 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය විශ්ව ප්‍රකාශනයක් ලෙස සම්මත විය.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ ළමයා සඳහා වැඩිහිටියා විසින් සුරක්ෂිත කර දිය යුතු අයිතීන් මේ යැයි වගන්ති 54 ක් තුළින් ඉතා පුළුල්ව විස්තර කරයි. අයිතිවාසිකම් භුක්ති විඳිමේදී ලොව වෙසෙන සෑම දරුවෙකුටම එය එකසේ බලපානු ලබන අතර ළමයා පවුල තුළ ස්වාධීන පුද්ගලයෙක් බව මේ තුළින් අවධාරණය කරයි. මේ තත්ත්වයන් පිළිබඳව වඩා සැළකිල්ලට ගනිමින් ප්‍රධාන ප්‍රස්තුත 4 ක් ඔස්සේ ළමා අයිතිවාසිකම් පිළිබඳ අවධාරණය කරයි.

සියළුම ළමයින්ට,

1 ජීවත් වීමට ඇති අයිතිය 3 ආරක්ෂා වීමට ඇති අයිතිය
2 සංවර්ධනය වීමට ඇති අයිතිය. 4 සහභාගී වීමට ඇති අයිතිය

මීට අමතරව 2002 වර්ෂයේදී අතිරේක සම්මුති දෙකක් මේ තුළට ඇතුළත් කරමින් ළමුන්ගේ ආරක්ෂාව තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා එක්සත් ජාතීන් කටයුතු සිදු කළහ.


ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය යනු යෝජනාවලියකි. එය රටක සක්‍රිය කර බලාත්මක කිරීම සඳහා එම රටේ නීති සමග බද්ධ කිරීම හෝ සංශෝධනය කළ යුතුය.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය

ළමා අපයෝජනයන් වැළැක්වීම, ළමා ආරක්ෂාව සහ වින්දිත ළමුන් පුනරුත්තාපනය යන සියල්ල සඳහාත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, ළමා අපයෝජනයන්ට එරෙහි ක්‍රියා සම්බන්ධීකරණය හා නියාමනය සහ ළමා අපයෝජනයන්ට සම්බන්ධ අනෙකුත් සියළුම ක්‍රියා පිළිබඳව ක්‍රියාත්මක වීම පිණිසත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය බිහි විය.

✲ ළමා ආරක්ෂාව, ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සහ ළමා අපයෝජනය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.

✲ ළමා අපයෝජනයන්ට එරෙහිව නීති රීති සකස් කිරීම, සංශෝධනය හා නීතිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීම මගින් නීතිය ශක්තිමත් කිරීම.




✲ ළමා ආරක්ෂාව පිළිබඳ නියැලෙන වෘත්තිකයන්ගේ කුසලතා සංවර්ධනය කිරීම.

✲ ළමා අපයෝජනයන්ට බඳුන් වූ ළමුන් ආරක්ෂා කිරීම සහ පුනරුත්තාපනය කිරීම.

## ළමයා

**අව්‍යාජත්වයේ හා සුන්දරත්වයේ විශ්වමය සංකේතය" ළමයා" ය මානව ශිෂ්ටාචාරයේ තීරණාත්මක සාධකය "ළමයා"ය විශ්වයේ ශ්‍රේෂ්ඨතම නිර්මාණය "ළමයා" ය මෙවන් සාහිත්‍යමය නිර්වචනයන්ට පාත්‍රවූ "ළමයා" නිර්වචනයකට හසු කළ නොහැකි තරම්ය.**

ළමයා යනු වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකි. (ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය වගන්ති අංක 01) මෙය ජාත්‍යන්තරව පිළිගන්නා මතයයි.

## ළමා අපයෝජන

සුන්දර ළමාවිය සොරකම් කරන ළමා අපයෝජන, පුංචි ජීවිත වලට තර්ජනයකි.

**අපයෝජනය** - ''අප'' යනු වැරදි, නොමනා, නුසුදුසු හෙවත් අයතා යන්නයි. ''යෝජනය'' යන්න යොදා ගැනීමයි. ඒ අනුව කැමැත්ත ප්‍රකාශ කිරීමේ හැකියාව සහ කැමැත්ත දීමේ නිසි වයසක නොමැති ළමයා, වැඩිහිටියා (අවමව ළමයාට වඩා වයස අවුරුදු පහකට වැඩිමල් පුද්ගලයෙකු) විසින් ශාරීරිකව හෝ මානසිකව හෝ ලිංගිකව හෝ අයුතු පෙළඹවීම හෝ යෙදවීම අපයෝජනය වේ.

**ළමා අපයෝජනය** - සියලුම ආකාරයේ කායික සහ මානසිකව ළමයාට සිදුකරන්නාවූ නොමනා ක්‍රියා, ලිංගික අපයෝජනය, නොසළකා හැරීම හෝ නොසැළකලිමත් ලෙස සැළකීම හෝ වාණිජමය හෝ වෙනත් ආකාරයේ සූරාකෑම් හේතු කොට ළමයාගේ සෞඛ්‍යය, පැවැත්ම, සංවර්ධනය හෝ වගකීම් විශ්වාසය හෝ බලය යන සම්බන්ධතා විෂයෙහි ගරුත්වයට හානි පැමිණ වීම හෝ එසේ විය හැකි ලෙස ක්‍රියා කිරීම ළමා අපයෝජනය ලෙස හෝ ළමා හිංසනය ලෙස අර්ථ දැක්වේ. **(ලෝක සෞඛ්‍යය සංවිධානය 1999)**




මෙවන් හිංසා ළමා අපයෝජනය වේ. දැන් ඔබට ඊට එරෙහි විය හැකිය. ළමා අපයෝජනයන්ට එරෙහි නීති රීති දැඩිව ක්‍රියාත්මක වේ. පුද්ගල තරා තිරම නොතකා පහසුවෙන් හා බාධාවකින් තොරව නීතිමය පියවර ගත හැකිය.

ළමා අපයෝජනය සිදු වීමක් පිළිබඳ ඔබ ඇසුවා නම් හෝ දුටුවා නම් හෝ විගස ඔබ කළ යුත්තේ ළඟම ඇති පොලීසියේ ළමා හා කාන්තා කර්යාංශයට හෝ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණිලි කිරීමයි.

ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ "ළමා අපයෝජනයට වැට බඳිමු" ඇසුරෙන්

# පදක්කම් හා පළඳනා පිළිබඳ කෙටි සටහන්

පසුගිය කලාපයේ ඉතිරිය......

**පරම වීර විභූෂණය** - ත්‍රිවිධ හමුදා නිත්‍ය සහ ස්වේච්ඡා බළසේනාවල සියලුම නිලයන්ට අති විශිෂ්ඨ වීරත්වයට මෙම පළඳනාව පිරිනමනු ලැබේ. 1981 වර්ෂයේ සංස්ථාපනය කරන ලදි. රිදියෙන් තනා නිමකර ඇත.පළඳනා ලාභින්ට තම නමට පසුව **පීඩබ්වී** යන සංකේතය භාවිතා කළ හැක.

**වීරෝධාර විභූෂණය** - ත්‍රිවිධ හමුදා නිත්‍ය සහ ස්වේච්ඡා බළසේනාවේ සියලුම නිලයන්ට අසෛනික වීරත්වයට මෙම පළඳනාව පිරිනමනු ලැබේ.1981 වර්ෂයේ සංස්ථාපනය කරන ලදි. රිදියෙන් තනා නිමකර ඇත. පළඳනාලාභීන්ට නමට පසුව **ඩබ්වී** යන සංකේතය භාවිතා කල හැක.

**වීර වික්‍රම විභූෂණය** - ත්‍රිවිධ හමුදා නිත්‍ය හා ස්වේච්ඡා බළසේනාවල සියලු නිලයන්ට වීරත්වයට හා ප්‍රශස්ත ක්‍රියා වලට මෙම පදක්කම පිරිනමනු ලැබේ.1981වර්ෂයේ සංස්ථාපනය කරන ලදි. රිදියෙන් තනා නිමකර ඇත. පළඳනාලාභීන්ට තම නමට පසුව **ඩබ්ඩබ්වී** යන සංකේත නාමය භාවිතා කළ හැකිය

**රණ වික්‍රම පදක්කම** - ත්‍රිවිධ හමුදා නිත්‍ය හා ස්වේච්ඡා බළසේනාවල සියලු නිලයින්ට වීරත්වයට මෙම පලඳනාව පිරිනමනු ලැබේ.1985 වර්ෂයේ සංස්ථාපනය කරන ලදි. රිදියෙන් තනා නිමකර ඇත. පළඳනා ලාභීන්ට තම නමට පසුව **ආර්ඩබ්පී** යන සංකේත ය භාවිතා කල හැකිය.

**රණ ශූර පදක්කම** - ත්‍රිවිධ හමුදා නිත්‍ය හා ස්වේච්ඡා බළසේනාවල සියලූ නිලයන්ට විශිෂ්ට චරියාවට මෙම පළඳනාව පිරිනමනු ලැබේ.1985 වර්ෂයේ සංස්ථාපනය කරන ලදි.
ලෝකඩයෙන් තනා නිමකර ඇත. පළඳනාලාභීන්ට තම නමට පසුව **ආර්එස්පී** යන සංකේතය භාවිතා කළ හැක.

**විශිෂ්ඨ සේවා විභූෂණය** - ත්‍රිවිධ හමුදා නිත්‍ය බළසේනාවේ ජ්‍යෂ්ඨ නිලධාරින්ට විශිෂ්ඨ හා රාජපාක්ෂික සේවයට මෙම පදක්කම පිරිනමනු ලැබේ.ජාතික දින උත්සව අවස්ථාවලදී පදක්කම් ප්‍රධානය සිදුකරනු ලබයි. පළඳනා ලාභීන්ට තම නමට පසුව **වීඑස්වී** යන සංකේතය භාවිතා කළ හැකිය.

**උත්තම සේවා පදක්කම** - ත්‍රිවිධ හමුදා නිත්‍ය බළසේනාවේ සියළුම නිලයන්ට අනර්ග සේවයට හා රාජකාරිමය කැපකිරීමට මෙම පදක්කම පිරිනමනු ලැබේ. පලඳනා ලාභීන්ට තම නමට පසුව **යූඑස්පී** යන සංකේත ය භාවිතා කළ හැකිය.

**විදේශ සේවා පදක්කම** - ත්‍රිවිධ හමුදා නිත්‍ය හා ස්වේච්ඡා බළසේනාවල සියළු නිලයන්ට දිවයිනෙන් බැහැර සක්‍රිය සේවයේ උදෙසා මෙම පදක්කම පිරිනමනු ලැබේ.

**ශ්‍රී ලංකා ජනරජ සන්නද්ධ සේවා පදක්කම - 1972** - 1972.05.22 දින රාජාණ්ඩු ක්‍රමය අහෝසිකර ලංකාව ජනරජයක් බවට පත්කිරීම සැමරීමට එදින සේවයේ යෙදී ත්‍රිවිධ හමුදා නිත්‍ය හා ස්වෙච්ඡා බළසේනාවල සියළු නිලයින්ට මෙම පදක්කම ප්‍රධානය කරනු ලැබේ.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා රජත ජයන්ති පදක්කම -1974** - 1974.10.17 දින සේවයේ යෙදී සිටි යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බළසේනාවල සියළුම නිලයන්ට මෙම පදක්කම පිරිනමනු ලැබේ.

**දෙවන එලිසබත් රැජිණ රාජාභිෂේක පදක්කම 1953**

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වර්ණ ජයන්ති පදක්කම 1999** 1999.10.17 දින සේවයේ යෙදී සිටි යුද්ධ හමුදාවේ නිත්‍ය හා ස්වෙච්ඡා බළසේනාවේ සියලු නිලයින්ට මෙම පදක්කම පිරිනමනු ලැබේ.

**ශ්‍රී ලංකා සන්නද්ධ පදක්කම 1968**

**ශ්‍රී ලංකා සන්නද්ධ සේවා දිර්ඝ සේවා පදක්කම - 1979** ත්‍රිවිධ හමුදා නිත්‍ය බළසේනාවල සියලු නිලයන්ට යහපත් පැවැත්මකින් හා චරිතයකින් යුතුව වසර 12 සේවා කාලයක් සැපිරීම උදෙසා මෙම පදක්කම පිරිනමනු ලැබේ.

**ජනපති පදවිප්‍රාප්ත පදක්කම - 1978** 1978.02.04 වන දින සේවයේ යෙදි සිටි ත්‍රිවිධ හමුදා නිත්‍ය හා ස්වේච්ඡා බළසේනා වල සියලු නිලයින්ට මෙම පදක්කම පිරිනමනු ලැබේ.

**50 වන නිදහස් සමරු පදක්කම** - 1998.02.04 වන දින සේවයේ යෙදී සිටි ත්‍රිවිධ හමුදා නිත්‍ය හා ස්වේච්ඡා බළසේනාවල සියලු නිලයන්ට මෙම පදක්කම පිරිනමනු ලැබේ.

**දේශ පුත්‍ර සම්මානය** - සක්‍රිය සේවයේ යෙදී සිටියදී රණක්ෂතියට පත් හෝ එවැනි තුවාලයක් හේතු කොට ගෙන මියගිය ත්‍රිවිධ හමුදා නිත්‍ය හා ස්වෙච්ඡා බළසේනා වල සියලු නිලයන්ට මෙම පදක්කම පිරිනමනු ලැබේ.

**උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම් හා සන්ධාරය** - උතුරු සහ නැගෙනහිර පලාත්වල අයත් දිස්ත්‍රික්කවල සහ අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් නොච්චියාගම නුවරගම්පලාත සහ විලච්චිය යන ප්‍රා.ලේ.කො වල සහ පුත්තලම දිස්ත්‍රික්කයට අයත් කල්පිටිය වනාථවිල්ලුව හා කරුවලගස්වැව යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වලට සහ පොලොන්නරු දිස්ත්‍රික්කයට අයත් දිඹුලාගල සහ කන්සාපුර ප්‍රා.ලේ.කො. වල 1983 ජූලි මස 23 වන දින සිට ඉදිරියට අවුරුදු තුනක සේවා කාලයක් සපුරා ඇති ත්‍රිවිධ හමුදා නිත්‍ය හා ස්වේච්ඡා බළසේනාවල සියළුම නිලයින්ට මෙම පදක්කම පිරිනමනු ලැබේ.

**1 වන සන්ධාරය** - ඉහත සදහන් ප්‍රදේශවල අවුරුදු 3 ක සේවයට අමතරව තවත් අවුරුදු දෙකක සේවයක් සපුරා තිබීම (මුළු කාලය අවුරුදු 5යි)

**2 වන සන්ධාරය** - පලවන සන්ධාරය හිමි වු පසු තවත් අවුරුදු පහක් සේවය කර තිබීම (මුළු කාලය අවුරුදු දහයයි)

**පූර්ණ භූමි පදක්කම** - උතුරු සහ නැගෙනහිර පලාත්වලට අයත් දිස්ත්‍රික්ක වල මාස හයක කාලයක් සේවය කර ඇති ත්‍රිවිධ හමුදා නිත්‍ය හා ස්වේච්ඡා බළසේනාවල සියලු නිලයන්ට මෙම පදක්කම් ප්‍රධානය කරනු ලැබේ.
(යාපනය,වවුනියාව කිලිනොච්චිය මුලතිව් මන්නාරම මඩකලපුව ත්‍රිකුණාමලය සහ අම්පාර)

**වඩමාරච්චි මෙහෙයුම් පදක්කම** - වඩමාරච්චි ක්‍රියාන්විතය සඳහා ක්‍රියාකාරිලෙස සම්බන්ධ වූ ත්‍රිවිධ හමුදා හා නිත්‍ය හා ස්වේච්ඡා බළසේනාවල සියලු නිලයින්ට මෙම පදක්කම පිරිනමනු ලැබේ.

**රිවිරැස මෙහෙයුම් පදක්කම හා සන්ධාරය** - 1995.10.17දින සිට 1995.12.05 දින දක්වා කාලය තුල යාපනය අර්ධද්වීපය තුල සක්‍රිය සේවයේ යෙදි දිටි ත්‍රිවිධ හමුදා අයවලුන්ට (නිත්‍ය /ස්වේච්ඡා) හා සිවිල් සේවක මහතුන්ටද පෙර සඳහන් වකවානු තුල අවම වශයෙන් දින හතක කාලයක් සේවය කළ වෛද්‍ය වරුන්ට හා ඔවුන්ගේ කාර්ය මණ්ඩලයටද පදක්කම් සඳහා හිමිකම ඇත. වෙඩි ආධාර හකාස වෛද්‍ය සැලසුම් මඟ පෙන්වීම හා වෙනත් ක්‍රියාකාරකම් තුලින් සටනට දායක වෙමින් පෙර සදහන් වකවානුව තුල අවම වශයෙන් දින 25 ක කාලයක් සක්‍රිය සේවයේ යෙදී සිටි ත්‍රිවිධ හමුදා අයවලුන්ට (නිත්‍ය /ස්වේච්ඡා ) මෙම පදක්කම් හා සන්ධාරය යන දෙකටම හිමිකම් ඇත.

### ශ්‍රිලයුහ ස්වේච්ඡා බළසේනා ශත සංවත්සර පදක්කම

1981 අප්‍රේල් මස දිනට සේවයේ නියුක්තව සිටියාවූද  ඒ වන විට ක්‍රියාකාරී ලැයිස්තුවේ වසර 10 ක සේවයක් සම්පූර්ණ කර ඇත්තාවූද ශ්‍රී ලංකා ශිෂ්‍යභට බළකායේ සෙසු නිලයින් හැර ශ්‍රී ලංකා ස්වේච්ඡා බළසේනාවේ සියලුම නිලයන්ට මෙම පදක්කම ප්‍රධානය කර ඇත. තවද 1981 අප්‍රේල් මස 1 වන දිනට ස්වේච්ඡා බළසේනාවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවයේ නියුක්ත නිත්‍ය  බළසේනනාවට අයත් වූ ස්වෙච්ඡා බළසේනාවේ ස්ථිර කාර්‍ය මණ්ඩලයේ අවම වශයෙන් එක් අවුරුදු කාල පරිච්ඡේදයක් සේවයේ නියුක්තව සිටි නිත්‍ය බළසේනාවේ මුළු වශයෙන් අවුරුදු 10 ක කාල පරිච්ඡේදයක් සේවයේ නියුක්තව සිටි පුද්ගලයින්ටද මෙම පදක්කම ප්‍රධානය කර ඇත.

වෘත්තාකාර හැඩයෙන් යුතුව ලෝහයෙන් තනා ඇති මෙම පදක්කම ඉදිරිපස ශ්‍රී ලංකා යුධ හමුදා ස්වේච්ඡා බළසේනා සළකුණද ඊට පහලින් 1881 -1981 යන ඉලක්කම්ද පාදමෙහි ශ්‍රී ලංකා ස්වේච්චා බළසේනාව යන වචනයද ඒ සියල්ලටම උඩින් ශත සංවත්සරය යන වචනයද පතුලේ එම අර්ථයම දෙන දෙමළ වචනයද කොටා ඇත. පසු පස පතුලෙහි දකුණු පස කිරණ විහිදුවන සූර්ය රූපයද හා වම් පස චන්ද්‍ර රූපයද ඒ මැද පුන්කලසද ඒ මත වී කරල් මෝස්තරක් ඇතුලත නෙලුම් පෙති බෝඩරයක් මැද පිහිටි ශ්‍රී ලංකා සංකේත සිංහ රූපයක්ද මුදුනෙහි ධර්ම චක්‍රයක්ද සහිත ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ වංශ ධජයෙන්ද ඒ සියල්ල වටා වැටුණු පලාපෙති බෝඩරයක්ද පැරණි චිත්‍ර කලා සම්ප්‍රධානුගත ලියපත් රටාවකින් සැරසුනු අල්ලුවකින්ද සමන්විත වේ.

තවද මැද අඟලකින් පහෙන් එකක් පළලැති බිලූ තීරුවකින් සමන්විත අඟල් එකයි කාලක් පළල කහ පාට පීත්ත පටියකින් එල්ලෙක සේ මෙම පදක්කම පපුවේ වම්පස පැළඳිය යුතුයි.

### කාර්යක්‍ෂම සේවා විභූෂණය

ශ්‍රී ලංකා යුධ හමුදා ස්වේච්ච් බළසේනාවේ සක්‍රිය නාම ලේඛණයේ සම්පූර්ණ වශයෙන් දහ අට වසරක කාර්‍යක්‍ෂම අධිකාරිලත් සේවයක් ඇති නිලධාරීන් විසින් රටට කරන ලද දීර්ඝ ප්‍රසංසනීය පක්‍ෂපාතී සහ අගනා සේවා අරභයා උපහාර දැක්වීමක් වශයෙන් කාර්‍යක්‍ෂම සේවා විභූෂණය ප්‍රධානය කරනු ලැබේ.

මෙම විභූෂණය ලෝකඩ වලින් අණ්ඩාකාරව තනා ඇති අතර එහි ඉදිරිපස ශ්‍රී ලංකාවේ ලාංජනය වටකොට නෙරා සිටින පෙරැස් මුද්දක් තිබේ.මේ සියල්ල කතිර හැඩයට තිබෙන කඩු දෙකකට ඉහලින් ඇත. විභූෂණයේ පසුපස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා  බළ සේනාවේ ලාංජනය ඇති අතර එයට යටින් කාර්‍යක්‍ෂම සේවය සඳහා යන පාඨය රාජ්‍ය භාෂාවෙන් දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් සටහන් වී තිබේ. ලාංජනයට ඉහලින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව යන පාඨය රාජ්‍ය භාෂාවෙන් දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් සටහන් වී ඇත.

තවද ලෝකඩ හාරිච්චි කටුවක් සවිකල අඟල් එකහාමාරක් පළලැති වූද නිල් කහ රන් හා කොළ පාට ඉරි එම පිළිවලින් දෙකෙළවරේ සිට මධ්‍ය දක්වා එන මාධ්‍යයේ ඉහළ සිට පහලට කලුපාට ඉරක් දිවෙන පීත්ත පටියකින් පපුවේ වම්පස එල්ලෙන පරිදී විභූෂණය පැළඳිය යුතුය.


### කාර්යක්‍ෂම සේවා පදක්කම

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සක්‍රිය ලැයිස්තුවේ අවුරුදු 18 ක කාර්‍යක්‍ෂම සේවා කාලයක් සපුරා ඇති බළලත් නිලධාරීන්ටද අධිකාරී නොලත් නිලධාරින්ටද දීර්ඝවූත් කාර්‍යක්‍ෂම වූත් පක්‍ෂපාත වූත් සේවයට හා විශිෂ්ඨ තත්ත්වයේ ආදර්ශමත් චර්යාවට උපහාර දැක්වීමක් වශයෙන් කාර්‍යක්‍ෂම සේවා පදක්කම ප්‍රධානය කරනුලැබේ.


මෙම පදක්කම් රිදියෙන් අණ්ඩාකාරව තනා ඇති අතර එහි ඉදිරිපස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංජනය වට කොට උඩට නෙරා සිටින පෙරැස් මුද්දක් තිබේ. මේ සියල්ල කතිර හැඩයට තිබෙන රයිෆල් දෙකකට ඉහලින් ඇත. එසේම එහි පසුපස ශ්‍රිලංකා ස්වේච්ඡා බළසේනා ලාංජනයට යටින් රාජ්‍ය භාෂාව දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනේම කාර්යයක්ෂම සේවය සඳහා යන්න හා ලාංජනය උඩින් රාජ්‍ය භාෂාව දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනම ශ්‍රී ලංකා යුධ හමුදා ස්වේච්ඡා බළසේනාව යන්න සටහන්  කර ඇත.

තවද රිදී හාරිච්චි කටුවක සවිකල අඟල් එකකුත් භාගයක් පළලින් යුක්ත වූද නිල් කහ කලු සහ කොළ යන පාට සහිත තීරු ඒ අනුපිළිවෙළින් දෙපැත්තේ සිට මධ්‍ය දක්වා දිව එන්නාවූ ද මධ්‍යයෙහි ඉහළ සිට පහළට රන්වන් පාට තීරුවකින්ද යුක්ත වූද පීත්ත පටියකින් පපුවේ වම් පස එල්ලෙන පරිදී පදක්කම පැළඳිය යුතුවේ.

## පදක්කම සහ පීත්ත පටි පැළඳීම




අංක 4 - සම්මාන ඇඳුම



අංක 6 ඇඳුම හා අංක 6 ඒ ඇඳුම

## මිනිඒච(ර්)ස් පැළඳීම



බ්ලූස් - අංක 2 (1800 පැයෙන් පසු)    මෙස් ජැකට් - අංක 3

**පොත පත ඇසුරෙනි..........**

# ඉතිහාසය වනාහි මිනිසෙකුගේ ජීවිතය නැවත දක්වන කැඩපතකි



ඉතිහාසය වනාහි මිනිසෙකුගේ ජීවිතය නැවත දක්වන කැඩපතකි. එහි ප්‍රස්තුතය තුල (විෂය තුල) සුවිශාල වූ ක්‍රියා පද්ධතියක් දක්නට ලැබේ.

14 (සෙව්) ශ්‍රීලපාහ ඒකකය මූලික තිඹිරිගෙය තුල උපත ලද්දේ 1996 දෙසැම්බර් මස 30 වන දිනය. එනම් කයිට්ස් දූපතේ නව්‍යයතම මුහුණුවරක් ගනිමින් ශ්‍රීලංකා යුධ හමුදා පාබල රෙජිමේන්තුවේ ලාබාලම සාමාජිකයා ලෙස ශ්‍රී ලංකා යුධ හමුදාවට එක්විය.

දිනෙන් දින ප්‍රසාරණය වන මෙම ඉතිහාසය තුල ජීවත් වී එකී ඒකකය තුල පළමු අඩිතාලම දමන ලද්දේ ලුතිනන් කර්නල් එස්ඩබ්එම්ටීබී හුලුගල්ලේ ශ්‍රිලපාහ වන ජ්‍යෙෂ්ඨ නිලධාරියා විසිනි. ඉන් පසු මෙම ඉතිහාසයේ නියමුවා වූයේ ලුතිනන් කර්නල් ආර්එම්එම් රත්නායක ශ්‍රීලපාහ යන ජ්‍යෂ්ඨ නිලධාරි විසිනි. ඒ කයිට්ස් දූපතේ හැඩතල ඉතිහාසයට උරුමකම් පෑ නමුදු, මේ ඉතිහාස යාත්‍රාවේ නැවතත් නියමුවෙකු එකතු විය. එනම් දැනට 14 (සෙව්) ශ්‍රිලපාහ ඒකකයේ අණ දෙන නිලධාරි වශයෙන් කටයුතු කරන මේජර් වයිඑම් පුංචි බණ්ඩාර ආර්එස්පී ශ්‍රීලපාහ විසිනි.

ඉහත අතීතය තුළ මේ ඒකක යාපනයේ විවිධ ස්ථාන වල භෞමික අඛණ්ඩතාවය පවත්වා ගැනීමට සමත් විය. එකී ක්‍රියාවලිය ප්‍රතිරූපනය වන්නේ අණදෙන නිලධාරි, ජ්‍යෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරි, ජ්‍යෙකොනොනින් සහ සියළුම නිලයින්ගේ කැපවීම බව සාඩම්බරයෙන් මතක් කරන්නෙමු. කයිට්ස් දූපතේ වේලනි මහා විදුහල වෙත පැමිණීමෙන් පසු අධි ආරක්‍ෂක කලාපය වාසවිලාන් යාපනය වෙත නැවතත් එක්විය. මින් පසු මෙම ප්‍රදේශ රාජකාරී කොට 14 (සෙව්) ශ්‍රිලපාහ ඒකකය නැවත 2007.05.27 දින 513 බසේමු යටතේ අණ ලබමින් චුන්නාකම් ප්‍රදේශය තුළ රාජකාරී කිරීම ආරම්භ කරන ලදි.

14 (සෙව්) ශ්‍රිලපාහ ඒකකය චුන්නාකම් ප්‍රදේශය තුල රාජකාරී ආරම්භ කිරීමෙන් පසු කඳවුරු සංචාරය සඳහා 2007.08.10 දින කර්නල් සම්බන්ධී කරන නිලධාරි ලුතිනන් කර්නල් එම්එම් කුලතුංග ශ්‍රිලපාහ පැමිණි අතර මෙහිදී ජ්‍යෂ්ඨ නිලධාරීන් කඳවුරු සංචාරයේ පැමිණි පසු සටහන් තබන පොතෙහි එය සනිටුහන් කරන ලදි. මෙහි වත්මන් අණදෙන නිලධාරි මේජර් වයිඑම් පුංචි බණ්ඩාර ආර්එස්පී ශ්‍රීලපාහ පසෙකින් සිටී.

කෙසේ නමුදු එකී ඉතිහාසය තුල අපි තවමත් ජීවත් වනු ඇත. අතිතයත් වර්ථමානයත්, අනාගතයත්, සහ තෛකාලික ක්‍රියා තුල වරනගනු ඇත. (ජීවත් වනු ඇත. ) මෙහිදී ඒකක පැවැත්ම වෙනුවෙන් දිවි පිදූ සහ ආබාධිත නිලධාරි/සෙසු නිලයින් ගෞරවාන්විතව සිහිපත් කරමු. 'ඉතිහාසය නැමැති නැවට අප ගොඩවී හමාරය, ඔබ සුහදශීලී ලෙස බලන් ඉන්න අප තවමත් නොගිලී යාත්‍රා කරන තෙක්."

සැකසුම

**නි/6021 ලුතිනන් කේ අසිත ප්‍රභාත් එදිරිසිංහ ශ්‍රිලපාහ**

14 (සෙව්) ශ්‍රීලපාහ

# ගමරාලගේ වෙඩිල්ල වගෙයි

සාර්ථක නොවන මෝඩ වැඩක් යම් කෙනෙකු කරද්දී, එය ගමරාලගේ වෙඩිල්ල වගේ යැයි කියති. එම කතාව මෙසේය.

දිනක් ගමරාල ගම මහයියාවත් කැටුව දඩයමේ ගියේය. ගම මහගේ මෝඩ ගැහැණියකි. ඇය මීට පෙර මෙසේ දඩයමේ ගොස් නැත. ඇයට දඩයම තබා, තුවක්කුව පිළිබඳවත් හරිහැටි අවබෝධයක් නැත. දඩයමට සතෙකු පිළිබඳ විපරම් කරමින් දෙදෙනා මහ වනය තුළටම ආහ.

පඳුරු අතරින් එබිකම් කරද්දී, තඩි ඌරකු අල බිඳිමින් සිටිනු ගමරාල දුටුවේය. නිශ්ශබ්ද වන ලෙස ගම මහගේට ඉඟි කළ, ගමරාල තුවක්කුව ගෙන, ඌරාට එල්ල කලේය.

ගමරාලගේ තුවක්කුව වෙඩි බෙහෙත් කොටන, පැරණි එකකි. එය පත්තු වීමටනම් එය එල්ල කරගෙනසිටියදී තවකෙකු ගිනි පෙනෙල්ලකින් එයට ගිනි දැල්විය යුතුය.

දැන් ගමරාලගේ තුවක්කුව සූදානම්ය.

ගම මහගේ අත ගිනි පෙනෙල්ලකි. ගමරාල රහසින් අණ දුන්නේය.

"හරි .... දැන් ඕක කනේ තියහං "

අස අසා සිටීමට වෙලාවක් නොවේ. කිව් දෙය කළ යුතුය. ගම මහගේ ගිනිපෙනෙල්ල ගමරාලගේ කනේ එබුවාය. තුවක්කුවටද කනක් තිබෙන බව ගම මහගේ නොදනී. එය එහි ගිනි දල්වන තැනයි. ඌරා පැන යන බියට ගමරාල වේදනාව ඉවසාගෙන සිටියේය.ඔය කනේ නෙවෙයි ගෑණියේ අනෙක් කනේ. ඇසිපිය ගසන සැනින් ඇයගිනි පෙනෙල්ල ගමරාලගේ අනෙක් කනේ එබුවාය. ගමරාළ මරහඬ දෙන්නට විය. කෝපයෙන් ගම මහගෙට පහරදෙන්නට විය. කලබලය අස්සේ ඌරාද පැන දිවිය.



# අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික රයිෆල් තරඟාවලිය 2007

2007 වර්ෂයේ පැවති අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික රයිෆල් තරඟාවලිය මෙවර දියතලාව වෙඩි පිටියේදි 2007 සැප් 3 සිට 9 දක්වා ඉතා උණුසුම් අන්දමින් පැවැත්විණි. සියළු රෙජිමේන්තු විසින් ඉතා කැප විමෙන් පුහුණුවීම් ලබමින් තරඟාවලියට ඉදිරිපත් වූහ.මෙම තරඟාවලියේ විශේෂත්වයක්වූයේඒකකයක්තුළසියළුනිලධරයන් නියෝජනය කරමින් එකමුතු බව පිළිඹිඹු කරමින් කණ්ඩායම් හැඟුමින් තරඟ වැදීමයි. මෙම තරඟාවලියේ ආරම්භය වනුයේ කි.මී 9 දුරක් දිවීමෙන් පසු විවිධ ඉලක්කපත් වලට නියමිත කාල සීමාවක් තුළ වෙඩි තැබීමෙන්ය.

පැවති තරඟාවලිය සඳහා සියළු රෙජිමේන්තු විසින් විවෘත හා ආධුනික වශයෙන් තරඟ කණ්ඩායම් ඉදිරිපත් කළ අතර විවෘත අංශයේ කණ්ඩායම් 5 ක් ආධුනික අංශයේ කණ්ඩායම් 8 ක් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව අප රෙජිමේන්තු කණ්ඩායම ආධුනික අංශයේ ඉදිරිපත් වී ලකුණු 1349 ක් ලබා ගනිමින් සිව්වන ස්ථානය හිමි කරගැනීමට සමත් වූ අතර තවද ආධුනික අංශයෙන් දක්‍ෂතම වෙඩි කරුවා ලෙස ලකුණු 250 න් 220ක් ලබාගනිමින් 2007 වර්ෂයේ අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික රයිෆල් තරඟවලියේ ආධුනික අංශයේ කුසලානය **සෙ/5ඞ්02578 සාසෙ විජේරත්න ජීඑච්ජී** විසින් අප රෙජිමේන්තුව වෙත ලබා දෙන ලදි එසේම තරඟාවලියට ඉදිරිපත්වූ නිලයන් විසින් ඉතා දක්‍ෂ ලෙස තරඟ වදිමින් තම නිලයේ /පළ වන /දෙවන/තුන්වන/ ස්ථාන හිමි කර ගැනීමටද සමත්විය.

**කපිතන් නිලයේ - දෙවන ස්ථානය**
කපිතන් ඩීඑම්ආර්සීඑල් දිසානායක ශ්‍රීලපාහ

**2 ලුතිනන් නිලය - දෙවන ස්ථානය**
2/ ලුතිනන් ඩබ්ලිව්බීඅයි කුමාර ශ්‍රීලපාහ

**බනි II නිලය - තුන්වන ස්ථානය**
බනි II රංජිත් කේඩීඩී

**කෝප්‍රල් නිලයේ - දෙවන ස්ථානය**
කෝප්‍රල් කෝසල සෙනරත්. කේකේඩබ්ලිව්

**ලා / කෝප්‍රල් නිලයේ - දෙවන ස්ථානය**
ලා /කෝප්‍රල් නන්දසේන ජී

**සාසෙ නිලයේ - ප්‍රථම ස්ථානය**
සාසෙ විජේරත්න ජීඑච්ජී

**මෙම තරඟයට ඉදිරිපත් වූ අප රෙජිමේන්තු කණ්ඩායම**

| | |
|---|---|
| නි/2870 | මේජර් ඩබ්ලිව්පීආර් විජේරත්න ශ්‍රීලපාහ |
| නි/62153 | මේජර් කේඩබ්ලිව්එම් බණ්ඩාර ශ්‍රීලපාහ |
| නි/65038 | කපිතන් ඩීඑම්ආර්සීඑල් දිසානායක ශ්‍රීලපාහ |
| නි/65680 | ලුතිනන් ඒබීජ්කේඅයිකේ බෝගොඩ ශ්‍රීලපාහ |
| නි/65229 | 2/ලුතිනන් ඩබ්ලිව්බීආර් කුමාර ශ්‍රීලපාහ |
| සෙ/11945 | බනි 11 රංජිත් කේඩීඩී |
| සෙ/14651 | වර්ණ සැරයන් විජේනායක එන්ඩීආර් |
| සෙ/2ඞ්02921 | කෝප්‍රල් කෝසල සෙනරත් කේකේඩබ් |
| සෙ/316908 | ලා/කෝප්‍රල් නන්දසේන ජී |
| සෙ/5ඞ් 02578 | සාසෙ විජේරත්න ජීඑච්ජී |

එසේම මෙම ඉහත සඳහන් කළ සියළු ජයග්‍රහණ ලබා ගැනීම සඳහා අප රෙජිමේන්තු සේනාවිධායක කර්නල් ඩබ්ලිව් වීරක්කොඩි ගේ මූලික අධීක්‍ෂණය යටතේ මේජර් හේරත් ගේ මූලික මෙහෙයවීම මත රෙජිමේන්තු කණ්ඩායම හට ධෛර්‍ය ලබාදීම තුලින් 2007 වර්ෂයේ රෙම ශ්‍රිලපාහ වෙඩි තැබිමේ අංශයේ නව පිබිදීමක් ඇති වූ බව කාටත් නොරහසකි.

## අන්තර් රෙජිමේන්තු ප්‍රායෝගික රයිෆල් තරඟාවලිය

2007 වර්ෂයේ අන්තර් රෙජිමේන්තු ප්‍රායෝගික රයිෆල් තරඟය 2007 අගෝස්තු මස 02 සිට 09 දක්වා දියතලාව වෙඩි පිටියේදී පවත්වන ලදි මෙම තරඟාවලිය සඳහා සියළු රෙජිමේන්තු විසින් විවෘත තරඟ කණ්ඩායම 4ක් හා ආධුනික තරඟ කණ්ඩායම් 07 ක් ඉදිරිපත් කරන ලදි. මෙම තරඟාවලියට ඉදිරිපත් වූ අප රෙම කණ්ඩායම ඉතා උද්යෝගයෙන් හා උනන්දුවෙන් තරඟ වැදුනු අතර මෙම තරඟාවලිය තරඟ අදියර 6 කින් පැවතුණු අතර 2007 වර්ෂය ආධුනික අංශයේ දෙවන ස්ථානය ලකුණු 1916.26 ලබා ගැනීමෙන් අප රෙජිමේන්තු කණ්ඩායම හිමිකරගන්නා ලදි.

**මෙහි තරඟ වැදුණු සාමාජිකයෝ**

| | | |
|---|---|---|
| නි/64600 | කපිතන් ආර්පීඑස් පතිරණ ශ්‍රීලපාහ | 6 ශ්‍රීලපාහ |
| නි/65038 | කපිතන් ඩීඑම්ආර්සීඑල් දිසානායක ශ්‍රීලපාහ | 4 ශ්‍රීලපාහ |
| සෙ/13670 | බනි II හේරත් එච්එම්ජීබී | 6 ශ්‍රීලපාහ |
| සෙ/14651 | ව/සැර විජේනායක එන්ඩීආර් | 1 ශ්‍රීලපාහ |
| සෙ/309932 | කෝප්‍රල් ලසන්ත ජීකේඑච්එම් | 4 ශ්‍රීලපාහ |
| සෙ/14863 | කෝප්‍රල් ලන්සක්කාර එච්ජ්එස් | 4 ශ්‍රීලපාහ |
| සෙ/312564 | ලා/කෝප්‍රල් වික්‍රමපාල එච්ඩබ්ලිව්ජ් | 1 ශ්‍රීලපාහ |
| සෙ/5ඞ්02578 | සාසෙ විජේරත්න ජීඑච්ජී | 5 (සෙව්) ශ්‍රීලපාහ |

**මෙම තරඟාවලියෙ ආධුනික අංශය රෙජිමේන්තු හිමිකරගත් ස්ථාන අතරට**

| | | | |
|---|---|---|---|
| රෙම ගැහේබ | ලකුණු | 2244.92 | - පලවන |
| රෙම ශ්‍රිලපාහ | ලකුණු | 1916.26 | - දෙවන |
| රෙම ගරෙ | ලකුණු | 1834.65 | - තුන්වන |
| රෙම විපාරෙ | ලකුණු | 1721.14 | - සිව්වන |
| රෙම ශ්‍රීලංඉ | ලකුණු | 1651.21 | - පස්වන |
| රෙම ශ්‍රීලයුසේබ | ලකුණු | 1392.32 | - සය වන |
| රෙම ශ්‍රීලයුකාබ | ලකුණු - | 310.77 | - සත් වන |

**කපිතන් ඩීඑම්ආර්සීඑල් දිසානායක ශ්‍රීලපාහ**
වෙඩි තැබීමේ අංශය

# 1 වන ශ්‍රී ලංකා

# 57 වනු



කඳවුරේ ප්‍රධාන දොරටුව අභියසදී 2 වන අණදෙන නිලධාරී විසින් අණදෙන නිලධාරී තුමා පිළිගැනීම



අණදෙන නිලධාරී තුමා විසින් ඒකක හටපිරිස් ඇමතිම

ශ්‍රී ලංකා යුධ හමුදා නිත්‍ය බළසේනාවේ ප්‍රථම පාබල බළඇණිය වශයෙන් පෞඩ ඉතිහාසයකට උරුමකම් කියන 1 වන ශ්‍රී ලංකා පාබල හමුදාව සිය අභිමානවත් 57 වන සංවත්සරය යාපනය , එළුදුමඩිඩුවාල් කඳවුරු මූලස්ථානයේදී 2007 මැයි මස 12 වන දින සමරනු ලැබීය.

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යට යටත් විජිතයක්ව පැවැති සමයේ එනම් 1881 වර්ෂයේදී ලංකා පාබල රෙජිමේන්තුව බ්‍රිතාන්‍ය සන්නද්ධ සේවයෙහි කොටසක් වශයෙන් පිහිටවන ලදී. මෙදින සිට 1948 පෙබරවාරි මස 04 වන දින දක්වා ශ්‍රී ලංකාව නිදහස් රාජ්‍යයක් වන තෙක් එලෙස පැවැති අතර , නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකා යුධ හමුදාවේ ප්‍රධාන කොටසක් හා රෙජිමේන්තුවක් වූ ශ්‍රී ලංකා පාබල හමුදාව බිහිවිය. එහි පලමු අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් එච්ඩබ්ජී විජේකෝන් ඕබීඊ,ඊඩී ලපාහ පත්කරන ලදී.

මෙම ඒකකය 1 වන බළඇණිය ලංකා පාබල හමුදාව වශයෙන් 1950 වර්ෂයේ නම් කරන ලද අතර , ප්‍රථම නියෝග 1 වන කොටස 1952 ක් වූ මැයි මස 12 වන දින පල කරන ලද බැවින් එදින බළඇණි සංවත්සර දිනය වශයෙන් සලකනු ලැබීය.

ඉන් අනතුරුව , මේ දක්වා රට තුල පැවැති සෑම අරගලකාරී තත්ත්වයක්ම මැඩ පැවැත්වීම සඳහා මෙම බළඇණියේ සෙබලුන් දිවි හිමියෙන් කටයුතු කර දේශයේ භෞමික අඛණ්ඩතාවය රැක ගැනිම සඳහා කටයුතු කරන ලදි. මෙලෙස මෙම ඒකකයේ නිලධාරීන් හා සෙසුනිලයින් විසින් තම දේශය වෙනුවෙන් සිදුකල ගෞරවනිය සේවයට ඇගයීමක් වශයෙන් 1954 අප්‍රේල් 21 වන දින බ්‍රිතාන්‍යයේ 11 වන එලිසෙබෙත් මහ රැජිණ විසින් රැජිණ වර්ණ සහ රෙජිමේන්තු වර්ණ පිරිනමන ලදී. 1955 පෙබරවාරි මස 09 වන දින 1 වන ලංකා පාබල හමුදාවේ අණදීම ලුතිනන් කර්නල් පිආර් හයින් භාරගන්නවාත් සමගම ශ්‍රී ලංකා යුධ හමුදාවේ නව පරිච්ඡේදයක් ආරම්භ කරමින් ශ්‍රී ලංකා යුධ හමුදාවේ යුධ හමුදාපති ධුරයට මෙම ඒකකයේ නිලධාරියෙකු වූ කර්නල් එච්එම් මුතුකුමරු ඕබීඊ, ඊඩී, ඒඩීඊ, අයිඩීසී, පත්වුයේ එම තනතුරට පත් ප්‍රථම ලාංකිය නිලධාරියා ලෙස ඉතිහාසයට එක් වෙමිනි 1978 ඔක්තොම්බර්10 වන දින අතිගරු ජනාධිපති ජේආර් ජයවර්ධන මැතිතුමා විසින් " ජනාධිපති වර්ණ හා රෙජිමේන්තු වර්ණ "පිරිනමමින් දේශයේ ගෞරවය මෙම අභිමානවත් බළඇණිය වෙත පිරිනමින ලදී.

| නම | කාලසිමාව | |
|---|---|---|
| | සිට | දක්වා |
| ලුතිනන් කර්නල් එච්ඩබ්ජී විජේකෝන් ඩබ්ලිව්ඊ ඊඩී | 1950.05.12 | 1953.12.31 |
| කර්නල් ඊඑම් මුතුකුමාර ඩබ්ලිව්ඊ ඊඩී ඒඩීසී ඩීසී | 1954.01.01 | 1955.02.08 |
| ලුතිනන් කර්නල් බීආර් හයින් | 1955.02.09 | 1959.11.14 |
| කර්නල් ඊආර් උඩුගම එම්බීඑම් | 1959.11.15 | 1962.11.30 |
| කර්නල් ඊඑම් ජයවීර | 1962.12.01 | 1965.11.04 |
| ලුතිනන් කර්නල් ඊඩී ද ඉසෙඩ් අබේසේකර | 1965.11.05 | 1969.02.10 |
| ලුතිනන් කර්නල් ඒපිආර් ඩේවිඩ් යූඑස්පි වීඑස්වී පිඑස්සි | 1969.02.11 | 1970.07.14 |
| ලුතිනන් කර්නල් එච්ඩබ් අතුකෝරාල වීඑස්වී පිඑස්සි බීඅයිවී එෆ්එම් | 1970.07.15 | 1976.02.29 |
| කර්නල් සීඒඑම්එන් සිල්වා | 1976.03.01 | 1978.10.15 |
| ලුතිනන් කර්නල් එස්එම්ඒ ජයවර්ධන පිඑස්සි | 1979.05.01 | 1981.01.14 |
| ලුතිනන් කර්නල් ටීඑම්ඒ රජුඩීන් | 1981.01.15 | 1982.04.04 |

| නම | කාලසිමාව | |
|---|---|---|
| | සිට | දක්වා |
| ලුතිනන් කර්නල් එම්ඩබ් පොන්නම්පෙරුම | 1982.04.04 | 1983.08.22 |
| ලුතිනන් කර්නල් ඩීඑස් කරුණාරත්න පීඑස්සි | 1983.08.23 | 1984.06.10 |
| ලුතිනන් කර්නල් එම්ඒඑච් සෙනෙවිරත්න | 1984.06.10 | 1986.07.31 |
| ලුතිනන් කර්නල් ඒකේ ජයවර්ධන | 1986.08.01 | 1987.12.31 |
| ලුතිනන් කර්නල් සිඑල් විජේරත්න පිඑස්සි එම්බීඅයිඑම් | 1988.01.01 | 1988.08.08 |
| ලුතිනන් කර්නල් පීටීටී රණවීර | 1988.08.09 | 1991.01.31 |
| ලුතිනන් කර්නල් ටීටී ආර්ද සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී | 1991.01.31 | 1994.03.10 |
| ලුතිනන් කර්නල් එච්ඩබ් හේවාආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී | 1994.03.16 | 1997.07.25 |
| මේජර් ආර්ඒඑන් ද අල්විස් ආර්එස්පී | 1997.07.25 | 2000.08.25 |
| ලුතිනන් කර්නල් එම්ඒඑම්අයි මුණසිංහ ආර්එස්පී | 2000.08.25 | 2004.10.04 |
| ලුතිනන් කර්නල් කේජේ ජයවීර ආර්එස්පී | 2004.10.04 | 2006.04.24 |
| ලුතිනන් කර්නල් කේඩබ්ආර් ද ආබ්‍රෙව් ආර්එස්පී පිඑස්සි | 2006.04.24 | මේ දක්වා |

## අන්තර් රෙජිමේන්තු කබඩ් තරඟාවලිය - 2007 ශූරතාවය දිනූ ශ්‍රීලපාහ කණ්ඩායම



# පාබල හමුදාවේ සංවත්සරය



බෝධි පුජාමය පිංකම

යාපනය අර්ධද්වීපය තුල ද්‍රවිඩ සන්නද්ධ අරගලය ක්‍රමයෙන් වර්ධනය වීමත් සමග මෙම ඒකකය එම ප්‍රදේශයේ අභ්‍යන්තර ආරක්ෂක රාජකාරීන්හි නිතරවන ලදි එහිදී 1983 ජුලි මස 23 වන දින යාපනයේ තිරුණවේලි ප්‍රදේශයේදි වාහන මුර සංචාරයකට ත්‍රස්ථවාදීන් විසින් රැකසිට ප්‍රහාරයක් එල්ල කරන ලදි. මෙම ප්‍රහාරයෙන් නිලධාරීන් 01 ක් සහ සෙසුනිලයින් 12 දෙනෙකු ජීවිතක්ෂයට පත්වන ලදි. එම ප්‍රහාරය මෙම කුරිරු යුද්ධයේ ප්‍රධාන සංධිස්ථානයක් වු අතර , එය දකුණේ සිංහල ජනතාව කුපිත කල ජාතිවාදි අරගලයක් දක්වා ව්‍යාප්ත වන ලදි. එතැන් සිට මේ දක්වා මෙම ඒකකය දේශයේ භෞමික අඛණ්ඩතාවය රැක ගැනිම සඳහා දිවි හිමියෙන් කටයුතු කර ඇත. එදා මෙදා තුර සටනේදි දේශයේ ස්වෛරීභාවය, ස්වාධිපත්‍යය, භෞමික අඛණ්ඩතාවය, රැකිම වෙනුවෙන් සිදුකල ක්‍රියාන්විතයේදි නිලධාරි 25 ක්ද සෙසුනිලයින් 556 ක්ද තම ජිවිතය ශ්‍රී ලාංකිය ජනතාවගේ හෙට දවස වෙනුවෙන් පුජා කර ඇති අතර , නිලධාරි 36 ක්ද සෙසුනිලයින් 1175 ක්ද තුවාල ලබා ඇත. ඒකකය , රෙජිමේන්තුව , ශ්‍රී ලංකා යුද හමුදාව වෙනුවෙන් පොදුවේ රටේ ආරක්ෂාවට තම ජිවිතය , රුධිරය පුජා කිරීම වෙනුවෙන් ඔවුන්ව බළඇණියේ සියළුම නිලධාරි/සෙසුනිලයින් විසින් මහත් භක්තියෙන් යුතුව මේ වැදගත් අවස්ථාවේ සිහිපත් කරමි.

මෙම බළඇණිය 2006 අගෝස්තු මස ආසේමු (යා) බළප්‍රදේශය තුලට එල්ල වු ත්‍රස්ථවාදි ප්‍රහාරය ආරම්භයේ සිට එනම්, 2006.08.14 වන දින සිට මේ දක්වා මුහමාලේ ඉදිරි ආරක්ෂක වළල්ලෙහි ස්ථානගතවී ක්‍රියාන්විත රාජකාරීන් ඉටු කරනු ලබයි. යුධමය වාතාවරණයක් තුල සිය 57 වන බළඇණි සංවත්සරය සමරන මෙම ඒකකය ආගමික වතාවත් සහ ක්‍රිඩා කටයුතු සඳහා මුල්තැන දෙමින් ඉතා චාම් අයුරින් සමරන්නට යෙදුණි.

2007 මැයි මස 11 වන දින සියළු කණ්ඩායම් නියෝජනය කරමින් පැවති ක්‍රිකට් තරඟාවලියේ අවසන් තරඟය ඒකකයේ අණදෙන නිලධාරි තුමාගේ සහභාගිත්වයෙන් පවත්වන්නට යෙදුන අතර , එහිදි ඩී කණ්ඩායම අනු ශූරතාවයත්, ඒ කණ්ඩායම ශූරතාවයත් දිනා ගන්නා ලදි. එදිනම සවස බෝධි පුජාමය පිංකමක් පවත්වා අප බළඇණියේ සේවය කරමින් සිටියදි මියගිය නිලධාරි /සෙසුනිලයින් හා සිවිල් සේවක මහතුන් හට පුණ්‍යානුමෝදනා කිරීමටත් යුද්ධයේදි තුවාල වු / ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමටත් දැනට ක්‍රියාන්විත සේවයේ යෙදි සිටින සියළුම නිලයන් හට ආශිර්වාද කිරීමත් කලේ ඉමහත් බැතියෙනි.

2007 මැයි මස 12 වන දින නිලධාරීන් හා සෙසුනිලයින් ඒකකයේ වත්මන් අණදෙන නිලධාරි තුමන් හට සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනමන ලදි. එහිදි අණදෙන නිලධාරි විසින් සියළුම නිලයන් අමතන ලදි. ඉන්පසු සියලුම නිලයන් සඳහා තේ පැන් සංග්‍රහයක් පිළියෙල කර තිබු අතර , සියළු කණ්ඩායම් නියෝජනය වන පරිදි එහි පැමිණි නියෝජිතයින් විසින් එය භුක්ති විදින ලදි. ඉන්පසු අන්තර් කණ්ඩායම් අත්පන්දු තරඟාවලියේ අවසන් තරඟය පවත්වන්නට යෙදුනි. එහිදී අනු ශූරතාවය ''ඒ'' කණ්ඩායමද, ශූරතාවය ''ඩී'' කණ්ඩායමටද හිමිවිය. ත්‍යාග සහ සහතිකපත් අණදෙන නිලධාරි, දෙවන අණදෙන නිලධාරි හා කණ්ඩායම් නිලධාරි අණදෙන වරුන් සහ රෙජිමේන්තු සැරයන් මේජර් විසින් පිරිනමන ලදි.

එදිනම සවස " නගර්කෝවිල් " කෝවිලේදි ආගමික වතාවත් පවත්වන්නට යෙදුණු අතර , එහිදි සියළු නිලයින් හට සෙත් පැතිම සිදු කරන ලදි. සමස්ථ යක් වශයෙන් මෙම උත්සව මාලාවට සමගාමීව ශ්‍රී දළදා මාලිගාවේදි බළඇණි ධජයට හා කණ්ඩායම් ධජ වලට සෙත් පැතිමක් සහ මහනුවර සතරමහා දේවාල භූමියේදි පුජාවන් සිදුකරමින් බළඇණියේ සේවය කරමින් සිටියදි මියගිය නිලධාරි / සෙසුනිලයින් හා සිවිල් සේවක මහතුන් හට පුණ්‍යානුමෝදනා කරමින් " **සේවය කරමි** " යන ආදර්ශ පාඨය තවදුරටත් සිරස මතින් ගෙනයමින් 57 වන සංවත්සරයේ උත්සව කටයුතු දැනට ක්‍රියාන්විතයේ යෙදි සිටින සියළුම නිලයන් හට ආශිර්වාද කරමින් නිමාවට පත්විය.

සියළු නිල දිවා භෝජන සංග්‍රහය



සැකසුම :-
බුද්ධි අංශය 1 ශ්‍රීලපා

ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා තරඟාවලිය 2007 ශූරතාවලිය හිමිකරගත් ශ්‍රීලපාහ කණ්ඩායම



# 2007 ස්වේච්ඡා බළසේනා
# අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා ශූරතාවලිය
## ශ්‍රී ලංකා පාබල හමුදාව සතු වූ වගයි

යුධ හමුදා ස්වේච්ඡා බළසේනාව විසින් සංවිධානය කරනු ලැබූ 2007 ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රිඩා ශූරතා තරඟාවලිය 2007 ජූලි මස 30 දින සිට 2007 අගෝස්තු මස 01 දින දක්වා සුගතදාස ජාත්‍යන්තර ක්‍රීඩාංග නයේදී උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි. යුධ හමුදා ස්වේච්ඡා ඒකකය සියල්ල සම්බන්ධ කරගනිමින් ඔවුන්ගේ ක්‍රීඩා දක්‍ෂතාවයන් වර්ධනය කර ගැනීමටත් රටේ පවත්නා යුධමය වාතාවරණයට ස්වේච්ඡා සෙබළුන් ලබාදෙන්නාවූ දායකත්වයත් නිසා ඔවුන් සිත් තුළ ඇතිවන ඒකාකාරී බවින් මිදී චිත්ත ශක්තිය වර්ධනය කිරීමත් තවද ඔවුන්ගේ දක්‍ෂතාවයන් වර්ධනය කර ගැනීම තුලින් ජාතික හා ජාත්‍යන්තර තලය වෙත ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොමු කිරීම තුලින් පොදුවේ යුධ හමුදාවටත් කීර්තියක් අත්කර දීම මෙහි මූලික අරමුණ වී තිබිණ.

මෙර තරඟාවලිය සඳහා (සෙව්) බළසේනා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 600 කට අධික ප්‍රමාණයකගේ සහභාගීත්වයෙන් පැවති මෙම තරඟාවලිය සඳහා එක් එක් රෙජිමේන්තු වෙතින් ඉතා දක්‍ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් සමන්විත කණ්ඩායම් ඉදිරිපත් කර තිබූ අතර අප රෙජිමේන්තු වෙතින්ද මනා පුහුණුවකින් පසු දක්‍ෂ කණ්ඩායමක් ඉදිරිපත් කරන ලදි. එමඟින් මෙවර බලාපොරොත්තු වූයේ මළල ක්‍රීඩා ශූරතාවය දිනා ගැනීමයි.

යුධ හමුදා ඉතිහාසයේ තුල 60/70 දශකයන් තුළ ක්‍රීඩා ක්‍ෂේත්‍රයේ ඉදිරියෙන් සිටීමට ශ්‍රිලපාහ අප රෙජිමේන්තු ක්‍රීඩකයින් සමත් වී ඇති අතර පසුකාලීනව හට ගත් වර්ගවාදී යුද්ධය හේතුවෙන් ඒ සඳහා දායකත්වය ලබාදීමට අප රෙජිමේන්තුව වෙත පැවරීමත් සමග ක්‍රීඩා ක්‍ෂේත්‍රය යම් යම් පසුබෑමකට ලක්වන ලදි. මෑත කාලයේදී මළල ක්‍රීඩාවෙන් යුධ හමුදාවේ වැඩි ගෞරව දිනාගන්නා ලද්දේ කාලතුවක්කු රෙජිමේන්තු වන අතර සේවා බළකායද ඔවුනට අභියෝගයක් විය ඒ අනුව ශ්‍රීලපාහ ක්‍රීඩකයෝ යුධ හමුදාව තුල මළල ක්‍රීඩා ආධිපත්‍ය දරමින් සිටි කාලතුවත්තු රෙජිමේන්තුව පසුපසට ඇද දමමින් අන්තර් රෙජිමේන්තු (සෙව්) බළසේනා මළල ක්‍රීඩා ශූරතාවය මෙවර ශ්‍රීලපාහ රෙජිමේන්තුව දිනා ගන්නා ලදි. සැබැවින්ම එය වසර විසිපහකට පසුව අප රෙජිමේන්තු මළල ක්‍රීඩාව තුලින් ශූරතාවයක් දිනාගත් ප්‍රථම අවස්ථාව මෙය වීම සුවිශේෂයි. තවද එයට සමගාමීව පැවති කඹ ඇදීමේ කිංග්‍රෑ 480 ශූරතාවයද, ඉතාමත් තියුණු තරඟයකින් පසු තරඟවට 2/1 ලෙස කාලතුවක්කු හමුදා කඹ ඇදීමේ කණ්ඩායම පරාජය කළ අප රෙජිමේන්තු කණ්ඩායම කඹ ඇදීමේ ශූරතාවය ද දිනාගන්නා ලදි. සැබැවින්ම එය අප ක්‍රීඩකයන්ට මෙන්ම සියලු දෙනාටම සුවිශේෂී දිනයකි.

### තරඟාවලියේ පදක්කම් ලාභීන්

| | | | | |
|---|---|---|---|---|
| 2(සෙව්)ශ්‍රීලපාහ | සෙ/2ඩී03320 ලාකෝ | රණසිංහ පීජීඑස් | 400කඩුළු | රන් |
| | සෙ/2ඩී03321 ලාකෝ | චතුරංග ඊබීආර් | හෙල්ල | රන් |
| | සෙ/2ඩී03330 ලාකෝ | මහේෂ් ඩබ්ලිව්එම්එස් | 800 | රිදී |
| | සෙ/2ඩී03393 ලාකෝ | විජේසූරිය එම්ඩබ්ලිව්සී | 200 | රන් |
| | සෙ/2ඩී03393 ලාකෝ | විජේසූරිය එම්ඩබ්ලිව්සී | 100 | රන් |
| 5(සෙව්)ශ්‍රීලපාහ | සෙ/5ඩී02667 සාසෙ | නිශාන්ත පීකේජී | හෙල්ල | රිදී |
| | සෙ/5ඩී02535 සාසෙ | සෙනෙවිරත්න ඒපීටීපී | රිටිපැනීම | ලෝකඩ |
| | සෙ/5ඩී02665 සාසෙ | කරුණාරත්න ඩබ්ලිව්එම් | 400කඩුලු | ලෝකඩ |
| 9(සෙව්)ශ්‍රීලපාහ | සෙ/9ඩී01381 සාසෙ | ජයතිස්ස ඒආර්පීකේ | දුරපැනීම | රිදී |
| 14(සෙව්)ශ්‍රීලපාහ | සෙ/14ඩී01057 කෝප්‍රල් | අජන්තන් එම් | 5000 | රන් |
| | සෙ/14ඩී01057 කෝප්‍රල් | අජන්තන් එම් | 10000 | රන් |
| | සෙ/14ඩී01056 කෝප්‍රල් | සමන් බණ්ඩාර පීජීජී | 400 | රිදී |
| | සෙ/14ඩී01058 සාසෙ | හිටිගෙදර ඒබී | 3000 බාධක | රිදී |
| | සෙ/14ඩී01048 ලාකෝ | ජයසිංහ ඊජී | 3000 බාධක | රන් |
| | සෙ/14ඩී01104 සාසෙ | අබේනායක කේඑල්එම්පී | 110 කඩුලු | රන් |

| | |
|---|---|
| 100 x 4 සහය දිවීම | රන් |
| 200 x 4 සහය දිවීම | රන් |
| 400 x 4 සහය දිවීම | රිදී |
| 800 x 4 සහය දිවීම | රිදී |
| මිශ්‍ර සහය දිවීම | රිදී |


## ගිලිහි ගිය අභිමානය නැවත රැගෙන ආ ශ්‍රිලපාහ එල්ලේ ක්‍රීඩකයෝ

යුධ හමුදා එල්ලේ කමිටුව විසින් සංවිධානය කරනු ලබන 2007 අන්තර් රෙජිමේන්තු එල්ලේ තරඟ මාලාව පසුගිය ජූනි මස 11 වන දින රෙම ශ්‍රිලකාහ ක්‍රීඩාංගනයේදී ආරම්භ කරන ලදි. මෙවර තරඟාවලිය සඳහා රෙජිමේන්තු කණ්ඩායම් 09 ක් ඉදිරිපත් වී සිටි අතර, තරඟාවලිය ලීග් ක්‍රමය යටතේ පැවැත්වීමට සංවිධායකයින් කටයුතු කර තිබිණ.එම තරඟාවලියේ ප්‍රථම තරඟය සඳහා අප රෙජිමේන්තු එල්ලේ කණ්ඩායම හා ශ්‍රිලයුසේබ කණ්ඩායමයි. එම තරඟ ඉනිමක හා ලකුණු 06

කින් ජයගත් ශ්‍රීලපාහ කණ්ඩායම දෙවන තරඟය සඳහා හමුවූයේ ගියවර අන්තර් රෙජිමේන්තු එල්ලේ ශූරතාවය දිනාගත් ශ්‍රීලයුපොදුසේබ කණ්ඩායමයි. නොකඩවා වසර තුනක් අන්තර් රෙජිමේන්තු එල්ලේ ශූරතාවය දිනාගත් ශ්‍රීලපාහ කණ්ඩායම පසුගිය වසරේ අර්ධ අවසන් තරඟයේදී ශ්‍රීලයුපොදුසේබ කණ්ඩායම හමුවේ තියුණු තරඟයකින් පසු පරාජයට පත්විය. මෙවරද ප්‍රථම වටයේ තරඟයෙන් ශ්‍රීලයුපොදුසේබ කණ්ඩායම ජයග්‍රහණය කරන ලදි.අනෙක් තරඟ වශයෙන් පැවතියේ ශ්‍රීලකාහ කණ්ඩායම අතර තරඟයයි. එම තරඟයෙන් ජයගත් අප රෙජිමේන්තු "ඒ" කාණ්ඩයෙන් දෙවන ස්ථානයට පත්වූ අතර ප්‍රථම ස්ථානයට පත්වූයේ ශ්‍රීලයුපොදුසේබ කණ්ඩායමයි. "බී" කාණ්ඩයේ ප්‍රථම ස්ථානයේ ශ්‍රීලංජාආබමු කණ්ඩායම පත්වූ අතර එහි දෙවන ස්ථානයට ශ්‍රීලයුසේබ කණ්ඩායම පත්වන ලදි.ඒ අනුව ප්‍රථ ම අර්ධ අවසන් තරඟය රෙම ශ්‍රීලයුපොදුසේබ කණ්ඩායම හා රෙම ශ්‍රීලයුසේබ කණ්ඩායම අතර පවත්වන ලදි. ඒ අනුව ප්‍රථම අර්ධ අවසන් තරඟය රෙම ශ්‍රීලයුපොදුසේබ කණ්ඩායම හා රෙම ශ්‍රීලයුසේබ කණ්ඩායම තරඟ වැදි අතර එයින් පහසු ජයග්‍රහණයක් ශ්‍රීලයුපොදුසේබ කණ්ඩායම දිනා ගන්නා ලදි.

දෙවන අර්ධ අවසන් තරඟය අප රෙජිමේන්තු කණ්ඩායම රෙම ශ්‍රීලංජාආබමු කණ්ඩායම අතර පැවැත්විණි. එයින් ඉතිමක හා ලකුණු 04 පහසු ජයග්‍රහණයක් ලබාගත් අප රෙජිමේන්තු එල්ලේ කණ්ඩායම අවසන් මහා තරඟය සඳහා සුදුසුකම් ලබාගත්හ. ඒ අනුව 2007 ජූනි මස 20 වන දින රෙම ශ්‍රීලකාහ ක්‍රීඩාංගනයේදී උදෑසන 1100 පැයට අවසන් තරඟය ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් පැමිණි යුධ හමුදා එල්ලේ කමිටු සභාපති බ්‍රිගේඩියර් ටීඑෆ් මිඩින් ආර්එස්පී එල්ඩීඑම්අයි විසින් විනිසුරුවන් හා ක්‍රීඩකයින් හඳුනාගැනීමෙන් අනතුරුව තරඟය ආරම්භ කරන ලදි. ඒ අනුව කාසිය වාසිය දිනාගත් රෙම ශ්‍රීලපාහ කණ්ඩායම් නායක කෝප්‍රල් පෙරේරා එච්ජ්ජ්සීඑන් විසින් ප්‍රථ මයෙන් පන්දුවට පහර දීම සඳහා පිටියට පිවිසි අතර ඒ අනුව ඉතාමත් දිගු වේලාවක් පන්දුවට පහර දෙමින් සියළුම ක්‍රීඩකයින් දූවී ලකුණු 15 ක් ලබා ගත් අතර එයට පිළිතුරු වශයෙන් ශ්‍රීලයුපොදුසේබ ක්‍රීඩකයින් ලකුණු 13 ක් ලබා ගන්නා ලදි. කෙටි විවේකයකින් පසු නැවත දෙවන වටය ආරම්භ වූ අතර එහිදී ශ්‍රීලපාහ කණ්ඩායම ලකුණු 12 ක් ලබාගත් අතර ජයග්‍රහණය සඳහා ශ්‍රීලයුපොදුසේබ කණ්ඩායමට ලකුණු 15 ක් ලබාගත යුතුව තිබුණි. එහිදී දක්ෂ පන්දු රැකීමක නිරතවූ ශ්‍රීලපාහ ක්‍රීඩකයෝ සුපුරුදු දක්ෂතා පෙන්නුම්






කරමින් ප්‍රතිවාදී කණ්ඩායම ලකුණු 09 කට සීමා කරමින් 2007 වසරේ අන්තර් රෙජිමේන්තු එල්ලේ ශූරතාවය දිනාගන්නා ලදි. ඇත්තෙන්ම එය පසුගිය වසරේ අප රෙජිමේන්තුවෙන් ගිලිහී ගිය කුසලානය නැවත දිනා ගැනීමකි. දෙපිලෙම විශාල නිලධාරි/ සෙසුනිල සංඛ්‍යාවක් දිරිගන්වන්නන් ලෙස සහභාගී වූයේ තම රෙජිමේන්තු ජයග්‍රහණය කිරීමේ අරමුණිනි. ක්‍රීඩා ශූරතාවයන් එක දිගටම පවත්වා ගැනීම ඉතා අපහසු කටයුත්තකි. කෙසේ වෙතත් මනා පුහුණුවකින් ප්‍රතිසංවිධානය වූ ශ්‍රීලපාහ එල්ලේ කණ්ඩායම 2007 වසරේ ශූරතාවය දිනා ගන්නා ලද්දේ හතරවන වතාවටය. තරඟාවලිය පුරාවට දස්කම් දැක්වූ ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ **සෙ/302052 සාසෙ චන්ද්‍රජීව පීජ්චන්** දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය දිනා ගන්නා ලදි.

## ශූරතාවය දිනාගත් ශ්‍රීලපාහ එල්ලේ කණ්ඩායම

| | | | |
|---|---|---|---|
| සෙ/13327 | බනි 11 | ජයවික්‍රම | ආර්ඒඒ |
| සෙ/302187 | කෝප්‍රල් | පෙරේරා | එච්ඒඒසීඑන් (නායක) |
| සෙ/304472 | කෝප්‍රල් | වසන්ත | කේකේඑල් |
| සෙ/304882 | කෝප්‍රල් | මහින්ද | එල්ඩී |
| සෙ/307637 | කෝප්‍රල් | ප්‍රියංකර | කේපී |
| සෙ/308307 | කෝප්‍රල් | සේරම් | ඊඑම්එම්එස් |
| සෙ/317314 | කෝප්‍රල් | නන්දසේන | කේඑම් |
| සෙ/300639 | ලා/කෝ | විජේරත්න | එස් |
| සෙ/301399 | ලා/කෝ | ප්‍රියදර්ශන | වයිඑච්එස් |
| සෙ/308080 | ලා/කෝ | සිවරත්න | එස්බීවයි |
| සෙ/308770 | ලා/කෝ | කුමාර | ජඩී |
| සෙ/309382 | ලා/කෝ | පෙරේරා | ආර්වයි |
| සෙ/314357 | ලා/කෝ | කුමාරදාස | එච්ඒසී (උපනායක) |
| සෙ/14ඩී00013 | ලා/කෝ | ලක්ෂමන් | ඒඑම් |
| සෙ/301044 | සා/සෙ | අජිත් | කේආර් |
| සෙ/302052 | සා/සෙ | චන්ද්‍රජීව | පීඒඑන් |
| සෙ/317786 | සා/සෙ | සුනන්ද්‍ර | ආර්ඒඩීඑස් |
| සෙ/31909 | සා/සෙ | අබේසේකර | එස්එන් |
| සෙ/2ඩී03387 | සා/සෙ | සුගත් | එම්ඒසීඑන් |

ක්‍රීඩා අංශය - ශ්‍රීලපාහ



# මේ ගැන ඔබ සිතන්නේ කුමක්ද?

ඉන්දියාවේ හිටපු ජනාධිපති ආචාර්ය අබ්දුල් කලාම් මහතා විසින් පැවැත්වූ දේශනයක් සිංහල පරිවර්තනය ප්‍රණීතා අබේවික්‍රම නම් වූ ලේඛිකාවක විසින් 2007 අගෝස්තු මස 12 වන ඉරුදින ලක්බිම පුවත්පතේ පලකර තිබූ අතර එදිනම එම පුවත් පතේ කතුවැකියද එම දේශනයේ අන්තර්ගතය වෙනුවෙන්ම වැය කර ඇත.

ඉන්දියානුවෙකුගේ හෝ ශ්‍රී ලාංකිකයෙකුගේ පොදු චින්තන රටාව වෙනසක් නොමැතිව බලපෑම් එල්ල කළ හැකි එම දේශනයත්, පුවත්පතේ කතු තුමා විසින් සපයා ඇති අනර්ඝ කතු වැකියත් මෙහි පහතින් පලකර ඇති අතර දේශණයට ඌණ පූර්ණයක් සපයන කතුවැකිය ප්‍රථමයෙන්ද, දේශනයේ පරිවර්තනය දෙවනුවද පෙල ගස්වා ඇත.

## ආචාර්ය කලාම් ගේ දේශණයෙන් පටන් ගනිමුද?

ඉන්දියාවේ හිටපු ජනාධිපති ආචාර්ය අබ්දුල් කලාම්ගේ වටිනා පරිවර්ථනයක් අද අපේ පුවත්පතේ 26 වැනි පිටුවේ පළ වෙයි. තම රටේ සංවර්ධනය කෙරෙහි ඉන්දියානුවන්ගේ දායකත්වය කෙබඳු විය යුතු දැයි එහිදී ආචාර්‍ය කලාම් කියාසිටී. මෙම දේශනය ඉන්දියානුවන් මතු නොව ඉන්දියාව යන්නට ශ්‍රී ලංකාව යැයි යොදාගෙන අපේ මිනිසුන්ද ආදර්ශයට ගත යුත්තකැයි එය හඳුන්වාදෙමින් පරිවර්තිකාව සඳහන් කර තිබේ. මේ දේශනයේ අවසාන ජේදය නැසීගිය ඇමෙරිකන් ජනාධිපති ජෝන් එෆ් කෙනඩිගේ සුප්‍රසිද්ධ කියමනක් ඉන්දියාවට අදාල කර ලියූවකි.එය අපේ පරිවර්තිකාව කියන ලෙස ශ්‍රී ලංකාවට අදාල කර මෙසේ ලියනු කැමැත්තෙමු.

ශ්‍රී ලංකාව වෙනුවෙන් අපට කළ හැක්කේ කුමක්දැයි අසන්න. ඇමෙරිකාව හා සෙසු බටහිර රටවල් අද සිටින තත්ත්වයට ශ්‍රී ලංකාව ගෙන ඒම සඳහා කළ යුතුදේ කරන්න. ශ්‍රී ලංකාවට අපෙන් අවශ්‍ය දේ අපි කරමු. අප මේ කියන්නනට තනන්නේ ශ්‍රී ලංකාව වෙනුවෙන් ජිවිත පරිත්‍යාගයෙන් කටයුතු කරන්නට කියා නොවේ. කැමති උදවිය එසේ කිරීම ඉතා වටී.එහෙත් රට වෙනුවෙන් දිවිපුදන්නට ඉදිරිපත් නොවන්නට වුවද රට වෙනුවෙන් කළ හැකි බොහෝ දේවල් තිබෙන බව ඔබ ආචාර්ය කලාම්ගේ ලිපිය කියවූයේ නම් (නොවරදවාම එය කියවන්න) වටහා ගන්නවා නිසැකය. ආචාර්ය කලාම් කියන පරිදී සිංගප්පූරුවට යන අප එහිදී පාරේ හැම තැනම සිගරට් කොට විසිකරන්නේ නැත ඩුබායි යන අප රාමසාන් උපවාස කාලයේදී ප්‍රසිද්ධියේ කෑම කන්නේ නැත. ජෙඩාහිදී අප හිස ආවරණය කර නොගෙන පිටතට යන්නේ නැත. ලන්ඩනයේදී අප රජයේ නිලධාරීන් මුදලට ගැනීමට යන්නේ නැත. වොෂිංටනයේදී අප පොලීසියට චන්ඩි පාට් දමන්නේ නැත. ඔස්ට්‍රේලියාවේ හෝ නවසිලන්තයේ මුහුදු - වෙරළේදී අප පොල්කටුවක්වත් කුණු බාල්දියට හැර වෙන තැනකට දමන්නේ නැත. ටෝකියෝවේදී අප පාරේ කෙළ ගසන්නේ නැත.

මෙසේ වෙන රටවල ඇති විදේශිය ක්‍රමවේදයන්ට ගරු කරන, ඊට අනුගත වන ඒ ගැන පුරාජේරු කතා කරන අපේ රටේදී එසේ කළ නොහැකිය. වැඩිදුර කතාකරන්නේ කුමටද? අපේ රටේදී පයින් යන කල අප පිටරටවල සිටින විටදී මෙන් කහ ඉරෙන් පාර පනින්නේ නැත. වාහනයක් පදවාගෙන යනකල පිට රටකදී මෙන් පාර පන්නට ඉඩ දෙන්නේ නැත.

ජනාකීර්ණ ප්‍රදේශ වලදි පාර පැනිය යුත්තේ කහ ඉරෙන් බව ඒ ප්‍රදේශවල ජීවත්වන ඇතැම් තිරිසන් සතුන්ද දනිති.කහ ඉර ළඟ පාර පැනීමට බලාසිටින බල්ලෙකු දැක ගැනීමට ලැබෙන්නේ ඉඳහිට නොවන්නේ ඒ නිසාය. එහෙත් කහ ඉර දැක දැකත් අන් තැනකින් පාර හරහා පනින මිනිසුන් අනෙක් පැත්තට හැරී රටේ නීතිය හරිහැටි ක්‍රියාත්මක නොකිරීම ගැන පොලීසියටත් උසාවියටත් ආණ්ඩුවටත් බනින්නට වරද්දන්නේ නැත. කහ ඉරක් තිබෙන තැනකින් මීටර් 50 ක් ඇතුළත අන් තැනකින් පාර පැනීම දඩ ගැසිය යුතු වරදක් වුවත් එය අභාවයට ගොස් ඇති නීතියකි.

විදුලි සංඥා පුවරු ඇති තැනකදී වාහන වලට යාම සඳහා කොළ එලිය දැල් වෙද්දී වුව තමන්ට කහ ඉර භාවිතා කළ හැකි යැයි සිතන පදිකයින් ගෙන්ද අපට අඩුවක් නැත. දැඩි ලෙස නාගරීකරණය වී ඇති බම්බලපිටිය හා මරදාන වැනි ස්ථාන වලදීද බොහෝ පදිකයෝ ගමේ පාර පනින්නාක් මෙන් ඔහේ පාර පනිති. බොරැල්ලේ උමං මාර්ග යද කොළඹ අන් තැන්වල මගී පාලම්ද තිබියදී අලජ්ජි ලෙස වැටවල් පැන පාර හරහා පිස්සුවෙන් මෙන් යන පදිකයෝද අපට ඕනෑ තරම් සිටිති. එසේ කිරීම ගැන දඩුවම් ලැබූ කෙනෙක් හෝ දඩුවම් දුන් කෙනෙකු හෝ වටිනා තෑග්ගක් දුන්නද සොයා ගැනීමට නොහැකි වෙනවාට මෙන්න කැට

දවාලට පාර පනින්නට නොදන්නන් රෑට පාර පනින්නට දනිතියි කෙසේවත් වරදවා සිතිය යුතු නැත. රෑට පාර පැනිය යුත්තේ මහ පාරේ එළිය ඇති තැනකින් බව නොසිතන ඇතැම්හු වාහන වල ආලෝකයට සිය ජීවිත භාර කර පාර පනින්නේ ඒ නිසාය. ඒ පදිකයන් ගැන පමණය. පදිකයන් මෙන්ම රියදුරන්ද අපේම මිනිසුන් හෙයින් වාහන පදවන විට කහ ඉරෙන් පාර පනින්නට ඉඩ දිය යුතු බව දන්නා රියදුරන් සිටින්නේද ඉතා කලාතුරකිනි. කහ ඉරක් කිට්ටු වන කල බොහෝ වාහන වල වේගය වැඩි





## මේ ගැන ඔබ සිතන්නේ කුමක්ද?

වන්නේද පදිකයන් කහ ඉරට අවතීර්ණව සිටියදී පාරේ අනෙක් පැත්තෙන් වෙට්ටු දමා වාහනය පදවාගෙන යන්නේද ඔවුන් අද යන්නේ ඊයේ යා යුතුව තිබූ ගමනක් නිසා විය යුතුය. කහ ඉර ගැන පමණක් වුව අපට කතා කරන්නට තවත් බොහෝ දේවල් තිබේ. එහෙත් අපට කියන්නට අවශ්‍ය එය නොවේ. රට දියුණු නොකිරීම ගැන එන එන ආණ්ඩු වලට බනින අප මේ කාලකණ්නි රටෙන් පැන ගත යුතු යැයි කියා තනාපති කාර්යාල වල පෝලිම් වලට එකතු වන අප කහ ඉරෙන් පාර පනින්නටවත් කරදර නොවන බව, කහ ඉරෙන් පාර පනින්නෙකුට ඉඩ දෙන්නටවත් කරදර නොවන බව කිසිවිටෙකත් සිතා බලා තිබේද? රට හදන්නට කිසිවක් කරන්නේ නැතැයි දේශපාලඥයන්ට, ස්වාමීන් වහන්සේලාට, බුද්ධිමතුන්ට හා මාධ්‍යවේදීන්ට දොස් කියන අප රට හදන්නට විනය ගරුක කරන්නට අපෙන්ද සම්මාදමක් තිබිය යුතු නොවේදැයි කල්පනා නොකරන්නෙමු. ආචාර්‍ය කලාම් කියන පරිදි මිස්ටර් ක්ලීන් කෙනෙකු පැමිණ මේ ක්‍රමය අතුගා දමා අපි වෙනුවෙන් ආශ්චර්යයක් කරනු ඇතැයි අපි සිතා සිටිමු.

එතෙක් අපි වැරදි තැනින් පාර පනින්නෙමු. කහ ඉරෙන් පනින පදිකයාට ඉඩ නොදී විදුලි වේගයෙන් යන්නෙමු. අන්‍යයන් හරි දේ කිරීමට ඉගෙන ගන්නා තුරු අප ඒ දේ කරන්නට කරදර වන්නේ කුමට දැයි සිතන්නෙමු.

## අපි හෘද සාක්ෂිය මුදලට උකස් කර ඇත්තෙමු.

පරිවර්තනය
**ප්‍රණීතා අබේවික්‍රම**

ඉන්දියාවේ හිටපු ජනාධිපති ආචාර්‍ය අබ්දුල් කලාම් පසුගිය දා වසර හයක නිල කාලය අවසන් කලේය. ඉන්දියාවේ අනාගතය හා සංවර්ධනය පිළිබඳ බොහෝ ධනාත්මක අදහස පළ කරන චින්තකයකු වන ආචාර්‍ය කලාම් 2006 නොවැම්බර් මස හයිද්‍රාබාදයේදී පැවැත්වූ දේශනයක සිංහල පරිවර්තනයයි මේ. "Why is the media here so negative" යන මැයෙන් පැවැත්වූ මෙම දේශනය තම රටේ සංර්ධනය කෙරෙහි ඉන්දියානුවන්ගේ දායකත්වය කෙබඳු විය යුතුද යන්න විස්තර කරන්නෙකි. මෙම දේශනය ඉන්දියානුවන්ට පමණක් නොව ඉන්දියාව යන්නට ශ්‍රීලංකාව යන්න යොදාගෙන ශ්‍රී ලාංකිකයන්ද ආදර්ශයට ගත යුත්තකි.

අපේ ශක්තිය සහ ජයග්‍රහණය පිළිගැනීමට ඉන්දියානුවන් වන අප මෙතරම් මැලි කමක් දක්වන්නේ ඇයි? අපි ඉතා ශ්‍රේෂ්ඨ ජාතියක් වෙමු. පුදුමාකාර ජයග්‍රහණ රැසක් අප සතුව තිබුණත් ඒවා ඇති බව පිළිගැනීම අපි ප්‍රතික්ෂේප කරමු. ඒ ඇයි?

අපි ලොව විශාල තම කිරි නිෂ්පාදකයෝ වෙමු. දුරස්ථ සංවේදන චන්ද්‍රිකා පිළිබඳව පළමුවැන්නෝ අපිය. ලොව විශාලතම තිරිඟු නිෂ්පාදකයෝ අපිය.

ආචාර්‍ය සුදර්ශන් දෙස බලන්න ගෝත්‍රික ජන කොටසක් ස්වාධිනව ඉදිරියට යන ස්වයංපෝෂිත ඒකකයක් බවට පත් කිරීමට ඔහුට හැකි විය. එවැනි ජයග්‍රහණ මිලියන ගණනක් ඇත. එහෙත් අපේ ජනමාධ්‍ය උනන්දු වන්නේ නරක ආරංචි පරාජය වීම් සහ විනාශයක් ගැන පමණි.වරක් මම ටෙල් ආවීව් නගරයේදී ඊශ්‍රාලය පුවත් පතක් කියෙව්වෙමි. ඊට පෙර දින එහි ප්‍රහාර, බෝම්බ පිපිරීම් සහ මරණ රැසක් සිදුවී තිබුණි.හමාස් සංවිධානය විසින් ප්‍රහාර එල්ල කර තිබුණි.එහෙත් පුවත්පතේ මුල් පිටුවේ ජායාරූපයෙහි දැක්වූයේ වසර පහකින් කලින් කාන්තාරයක් වූ තම ගෙවත්ත උයනක් සහ ධාන්‍යාගාරයක් බවට හැරවූ යුදෙව්වකු පිළිබඳය එදින උදෑසන සෑම කෙනෙකුම දුටුවේ මේ ප්‍රබෝධමත් ජායා රූපයයි. මිනී මැරුම් බෝම්බ පිපිරීම්, මරණ ආදීය පිළිබඳ ලේ වැගිරෙන විස්තර තිබුනේ ඇතුළු පිටු තුළ සෙසු පුවත් අතර සඟවාය. ඉන්දියාවේ අප කියවන්නේ මරණ ලෙඩ රෝග ත්‍රස්තවාදය අපරාධ ආදිය ගැනයි. අප මෙතරම් සෘණාත්මක ඇයි? තවත් ප්‍රශ්ණයක්: ජාතියක් ලෙස අප මෙතරම් විජාතීය දේ වැළඳ ගන්නේ ඇයි?
අපට ඕනෑ විදේශිය රූපවාහිනී විදේශීය කමිස විදේශිය තාක්ෂණයයි.
ආනයනය කරන ඕනෑම දෙයක් කෙරෙහි ඇති මේ ඇල්ම කුමක්ද?
ආත්ම ගරුත්වය පැමිණෙන්නේ ආත්ම විශ්වාසය ට බව අපට වැටහෙන්නේ නැද්ද? දිනක මම හයිද්‍රාබාදයේ දේශනයක් කරමින් සිටියෙමි.එහිදී අවුරුදු 14 ක දැරියක් මගෙන් සමරු අත්සනක් ඉල්ලුවාය. ඇගේ ජීවිතයේ ඉලක්කය කුමක්දැයි මම ඇගෙන් ඇසුවෙමි. මට සංවර්ධිත ඉන්දියාවක ජීවත් වෙන්න ඕනෑ. යැයි ඇය පිළිතුරු දුන්නාය. ඈ වෙනුවෙන් ඒ සංවර්ධිත ඉන්දියාව ගොඩ නැගිය යුත්තේ ඔබ සහ මමයි. ඔබ එසේ ප්‍රකාශයට පත් කළ යුතුයි. ඉන්දියාව ඌණ සංවර්ධිත රටක් නොවේ. එය ඉතාම සංවර්ධිත රටකි. ඔබට මිනිත්තු දහයක් වෙන් කළ හැකිද? මට බොහෝ උනන්දුවෙන් එය අසන්නට දෙන්න. ඔබ රට වෙනුවෙන් මිනිත්තු 10 ක් වෙන් කළ හැකිද එසේ නම් මෙය කියවන්න නැත්නම් තෝරා ගැනීම ඔබ සතුයි. අපේ රජය අකාර්යක්‍ෂම බව ඔබ කියයි. අපේ නීති පැරණි වැඩි බව ඔබ කියයි. නගර සභාවෙන් කුණු එකතු කරගෙන යන්නේ නැති බව ඔබ කියයි. දුරකථන ක්‍රියා විරහිත වී ඇති බව දුම්රිය සේවය විහිළුවක් බව ඔබ කියයි. අපේ ගුවන් විදුලිය ලෝකයේ නරකම ගුවන් විදුලි සේවය බවත් ලියුමක් කිසිදාක එය යා යුතු ස්ථානයට ලඟා නොවන බවත් ඔබ කියයි.

අපේ රට බල්ලාට ගොස් ඇති බවත් වළට වැටී ඇති බවත් ඔබ කියයි. දිගින් දිගටම කියයි කියයි කියයි ඒ ගැන ඔබ කරන්නේ කුමක්ද? පුද්ගලයකු සිංගප්පූරුවට ගෙන යන්න ඔහුට ඔබේ නම දෙන්න, ඔබේ මුහුණ දෙන්න, ගුවන් තොටු පලෙන් පිටතට යන විට ඔබ හැඳ සිටින්නේ පිට රට යනවිට අඳින ඔබේ හොඳම ඇඳුමයි. සිංගප්පූරුවේදි ඔබ සිගරට් කොට පාරේ හැමතැනම විසි කරන්නේ නැත. වෙළඳ සල් වලදී ආහාර ගන්නේ නැත. ඔබද ඔවුන් තරම්ම ඔවුන්ගේ උමං මාර්ග ගැන ආඩම්බරය.සවස 5 සිට 8 දක්වා ඕර්චර්ඩ් පාර දිගේ වාහන පැදවීම සඳහා ඔබ ඩොලර් 5 ක් ගෙවයි. ඔබ කුමණ තරාතිරමේ කෙනෙකු උවද ඔබ ආපන ශාලාවක හෝ සාප්පු සංකීර්ණයක වැඩි වේලාවක් කාලය ගත කරන්නේ නම් රථ ගාල වෙත ආපසු පැමිණ වාහන ගාල් කිරීමේ අවසර පතේ කාලය දීර්ඝ කර ගනී.





# මේ ගැන ඔබ සිතන්නේ කුමක්ද?

සිංගප්පූරුවේ දී ඔබ ඊට කිසිවක් කියන්නේ නැත. එහෙම නේද?. ඩුබායි හිදී ඔබ රාමසාන් උපවාස කාලය තුළ ප්‍රසිද්ධියේ කෑම ගන්නට තරම් නිර්භීත වන්නේ නැත. ජෙඩා හිදී හිස ආවරණය කර නොගෙන පිටටත යාමට තරම් ඔබ නිර්භීත වන්නේ නැත. ලන්ඩනයේදී ඔබ තමන්ගේ දුරකථන වියදම් වෙනත් කෙනෙකු ගේ බිල් පතට හැරවීම සඳහා දුරකථන මධ්‍යස්ථානයේ නිලධාරීන් මසකට පවුම් 10 ක මුදලකට මිලට ගැනීමට නිර්භීත වන්නේ නැත. වොෂිංටනයේ දී ඔබ පැයට සැතපුම් 55 ට වඩා වේගයෙන් රිය පදවා මම කවුද කියලා දන්නවද මම අසවලාගේ පුතා මේ සල්ලි අරන් යනවා යන්න යැයි පොලිස් නිලධාරියාට කීමට තරම් නිර්භීත වන්නේ නැත. ඔස්ට්‍රේලියාවේ සහ නවසිලන්තයේ මුහුදු වෙරළේදී ඔබ පොල් කටුවක් කුණු බාල්දියට හැර වෙනත් තැනකට දමන්නේ නැත.

බොස්ටන් නුවරදී ඔබ තමන් වෙනුවෙන් විභාග ලිවීමට වෙනත් කෙනෙකු යොදවන්නේ හෝ හොර සහතික මිළ දී නොගන්නේ ඇයි. තවම අප කතා කරන්නේ එකම ඔබ ගැනයි. වෙන රටවල විදේශීය ක්‍රම වේදයනට ගරු කරන සහ අනුගත විය හැකි එහෙත් තම රටේදී එසේ කළ නොහැකි ඔබ ගැනමය. ඉන්දියානු භූමියට පය තැබූ හැටියේ පාර පුරා කඩදාසි කැබලි සහ සිගරට් කොට විසිකරන ඔබ ගැනය වෙනත් රටකදී සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ සියළු දේ අගය කරන පුරවැසියකු විමට ඔබ හැකි නම් ඉන්දියාවේ ඔබට එසේ කළ නොහැකි ඇයි. මුම්බායේ හිටපු නාගරික කොමසාරිස් වරයෙක් වන තිනායකර් මහතා වරක් සම්මුඛ සාකච්ජාවකදී වැදගත් කරුණක් ඉස්මතු කලේය. පොහොසත් මිනිසුන්ගේ බල්ලන්ට ශරීර කෘත්‍ය කරවීමට පාර දිගේ ඇවිද්දවනවා. ඉන්පසු ඒ පොහොසතුන්ම අපිරිසිදු පදික වේදිකා සහ අකාරයක්ෂමතාව ඇති වන සෑම වරකම කොස්සක් ගෙන ඔවුන් පසුපස යන්නේද? ඇමෙරිකාවේ නම් තම සුරතලා පාරේ කැත කළ විට එය පිරිසිදු කිරීම ස්වාමියා විසින් අනිවාර්යයෙන් කළ යුතුයි. ජපානයේද එසේමයි. ඉන්දියානු පුරවැසියෙකු තම රටේ දී එසේ කරයිද? ඔහු නිවැරදිය අපි ආණ්ඩුවක් තෝරා ගැනීම සඳහා ඡන්දය දැමීමට යමු. ඉන් පසු අපේ වගකීම් සියල්ල අත් හරිමු.

අපෙන් සම්පූර්ණයෙන් සෘණාත්මක දායකත්වයක් ලබා දෙන අතරම අප සැප පහසුව තබා ආණ්ඩුව අප වෙනුවෙන්නම සෑම දෙයක්ම කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු. එහෙත් හැම තැනම කුණු දැමීම නැවැත් වීම හෝ මඳකට නැවතී බිම වැටී ඇති කඩදාසි කැබැල්ලක් අහුලා එය කුණු බක්කියයට දැමීම අප කරන්නේ නැත.

දුම්රිය දෙපාර්තමේන්තු විසින් පිරිසිදු වැසිකිලි ලබා දිය යුතු බව අපි අපේක්ෂා කරමු. එහෙත් වැසිකිළියක් නියම ලෙස පාවිච්චි කරන අයුරු ඉගෙන ගැනීමට අප උනන්දු වනනේ නැත. ඉන්දීය ගුවන් සේවය හොඳම ආහාර සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයිය යුතු යයි අපි කියමු. එහෙත් ලැබෙන සුළු අවස්ථාවකදී වුවත් සුළු හොර කමක් කිරීම අප නවත්වන්නේ නැත.

දුම්රිය දෙපාර්තමේන්තු විසින් පිරිසිදු වැසිකිලි ලබා දිය යුතු බව අපි අපේක්ෂා කරමු. එහෙත් වැසිකිළියක් නියම ලෙස පාවිච්චි කරන අයුරු ඉගෙන ගැනීමට අප උනන්දු වනනේ නැත. ඉන්දීය ගුවන් සේවය හොඳම ආහාර සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයිය යුතු යයි අපි කියමු. එහෙත් ලැබෙන සුළු අවස්ථාවකදී වුවත් සුළු හොර කමක් කිරීම අප නවත්වන්නේ නැත.

මහජනතාවට සේවා සපයන සේවක මණ්ඩලයටද මෙය අදාල වේ.

කාන්තාවන් දෑවැද්ද ගැහැණු ළමුන් සහ වෙනත් දැවෙන සමාජ ගැටළු වලට එරෙහිව ප්‍රසිද්ධියේ මහ හඬින් විරෝධය පල කරන අප අපේ ගෙවල් වලදී ඊට හාත්පසින්ම වෙනස් දේවල් කරගෙන යමු.අපේ නිදහසට කරුණ කුමක්ද? වෙනස් විය යුත්තේ සමස්ථ ක්‍රමයයි. මා පමණක් මගේ පුතුට දෑවැද්ද සඳහා ඇති අයිතිය අත් හැරිය පමණින් එය වැදගත් වන්නේ කෙසේද? එසේනම් මේ ක්‍රමය වෙනස් කරන්නේ කවුද? සමාජ ක්‍රමය සෑදී ඇත්තේ මොනවායින්ද අපේ පහසුවට අප කියන්නේ එය අපේ අසල් වැසියන් අනෙකුත් නිවාස අනෙකුත් නගර අනෙකුත් ප්‍රජාවන් සහ ආණ්ඩුව යන කොටස් වලින් සමන්විත වන බවයි. අප කියන ලෙසට අනිවාර්යයෙන්ම එයට ඔබ සහ මම අයිති නොවෙමු. අප කරන්නේ අපේ පවුල් වල අයත් සමඟ ආරක්ෂක කෝෂයන් තුලට වැදීමයි. අප එසේ කර මිස්ටර් ක්ලීන් කෙනෙකු පැමිණ ඔහු මේ ක්‍රමය අතුගා දමා අප වෙනුවෙන් ආශ්චර්යයක් කරනු ඇතැයි අප දුර ඈත රටවල් දෙස බලා සිටිමු. එසේ නැත්නම් අප අපි රට අතහැර දමා පළා යමු. අප විසින්ම ඇතිකරගත් බියක් අප පසු පස හඹා එන විට කම්මැලි බය ගුල්ලන් මෙන් ඇමෙරිකාවට දුවන අපි ඔවුන් ගේ යස ඉසුරුවල පහස ලබමින් ඔවුන්ගේ ක්‍රමය අනුගමනය කරමු. නිව්යොක් නගරය අනාරක්ෂිත වූ විට අපි එංගලන්තයට දුවමු එංගලන්තයේ රැකියා විරහිත බව වැඩිවන විට අප ඊලඟ ගුවන් යානයෙන් ගල්ෆ් කලාපය බලා යමු.ගල්ෆ් කලාපයේ යුද්ධය ඇඹුණු විට අපි අප බේරාගෙන නැවත් මව්රටට ගෙන්වා ගන්නා ලෙස ඉන්දීය රජයට බල කරමු. හැම කෙනෙක්ම රට අපයෝජනය කිරීමට සහ දූෂණය කිරීමට සැදී පැහැදී සිටිති. මේ ක්‍රමය පෝෂණය කළ යුතු බව කිසිවෙක් නොසිතයි. අපේ හෘදසාක්ෂිය මුදලට උකස් කර ඇත. ආදණීය ඉන්දියානුවන් මෙම ලිපිය බොහෝසිතුවිලිඋත්පාදනයකරවයි.එයආත්ම පරීක්ෂාවකට ආරාධනා කිරීමකි.එය කෙනෙකුගේ හෘද සාක්ෂිය රිදවයි. ජෝන් එෆ් කෙනඩි ඇමෙරිකානුවන්ට කී වචන මම මෙහිදී ඉන්දියානුවන්ට අදාල කර කියමි. ඉන්දියාව වෙනුවෙන් අපට කළ හැක්කේ කුමක්දැයි අසන්න. ඇමෙරිකාව සහ සෙසු බටහිර රටවල් අද සිටින තත්ත්වයට ඉන්දියාව ගෙන ඒම සඳහා කළ යුතු දේ කරන්න. ඉන්දියාවට අපෙන් අවශ්‍ය දේ අපි කරමු.

ඉදිරිපත් කිරීම
**මේජර් කේවීඩීආර් ධර්මප්‍රිය ශ්‍රීලපාහ**
ජනාධිපති ආරක්ෂක ඒකකය.
අරලිය ගහ මන්දිරය.

# බස්රියේ දුටු නැගණියේ

දුරණියගලට යන ජනතා බස් රථයේ
පිටුපස අසුනෙ හිඳ සිනසුන සුරතලියේ
සිත සොරකම් කලේ ඇයිදෝ යෞවනියේ
මගෙ සිත නුඹට පෙම් කරනව තවම ප්‍රියේ

දිමුතු දසන් පෙන්වා පෑ සිනාව
අමතක කරන්නට බැරිවෙයි මට ඔයාව
සුදු රැලි ගවුම පොත් මිටියෙන් සරසයි ඔබ මනාව
වෙන්නට තිබුනානම් හිස පීරන පනාව

ඔබ නොදනීද මම ඔබ ගැන සිහින මවා
දින ගණනක්ම පසුපස මා පිය නැගුවා
වත ගොත කියපු පලවන දින සිහි වෙනවා
ඔය හද සුවඳ මල්මිට මට හිමි වෙනවා

සියපත් පුබුදුවා හිනැහෙන නෙළුම් මල
ඔබ සමකරන්නට පිපුනද විලක මල
අත දිග මදි සුරතට අරගන්න මල
මගෙ සිත් මලේ සදහට ඔබ පිපෙනු මල

පාසල් සමේ බාධාවක් නොවේනම්
සදාකල්ම ඉඩදෙමි මං මවා පෙම්
මම රට දූය දෙකම දිවි හිමියෙන් රකින්නම්
මට වෙර දෙන්න මගෙ ශක්තිය ඔයානම්

තබන තබන පියවර ඔබ ඉදිරියට
මල් දම් මතින් ගෙන යන්නම් මගෙ පැලට
සමුදෙමි අදට ඔබෙ නාමෙන් පන්හිදට
සම්බුදු සරණ පතනෙමි මා දෙව් පිහිට

සෙ/317417
ලාකෝ දීපාල් ඩබ්එච්
1 ශ්‍රීලපාහ

## සිතන්න යමක්

බොහෝ දෙනා තමතමන්ගේ මිනී වලවල් කපා ගන්නේ උදැල්ලෙන් නොව තමාගේම කටින්මයි. දඩි දුක් විඳ ලැබෙන සැප සම්පත්තිය ඉතා සුළු වුවත් ඥාණය ඇති පුද්ගලයෝ අනුන් නසා ලබන සම්පත්තිය මළ මෙන් පිළිකුල් කරයි.


සෙ/306875 කෝප්‍රල් අබේසිංහ ඩීඩී
"බී" කණ්ඩායම - 3 ශ්‍රීලපාහ

## පොපි මල් දිනය

සදාදර සුවයක් ලබා
උණුසුම් ජීවය
දයාබර මව්ගේ ලය පැත්තෙගත් මිදී
මිහිදන් කොට සිත් පතුලේම
ඒකීය නිජ බිමට
භෞමික අඛන්ඩ තාවයෙන් පිරි
ස්වෛරී රාජ්‍යයකට
පිදුවෙහි නුඹලාගේ ජීවය
පපු කුහරයෙන් නැගුණු
උණුසුම් රුධිර ධාරාව
වත්නි කරයේ වැලි පොළව වැළඳ
ගත්තෙමි.
මුවින් නැගුණු සුසුම් වැල්
තිහඩව වායු තලයට මුසුවුනි
තිසලය අද වත්නි ඝන වනය
එදා නුඹලා නැගු රණ හඩ පරදවා
ඇදී මල් සාමයේ මල් වනසත්
අමරණීයයි දයාබර රණ විරුවන් හට
පුදමි පොපි මල් නුඹෙ නමින්..........

සෙ/315242 සාසෙ ජයවීර යූ.එම්
1 ශ්‍රීලපාහ . බී . කණ්ඩායම

## මගේ හදවත ගිනිගෙන දැවෙයි



ගිනි ගෙන දැවෙයි මගෙ මුළු හදවතම
කඳුළු දහරා කඩා වැටෙයි නොකල වරදකට
එවගින් නුඹ සමුගත්තේ ඇයිද කුමරියේ
දහසක් පැතුම් පැතුවා එක සෙවනක සැනසී හිඳින්න............

නුඹ ලොවින් මුසා බස් අසා මගෙන් සමුගෙන ගියා
කවදා හෝ නුඹට සත්‍ය වැටහේවි
ඊට පමා වැඩි මන්ද අපට අප අහිමි නිසා..........

සෙ/314022 සා සෙ රත්නසිරි ඩබ් එච්එස්
බී : කණ්ඩායම 3 ශ්‍රීලපාහ

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# මුදලේ වගතුග



**මානව** ඉතිහාසයේ මුල් යුගවල සිටම මිනිසා අතර ගනු දෙනු ක්‍රම තිබූ බවට සාධක තිබේ. ස්වයං පෝෂිත ජීවන රටාව ක්‍රම ක්‍රමයෙන් ආර්ථික පරිභෝජනය රටාව දක්වා විකාශනය වීමේදී මිනිසා හුවමාරු ක්‍රමයක පිහිට පැතීය. අද අප හුවමාරු මාධ්‍ය වශයෙන් භාවිතා කරන මුදල් ලෙස හැඳින්වෙන කාසි සහ නෝට්ටු ඈත අතීතයේ සිට විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් විකාශනය වූවකි.

භාණ්ඩ හුවමාරුවෙන් ඇරඹුණු ගනු දෙනු ක්‍රම ක්‍රමයෙන් වැඩි දියුණු වී තමා පරිහරණය කරන්නාවූ භාණ්ඩ අලෙවි කිරීම සඳහා යම් වටිනාකමක් ඇති ද්‍රව්‍ය භාවිතා කිරීම මෙහි පළමු අඩියර විය. මේ සඳහා එ කල ගල් කැබලි, සිප්පි කටු,සහ සතුන්ගේ සම් කැබලි ආදිය භාවිතා කෙරිණ. අනතුරුව ලෝහ කැබලි භාවිතා කළ අතර, මෙම ලෝහ භාවිතය වැඩි දියුණු වී ලෝහ වලින් විවිධ හැඩැති කාසි නිපදවන ලදි. මෙයද වැඩි දියුණු වී රන්, රිදී වැනි වටිනා ලෝහ ද කාසි නිපදවීම සඳහා යොදා ගැනිණ. සිංහල රජ දවස තැනුණු මෙවැනි කාසි වර්ග කිහිපයක් ම අදද ඒ බවට සාක්ෂි දැරීමට අප අතර තිබේ. එසේම විදේශ වෙළදාම සහ විදේශීය ආක්‍රමණවල බලපෑම නිසා ද අප රටෙහි ඒ ඒ යුගවලදී නොයෙක් වර්ග වල විදේශ කාසි භාවිතා වූ බවට සාධක හමු වී ඇත.

කල් යත් යත් ලෝකයේ ගනු දෙනු ක්‍රම පුළුල්වත් ම අඩු වියදමකින් මුදල් නිපදවීමේ අවශ්‍යතාවය පැන නැගුණි. මෙය කඩදාසි වල මුද්‍රණය කරනු ලබන මුදල් නෝට්ටුවල උපතට මඟ පෑදිය. ප්‍රථම වරට 1785 මැයි 10 වැනි දින ශ්‍රී ලංකාවේ ද මුදල් නෝට්ටුවක් නිකුත් කරන ලද බවට සාධක ඇත. ශ්‍රී ලංකාව රුපියල් සත ක්‍රමයකට අවතීර්ණ වූයේ 1872 ජනවාරි 1 වැනි දිනය. එතැන් සිට ව්‍යවහාර මුදල් කොමසාරිස්වරුන්ගේ කාර්යයක් වූ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ කාර්යය 1950 අගෝස්තු මස 28 වැනි දින උපත ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුළුමනින්ම පවරා ගන්නා ලදි. එය නිකුත් කළ මුදල් නෝට්ටු මුද්‍රණය කරන ලද්දේ එංගලන්තයේ බ්‍රැඩ්බරි විල්කින්සන් සමාගම විසිනි. කාසි නිපදවන ලද්දේ ''රාජකීය ටංකනය'' විසිනි. ශ්‍රී ලංකා මහ බැංකුව පසුගිය කාලය තුලදී මුදල් නෝට්ටු කාණ්ඩ කිහිපයක් මුද්‍රණය කර ඇත. ඒවා නම්, VI වැනි ජෝර්ජ් රජුගේ රුව සහිත මුදල් නෝට්ටු කාණ්ඩය II වැනි එලිසබෙත් රැජිණගේ රුව සහිත මුදල් නෝට්ටු කාණ්ඩය, පළමුවැනි පරාක්‍රබාම බාහු රජුගේ පිළිරුව සහිත මුදල් නෝට්ටු කාණ්ඩය, බණ්ඩාරනායක රුව සහිත මුදල් නෝට්ටු කාණ්ඩය, ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය සහිත මුදල් නෝට්ටු කාණ්ඩය,වන සත්ව හා වෘක්ෂලතා පිළිඹිඹුවන මුදල් නෝට්ටු කාණ්ඩය, ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක තේමා රැගත් මුදල් නෝට්ටු කාණ්ඩය, සහ ශ්‍රී ලංකාවේ පැරණි උරුමයන් විහිදා දැක්වෙන මුදල් නෝට්ටු කාණ්ඩය යනුවෙනි. එසේම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශේෂ අවස්ථා සැමරීම සඳහා සමරු කාසි 32 ක් 2006 වර්ෂය තෙක් නිකුත් කර ඇත. එම කාසි වලින් සමන්විත සීමිත ප්‍රමාණයක් දැනට පවතින මිල ගණන් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ කවුන්ටර් අංශයෙන් හෝ රාජගිරියේ පිහිටි ශ්‍රී ලංකා මහ බැජකුවේ මුදල් කෞතුකාගාරයෙන් ලබාගත හැකිය.(දුරකථන අංක : රාජගිරිය මුදල් කෞතුකාගාරය 011 2477809, කවුන්ටර් අංශය 2477357)

මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේදී එදා සිට අද දක්වා ඒවායේ තත්ත්වය උසස් කිරීම සහ ආරක්ෂාව වැඩි දියුණුව සඳහා බෝහෝ පියවර ගෙන තිබෙ. මුදල් නෝට්ටු මුද්‍රණයේ දී දිය සළකුණ යෙදීම සහ ආරක්ෂණ නූල යෙදීම ව්‍යාජ මුදල් නෝට්ටු පිළියෙළ කරන්නන් ගෙන් ආරක්ෂා වීමට යොදන වැදගත් උපක්‍රමයන්ය. තවද, මුදල් නෝට්ටුවක පියවි ඇසට නොපෙනෙන ආරක්ෂණ සලකුණු කිහිපයක්ම මුද්‍රණය කර ඇත. අපට අවශ්‍ය මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම සඳහා විශේෂ ආරක්ෂිත කඩදාසි ලබාගන්නේ එංගලන්තයේ ''පෝටල්ස්'' සමාගම වෙතිනි.1987 දී බියගම පිහිටුවන ලද බ්‍රැඩ්බරි විල්කින්සන් සමාග මේ ශාඛාව මගින් අද අප රටෙහිම මුදල් නෝට්ටු මුද්‍රණය කරනු ලැබේ.මෙම සමාග මේ මවු සමාගම 1990 දී තෝමස් ඩිලාරූ සමාගම විසින් මිලදී ගත් හෙයින් මෙරට ඇති සමාගම ද අද එනමින්ම හැඳින්වේ.

මුදල් නෝට්ටු මුද්‍රණයේ දී වරින්වර නෝට්ටුවේ මෝස්තරය සහ වර්ණය වෙනස් කරනු ලැබේ. එසේම එහි ආරක්ෂාව සඳහා යොදනු ලබන උපක්‍රමද වැඩි දියුණු කෙරේ. මෑතකදී නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ පැරණි උරුමයන් විහිදා දැක්වෙන මුදල් නෝට්ටු කාණ්ඩය ආරක්ෂණ උපක්‍රම යෙදීම අතින් උසස් තැනක් ගනී. එම කාණ්ඩයේ මුදල් නෝට්ටු ප්‍රමාණයෙන් කුඩාවට මුද්‍රණය කර ඇත. එම නිසා එම නෝට්ටු භාවිතය පහසු වන අතර, ආයුකාලය ද දිගුවේ.

ලෝකයේ මෙතෙක් මුද්‍රණය කරන ලද විශේෂතම නෝට්ටු වර්ගය වන්නේ ''පෝලිමර්'' මුදල් නෝට්ටුවයි. මේවා සිංගප්පූරුව, ඕස්ට්‍රේලියාව, ඉන්දුනීසියාව වැනි රටවල දැනටමත් භාවිතයට පැමිණ තිබේ. දැනට භාවිතයේ පවතින ශ්‍රීලංකා රුපියල් 200/- නෝට්ටුවද පොලිමර් නෝට්ටුවකි. ආරක්ෂණ උපක්‍රම අතින් මෙම නෝට්ටු, කඩදාසි නෝට්ටුවලට වඩා උසස් තැනක් ගනී.ව්‍යාජ මුදල් නෝට්ටු පිළියෙළ කරන්නට ද මේවා නිපැයුම ඉතා දුෂ්කර වේ.

හැකිතරම් ආරක්ෂණ උපක්‍රම අනුගමනය කරමින් විශාල මුදල් ප්‍රමාණයක් වැය කරමින් නිපදවනු ලබන මුදල් නෝට්ටු සංසරණයේදී මහජනයා විසින් පරිහරණය කරනු ලබන ආකාරය ගැන සෑහීමකට පත්විය නොහැකිය. නොවැලැක්විය හැකි හේතු නිසා පමණක් නොව හිතාමතා ම විකෘති කරන ලද විශාල මුදල් නෝට්ටු ප්‍රමාණයක් දිවයිනේ විවිධ ප්‍රදේශවලින් දිනපතා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගලා එයි. තමන් විසින් නොසැලකිල්ලෙන් අපිරිසිදු කරන හා විකෘති කරන සෑම මුදල් නෝට්ටුවක් සඳහාම විශාල වියදමක් දැරීමට සිදුවන බව බොහෝ දෙනා සැලකිල්ලට නොගනී. ගනු දෙනු සඳහා පිරිසිදු මුදල් නෝට්ටු නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව ඉමහත් ප්‍රයත්නයක් දරයි. පිරිසිදුව ආරක්ෂාදායි ලෙසත් මුදල් නෝට්ටු සහ කාසි පරිහරණය කිරීම පුරවැසි අප සැමගේ යුතුකමකි.

## මුදල් නෝට්ටු පිරිසිදුව පරිහරණය කරමු

**අප පිරිසිදු මුදල් නෝට්ටු භාවිතා කළ යුත්තේ ඇයි?**

- පවිත්‍ර මුදල් නෝට්ටු පරිහරණය නිසා ගනු දෙනු කිරීමේ ප්‍රසන්න බවක් ඇතිවේ.
- රටක භාවිතා වන පවිත්‍ර මුදල් නෝට්ටු මගින් එම රටේ පුරවැසියන්ගේ පවිත්‍ර තාවයට ඇති ලැදියාව විදේශිකයිනට හෙළි කරයි.
- මුදල් නෝට්ටු පොඩි කිරීමෙන් හෝ ඉරා දැමීමෙන් වළකින්න.
- වේයන්, මීයන්,කාවුන් වැනි සතුන්ගෙන් හානි විය හැකි වන පරිදී මුදල් නෝට්ටු අනාරක්ෂිත ස්ථාන වල තැබීමෙන් වළකින්න
- තෙතමනය සහිත ස්ථාන, මුට්ටි හෝ පෙට්ටි ආදී ස්ථාන වල මුදල් නෝට්ටු තැබීමෙන් වළකින්න.

- ගින්නෙන් හානි විය හැකි ස්ථාන වල මුදල් නෝට්ටු තැබීමෙන් වළකින්න.
- කිසියම් වැඩක යෙදීම නිසා අපිරිසිදු වූ අත්වලින් මුදල් නෝට්ටු පරිහරණය කිරීමෙන් වළකින්න.
- කාසි එකතු කරන කැට තුළට මුදල් නෝට්ටු ද දැමීමෙන් වළකින්න.

## ව්‍යාජ මුදල් නෝට්ටුවක් හඳුනාගන්නේ කෙසේද?

සංසරණයේ පවත්නා මුදල් නෝට්ටු අතර (විශේෂයෙන් රු 100/- ,රු 500/- රු 1000/-) ව්‍යාජ මුදල් නෝට්ටු ද තිබෙන අවස්ථා කිහිපය දී දක්නට ලැබුණි. එම නිසා විශේෂයෙන් වැඩි වටිනාකම් නෝට්ටු භාවිතයේ දී ප්‍රවේශම් වන්න.

ව්‍යාජ මුදල් නෝට්ටු අව්‍යාජ නෝට්ටු වෙන්කර ගැනීම සඳහා මුදල් නෝට්ටු සැලසුම් කිරීමේදී ආරක්ෂණ සළකුණු කිහිපයක් ඇතුලත් කර ඇත. ඒවා අතර,

**දිය සලකුණ** : දිය සලකුණ ලෙස ජාතික කොඩියේ සිංහයා ඇතුලත් කර ඇති අතර 1995 වර්ෂයට පෙර නිකුත් කරන ලද මුදල් නෝට්ටුවල මෙම සිංහ රූපය එක සේ දීප්තිමත්ව 1995 න් පසු නිකුත් කරන ලද මුදල් නෝට්ටු වල සිංහයාගේ අතැති කඩුව රූපයේ ඉතිරි කොටසට වඩා දීප්තිමත්ව පෙනෙන අයුරින් යොදා ඇත.

**ආරක්ෂණ නූල** : මෙය ආකාර කිහිපයකින් දැකිය හැකිය.

- 2002 ට පෙර නිකුත් කරන ලද රු 1000 සහ 500 නෝට්ටුවල තැනින් තැන මතුවී පෙනෙන මි.මි 1.5 ක් පමණ පළලින් යුත් ස්ටාර් ඩස්ට් නැමැති රිදී පැහැති ලෝහමය පටියක් ලෙසින් ද
- 2002 ට පසු නිකුත් කරන ලද රු 1000 නෝට්ටුවල මි.මි 4 ක් පළලින් යුක්ත ව කුඩයක වියමන ට සමාන මෝස්තරයක් සහිතව තැනින් තැන මතුවී පෙනෙන ස්ටාර් වයිඩ් නැමැති රිදී පැහැති ලෝහමය පටියක් ලෙසින්ද
- 2002 සිට 2005 දක්වා නිකුත් කරන ලද රු 500 නෝට්ටුවල මි.මි 3 ක පළලින් යුක්තව ශ්‍රී ලංකා ඩේසි මල් මෝස්තරය සහිතව තැනින් තැන මතුවී පෙනෙන ස්ටාර් වයිඩ් නැමැති රිදී පැහැති පටියක් ලෙසින්ද
- 2005 න් පසුව නිකුත් කරන ලද රු 500 සහ 2000 නෝට්ටුවල සමනල රූපයක් සහ නෝට්ටුවේ වටිනාකම ඉලක්කමින් සඳහන් වූ ද නෝට්ටුව දෙස විවිධ කෝණ වලින් බැලීමේ දී නූලෙහි වර්ණය කොළ පාටට සහ රතු පාටට වෙනස් වී පෙනෙන්නාවූ ද ස්ටාර්ක්‍රෝම් නැමැති තැනින් තැන මතුවී පෙනෙන ආරක්ෂණ නූල ද වශයෙනි.
- **විනිවිද පෙනෙන සළකුණු :** (See - through Features) නෝට්ටුවේ මුහුණත සහ පිටුපස එකිනෙකට සමපාත වන ආකාරයට මුද්‍රණය කර ඇති සමාන හැඩ තලයන් දෙකක් නෝට්ටුව ආලෝකයට එදිරිව තබා බැලීමේදී සමපාත වී පෙනේ.
- ඉන්ටැග්ලියෝ (Intaglio) මුද්‍රණ ශිල්ප ක්‍රමය අනුව නොට්ටුවේ ඇතැම් ස්ථාන අතට දැනෙන පරිදී උස් මට්ටමකින් මුද්‍රණය කිරීම.
- විශේෂ මුද්‍රණ යන්ත්‍ර මගින් අංකය මුද්‍රණය කිරීම සහ වර්ණ සංයෝජනය කර තිබීම.
- **මුද්‍රිත කඩදාසි** : 100% කපු මිශ්‍රිත පල්පයකින් නෝට්ටුවේ කඩදසිය සාදා තිබීම.
- කෝනර්ස්ටෝන් ආරක්ෂණ සළකුණ : 2005 න් පසුව නිකුත් කරන ලද රු 500 සහ රු 2000 නෝට්ටුවල කොන් සතරේ නෝට්ටුවේ විකර්ණ ලෙස දියවෙන්නාවූ ඉරි සහිත දිය සළකුණක් නෝට්ටුව දෙස ආලෝකය එදිරි ව තබා බැලූ විට විද්‍යාමාන වේ.
- **දිලිසෙන පටිය :** රු 2000 නෝට්ටුවේ පිටුපස රන් පැහැයෙන් දිලිසෙන පටියක් නෝට්ටුවේ සිරස් අතර මුද්‍රණය කර ඇත.
- **බහු ස්ථර සැඟවුණ සළකුණ** : නෝට්ටුව දෙසට යොමුකොට මදක් ඇල කර බැලීමේදී නෝට්ටුවේ පහළ මැද එහි වටිනාකම ඉලක්කමින් සඳහන් කර ඇති අයුරු දැකිය හැකිය.

මුදල් නෝට්ටු පවිත්‍රව තබා ගැනීම අපගේ වාසියට හේතුවේ එබැවින් මුදල් නෝට්ටු පවිත්‍රව භාවිතා කිරීම යහපත් පුරවැසියෙකුගේ යුතුකමක් ලෙස සළකමු.

## හානි වූ මුදල් නෝට්ටුවලට ගෙවීම කරණුයේ කෙසේද?

ඔබට වළක්වා ගත නොහැකි හේතුන් නිසා ( ගින්නෙන්,ජලයෙන්, කෘමීන්ගෙන් හෝ සතුන්ගෙන් ) ඔබගේ මුදල් නෝට්ටු වලට හානි සිදු වුව හොත් ඒ සඳහා වටිනාකම ගෙවීමේ බලය මුදල් නීති පණත යටතේ ස්ථාපිත ''ඊ'' රෙගුලාසිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවතී.

විකල වූ මුදල් නෝට්ටු සඳහා වටිනාකම් ගෙවනු ලබන්නේ හුදු අනුග්‍රහයක් වශයෙන් පමණක් වන හෙයින් එකී නෝට්ටු හිමි කරුට එය අයිතිවාසිකමක් ලෙස සලකා හිමිකම් පෑමේ අයිතියක් නොමැත.

## විකල වූ මුදල් නෝට්ටු සඳහා සම්පූර්ණ වටිනාකම ලබා ගැනීමට නම් එම මුදල් නෝට්ටු

- අව්‍යාජ විය යුතුය.
- විකල වූ මුදල් නෝට්ටුවේ ඉතිරි වී ඇති ප්‍රමාණය ආසන්න වශයෙන් එහි සම්මත ප්‍රමාණයෙන් 3/4 පංගුවක් වත් විය යුතුය.
- මුදල් නෝට්ටුවේ දකුණු පස හා වම් පස ඇති අංක දෙකින් එක් අංකයක් හෝ සම්පූර්ණයෙන් කියවා ගත හැකි විය යුතුය.
- මුදල් නෝට්ටුව කැබලි කිහිපයකට ඉරී වෙන් වී ඇත්නම් එම කැබලි එකම මුදල් නෝට්ටුවකට අයත් බවට හඳුනාගත හැකිවිය යුතුය.

## විකල වූ මුදල් නෝට්ටු සඳහා අර්ධ වටිනාකම ලබා ගැනීමට නම් එම මුදල් නෝට්ටු :

- අව්‍යාජ විය යුතුය
- මුදල් නෝට්ටුවේ ඉතිරි වී ඇති කොටස එහි සම්මත ප්‍රමාණයෙන් හරි අඩක් විය යුතු අතර, එම කොටස තනි කැබැල්ලක් ලෙසින් තිබිය යුතුය.
- අංකය සම්පූර්ණයෙන් හා පැහැදිලිව තිබිය යුතුය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති තුමාගේ විශේෂ බලතල අනුව සිය අභිමතය පරිදී ඕනෑම විකල මුදල් නෝට්ටුවක් සඳහා සම්පූර්ණ වටිනාකම ගෙවීමේ බලය එතුමා සතුව පවතී. විකෘති වී හෝ පලුදු වී ගිය මුදල් නෝට්ටුවක් ඔබ සතුව ඇත්නම් එහි වටිනාකම ගෙවිය හැකිදැයි සලකා බැලීම සඳහා එම මුදල් නෝට්ටුව කොළඹ, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ පිහිටි කවුන්ටර් අංශය වෙත යොමු කළ හැකිය.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදලේ වගතුග ඇසුරෙනි....**

# ශ්‍රී ලංකා පාබල හමුදා මෑණි ගේ 11 වන ළඳරුවා බිහිවිය.

හමුදා චර්‍යා නියෝග 38/2007 ප්‍රකාරව 2007 සැප්තැම්බර් මස 20 වන දින පෙ.ව 6.31 ට යෙදුනු සුභ මොහොතෙන් පනාගොඩ යුද හමුදා ජනපදයේ රෙම ශ්‍රිලපාහ කඳවුරේදී 11 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ලෙසින් ශ්‍රී ලංකා ද්වීපයේ රුදුරු ත්‍රස්තවාදීන්ගේ තර්ජන මැඩ පවත්වා සාමය උදා කිරීම අධිටනින් 11 වන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදාව ස්ථාපනය කරන ලදි.

මෙම නව ඒකකයේ අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් එස්පී විජේසූරිය ආර්එස්පී ශ්‍රිලපාහ චිරාගත සම්ප්‍රධායානුකූලව පොල්තෙල් පහන දැල්වීමෙන් පසු අණදෙන නිලධාරී අසුනට පැමිණි අතර සංඝයා වහන්සේලා දෙනමක් වැඩම කරවා නව ඒකකයේ අණදෙන නිලධාරී ප්‍රමුඛ නිලධාරී හා සෙසු නිලයින් පංච සීලයේ පිහිටුවා පිරිත් සජ්ජායනා මැද පෙ.ව 9.14 ට යෙදුන සුභ මෙහොතේ අණදෙන නිලධාරී ප්‍රථම ලියවිල්ලට අත්සන් කර තබා තෙරුවන්ගේ පිහිට ආරක්‍ෂාව ලබා ගන්නා ලදි.

ඉන් අනතුරුව මෙම විශේෂ අවස්ථාවට සහභාගී වු සියළු දෙනා වෙනුවෙන් ලුතිනන් කර්නල් එස්පී විජේසූරිය ආර්එස්පී ශ්‍රිලපාහ ගේ ප්‍රධානත්වයෙන් තේ පැන් සංග්‍රහයක් පවත්වන ලදි.
ශ්‍රී ලංකා යුධ හමුදාවේ ගුරු වශයෙන් හැදින්වෙන ශ්‍රී ලංකා පාබල හමුදාවේ පෞඩ ඉතිහාසයකට උරුමකම් කියන අතර එම පාබල මෑණිගේ සෙවන යටතේ බිහිවූ 11 වන බළඇණියේ ශ්‍රී ලංකා පාබල



මෙවන් වගකීම් සමුදායක් සමඟ පෙරට යෑමට ශක්තියක් ධෛර්‍යයක් වන්නට,

| | | | |
|---|---|---|---|
| මේජර් | එච්එන්එන්බී | මහතුවක්කාර ආර්එස්පී ශ්‍රිලපාහ | දෙවන අණදෙන නිලධාරී |
| මේජර් | සීඩී | රඹුක්පොත ශ්‍රිලපාහ | නි.අ ආධාරක කණ්ඩායම |
| කපිතාන් | කේඒඑස්එස් | කොළොන්නේ ආර්එස්පී ශ්‍රිලපාහ | විධායක අධිකාරී |
| කපිතාන් | කේපිඑල් | අමුණුපුරේ ආර්එස්පී ශ්‍රිලපාහ | නි.අ අණ හා පාලන කණ්ඩායම |
| ඔනි 1 | එස්එස්කේ | එදිරිසිංහ ආර්එස්පී | රෙජිමේන්තු සැරයන් මේජර් |
| ව/සැරයන් | | සිල්වා ඒජේඑන්කේ | ප්‍රධාන ලිපිකරු |

අණදෙන නිලධාරිතුමන් හට තම දැනුම හා අත්දැකීම් කැටි කර පූර්ණ සහයෝගය ලබාදීමට අවස්ථාව ලැබී ඇත.

11 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට එක්වූ සියළුම නි/සෙසු නිලයන්ට රෙජිමේන්තු අධිපති තුමන් හා සේනාවිධායක තුමන් ඇතුළු සියළුම නිලයන්ගේ සුභ පැතුම් මෙසේ එක්කරනු ලබන අතර,



හමුදාව වෙත අද වගකීම් සමුදායක් සහිතව රට වෙනුවෙන් සේවය කිරීමට අවස්ථාව සැලසී ඇත. වසර 25 කට අධික කාලයක් තම උපන් මව් බිමේ උරුමය නැතිකොට දෙකඩ කරන්ට දඟලන උතුරු නැගෙනහිර ත්‍රස්තවාදින් ගේ ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීමට මෙන්ම හදිසි අවස්ථාවන් වලදි රටේ භෞමික අඛන්ඩතාවය මෙන්ම සාමය ආරක්‍ෂා කිරීමටත් කැප කිරීම සිදුවනු ඇත.

''සේවය කරමි'' උද්ධෘත පාඨය පෙරටු කරමින් ශ්‍රී ලංකා මෑණිගේ නිදහස නිවහල් භාවය උදෙසා යුද බිමේ මෙන්ම අනිකුත් අවස්ථාවන් වලදී වික්‍රමයන් පෙළහරපෑමට ත්‍රිවිධ රත්නයේ පිහිට ආරක්‍ෂාව මෙන්ම සියළු දෙවි දේවතාවන්ගේ පිහිට ආරක්‍ෂාව ලැබේවා යැයි අප ප්‍රාර්ථනා කරමු.

රෙම ශ්‍රිලපාහ

# 14 (සෙවි) ශ්‍රී ලංකා පාබල හමුදාවේ 2 වන අණදෙන නිලධාරි තනතුර භාර ගැනීම


1996.12.30 දින කයිට්ස් දූපතේ වේලනි මහා විද්‍යාලයේ ස්ථාපනය කරන ලද මෙම ඒකකය වෙත 2 සහ 5 (සෙවි) ශ්‍රිලපාහ ඒකකය වෙතින් 2 වන අණදෙන නිලධාරි තනතුර සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පත්ව ආ අතර, එය වෙනත් මුහුණු වරක් ගනිමින් ඒකකයේම ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු එම තනතුර සඳහා පත්වීම සුවිශේෂ අවස්ථාවක් විය.

එනම් 2007. 06. 25 දින දක්වා ඒකකයේ 2 අණදෙන නිලධාරී තනතුර හෙබවූ නි/3170 මේජර් එම්ටීකේආර් සිල්වා ශ්‍රිලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරී එම තනතුර අතහැර එදින සිට බලපාන පරිදි 22 ශ්‍රිලංජාආබමු ඒකකයේ අණදෙන නිලධාරී තනතුර සඳහා නික්ම යන ලදි. පුරප්පාඩු වූ එම තනතුර ඒකකයේම නිලධාරියෙකු වන නි/3389 මේජර් එම්පී රාමනායක ශ්‍රිලපාහ විසින් 2007.06.25 දින සුභ මොහොතින් භාර ගන්නා ලදි.

සැකසුම : සෙ/14ඞී 00263 ලාකේ ශාන්ත කුමාර එම්එම්ආර්

# නව තනතුරු ලැබූ ඔබලාට රෙජිමේන්තු අධිපති ඇතුළු සියළුම නිලයින්ගේ

# උණුසුම් සුභ පැතුම්



11 ශ්‍රීලපාහ
අණදෙන නිලධාරි
ලුතිතන් කර්නල්
එස්පී විජේසූරිය ආර්එස්පී ශ්‍රීලපාහ



14 (සේවා) ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
මේජර් එම්පී රාමණායක ශ්‍රීලපාහ



1 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
මේජර් එන්ජීකේ ගුණසේන ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ
මානි II මේජර් එච්එම්යූ හේරත්
ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ
ප්‍රමානි II කපිතාන් ඩීඩීවීඑස් පෙරේරා ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ
ප්‍රධාන ලිපිකරු
බනි I ටීඑල් විජේවර්ධන



ජාතික කඹ ඇදීමේ තරඟාවලිය 2007 - ගතේ ශක්තියෙන් ශූරතාවය දිනූ ශ්‍රීලපාහ කණ්ඩායම

# මියගිය රණවිරුවාණෙනි

පෙරදා සතුරෝ අප දේශය  වනසද්දී
ආවා යුධ පෙරමුණට දේශය  රකින්නට
අව් වැසි රෑ දහවල් නොබලා  නිරන්තර
කෙරුවා සටන් සතුරගේ බළ  බිඳින්නට

තිබුණා සිතේ එඩිතර ගති  නිරන්තරේ
සතුරට ඉඩක් ලැබුනේ නැහැ  කිසිමවිටේ
ආවත් වෙඩි උණ්ඩ ලයටම  නිරන්තරේ
ගියෙ නැහැ ඔබලා ආපස්සට  සිහලපුතේ

පෙන්වා නියම සිහල ගති  වීරලෙස
කෙරුවා සටන් සතුරෝ වනසමින්  හොඳ
ආවා මචෝ ඔබ තුරුලට සිනා  සරින්
මැරුණා රටේ ඔබ උත්තම වීරයෙක්  ලෙසින්

ඔබ හෙළු රුධිරේ මේ පොළවට මුතු  වුවා
ඔබගේ සුසුම් මඳ පවනක් වී  හැමුවා
ආදර ලක් අම්මා ඔබෙ නාමෙන්  හැඬුවා
ඔබ වීරයෙක් ලෙස ලෝකෙම  පිළිගත්තා

ඔබගේ ගමන්  මග අපි යන්නෙමු  හැමදාම
එය වෙයි ඔබට අප කරනා  උත්තමාචාර
ඔබ යයි මතු නිර්වාණෙට  සොයුර
ඔබෙ නම ලියවිලා ඇත ලක් ඉතිහාසයේ
සිහල

සෙ/315996
ලාකො ප්‍රියදර්ශන පීඑ්ඩී
පාලන කණ්ඩායම - 6 ශ්‍රිලපාහ

# රට දැය රැකුම මූලික අදිටනම විය

මුළු ජාතියෙම බර ඔබ කර පිටට  ගෙන
සතුරන් නසන විට දැනට සවිය  ගෙන
ඒකම නිවන් දක්නට ඇති එකම  පින
ඔබේ නම තිබේ හෙළ ජාතියෙ පැතුම් ගෙන

සෙ/312686 ලාකෝ චමින්ද ඩබ්ලිව්ටී
ආධාරක කණ්ඩායම 4-ශ්‍රිලපාහ

## එක්වෙමු
# මව් බිම රැකගන්න

★★★★★★★★★★★★★★★

උදාරවී සෙබළුනේ තමුන්ගේ
රට වෙනුවෙන් ලේ හෙලනා
ත්‍රස්තවාදය සුනු විසුනු කලා..........
ඒ විස්තර නම් තවම තිබෙනවා
අප සෙබළුන්ගේ සිතේ............
නංගියේ , මල්ලියේ , අයියේ , අක්කේ
ඔබට පුළුවනි නැගී සිටින්නට
අපගේ සෙබළුන් පෙර කළ වීර ක්‍රියාවන්
සිහි කරමින්..........
නැගී සිටිමු මේ රට බේරාගන්න සිතා........
ත්‍රස්තවාදීන්ට බෑ මව් බිම විකුණන්නට.
ඉඩ දිය නොහැකිය මව් බිම වනසන්නට
එක්වීලා අපි සටන්වදිමු අද මේ මව් බිම රැක ගන්නට..........

**සෙ/313552 සාසෙ තිලකරත්න ආර්එම්ඒ**
7 ශ්‍රිලපාහ - ඒ කණ්ඩායම

★

# ඔබ මගේ දිවියේ ආලෝකයයි

සිහිනයක්ව තිබූ ජීවිතයට
ආලෝකයක් වූයේ ඔබයි
ඔයා මැණිකේ මගේ ජීවිතයට
ලැබුන දෙව් දුවයි........
දයාබර පෙම්වතියක්......සොයුරියක්
මිතුරියක්......
ඔක්කෝටම වඩා මට
අම්මා කෙනෙක්
මගේම මැණිකේ නංගියේ
අපි දුරින් උන්නත්
අපේ හදවත් සැම දින
එක ලඟ රැදෙනා අපිවෙමු  භවෙන් භවේ
එක ඉත්තක පිපි මල් ලෙසිනා

සෙ/9 ඩී 01327
**සාසෙ සෙනෙවිරත්න එස්ඒටීකේ**
බී - කණ්ඩායම



# අම්මා කෙනෙක් වෙන්න යන තාත්තා කෙනෙක්

## දරු ප්‍රසූතියට සූදානම් වන ලෝකයේ පළමුවැනි "පිරිමියා" - ලී මින්වයි

ඔබ කෙදිනකවත් මෙය විශ්වාස නොකරනු ඇත. එහෙත් ස්වභාව ධර්මයට විරුද්ධව ගිය මේ සිදුවීම අද ලෝකයේ එක් ස්ථානයක සිදුවී ඇති අලුත්ම අලුත් පුවතකි. මිහිතලයේ මිනිසාගේ මුල් උපතේදීම ස්ත්‍රිය බිහිවුනේ මිනිස් සංහතියේ පැවැත්ම අඛණ්ඩව ගෙනයාම සඳහා දරුවන් බිහිකිරීමටයි. ඒ හේතුවෙන් ස්ත්‍රී පුරුෂ දෙදෙනකුගේ සංවාසයේදී එකිනෙකාගේ හෝමෝන සංයෝජනය වීමෙන් දරු ගැබක් හට ගැනීම ස්වභාවික සිරිතකි. ඒ අනුව ස්ත්‍රියක් ගැබ් ගැනීම සාමාන්‍ය දෙයකි. නමුත් පුරුෂයෙකු ගැබ් ගැනීම අසාමාන්‍ය දෙයකි. අද මේ සිදුවීම සිදුවී හමාරය. මේ අනුව පිරිමියෙකු ගැබ් ගැනීම කෙසේවත් විශ්වාස කිරීමට අපහසු වූද අද්භූතවූද කරුණක් වුවද, ස්වභාවධර්මයට එරෙහිව ගිය ප්‍රතික්‍රියාවක් හේතුවෙන් දරු ගැබක් විසින් අසම්මත ආකාරයට පුරුෂයා ආක්‍රමණය කිරීමක් ලෙස මේ ගැබ් ගැනීම සැළකිය හැකිවේ.




මෙසේ ලොව පළමු වරට දරු ප්‍රසූතියක් සඳහා සූදානම් වන පිරිමියා වන්නේ ඇමෙරිකාවේ ජීවත්වන තායිවාන් ජාතිකයෙකු වූ ලී මින්වයි. මහතාය. (Mr.Lee Mingwei ) තොරතුරු ගලා එන ආකාරයට ලී මහතාගේ වුවමනාවත්, උත්සාහයත් නිසාම තම කුස තුල දරුගැබක් සදාගෙන ඇති බවකි වාර්තාවන්නේ, ස්ත්‍රියක් හා පුරුෂයෙකු අතර සංසර්ගයේ යෙදීමේදී සිදුවන ක්‍රියාවලිය මෙහිදී ලී මහතා අතින් සිදුවී නොමැත. එහෙත් දරුවන් උපද්දවීම සඳහා කාන්තාවන් විසින් ගිලිනු ලබන හෝමෝන අඩංගු පෙති වර්ග කාලයක සිටම ලී මහතා විසින් අඛණ්ඩව පාවිච්චි කර ඇත. අද ලෝකයේ දරුවන් නොමැති මව්වරුද දරුඵල ලබාගැනීමට අවශ්‍ය හෝමෝන අඩංගු බෙහෙත් වට්ටෝරු පාවිච්චි කිරීමේදී ඉන් විපුල ඵල ලබා ඇත. ඒ ආකාරයට ස්ත්‍රී හෝමෝන අඩංගු බෙහෙත් වට්ටෝරු ක්‍රමාණුකූලව ශරීරයට ලබා ගැනීමේදී දරු ගැබක් විසින් 'ලී' මහතාව ග්‍රහණය කරගැනීමට අවස්ථාව සකස් වී ඇත. මෙසේ අස්වාභාවික ආකාරයට පුරුෂයෙකුගේ උදරය තුළ දරු ගැබක් හට ගැනීම පිළිබඳව පර්යේෂණයක් කර ඇති ඇමෙරිකාවේ නිව්යෝක් නගරයේ (RYT Hospital, Dwayne Medical Center, New York) ආර්. වයි. ටී. රෝහලේ වෛද්‍ය වරුන්ගේ මතය වී ඇත්තේ ද දරුවන් පිළිසිඳ ගැනීමට අවශ්‍ය හෝමෝන ශරීර ගත වීමේදී ස්ත්‍රියකගේ උදරය තුළ ඇතිවන ක්‍රියාවලියට සමානව ''ලී'' මහතාගේ උදරයේ ද දරු ගැබක් සඳහා කුහරයක් හා ගැබක් ඇතිකර දරුවකු පිළිසිඳ ගැනීම සිදු වී ඇති බවයි. එසේම ස්ත්‍රී හෝමෝන සහිත බෙහෙත් පෙති වර්ග ක්‍රමානුකූලව පාවිච්චි කිරීමේදී පිරිමියෙකුට වුවද තමන්ගේ උදරයේ අභ්‍යන්තරීය ඉන්ද්‍රයයන් වුව අනියම් ආකාරයට කැමති කරවා ගැනීමට ශරීරයට ගන්නාවූ ප්‍රභල වූ බෙහෙත්වර්ග වලට ශක්තියක් ඇති බවත් එහෙත් එයද විරලව සිදුවන්නක් බවද වෛද්‍ය මතයයි.

එසේම ලී මහතාගේ දරු ගැබ ස්ත්‍රියකගේ කුසතුල උපදින දරුගැබක් සේම සාමාන්‍ය එකක් බව එකී වෛද්‍යවරු සහතික කර ඇත. එහෙත් මෙහි ඇති භයානක පැත්තනම් 'ලී' මහතාට තම දරුවා බිහි කිරීමට ස්ත්‍රියකට මෙන් ස්වාභාවික මාර්ග ක්‍රමයක් නොමැති වීමයි. ඒ හේතුව නිසා ලී මහතා අනිවාර්යයෙන්ම සීසර් සැත්කමකට (Cesarean Section) භාජනය වී දරුවා එළියට ගැනීම කළ යුතුවේ. තවද දරු ප්‍රසූතිය සඳහා ලී මහතාට සීසර් සැත්කමක් කිරීමද භයානක මෙන්ම අන්තරාදායක වුවක්ද විය හැකි බව පවසා ඇත. ඊට හේතු වශයෙන් වෛද්‍යවරු දක්වන්නේ ස්ත්‍රියකගේ උදරය තුළත් පුරුෂයෙකුගේ උදරය තුලත් පිහිටීම එකිනෙකට වෙනස් බැවින් සීසර් ශල්‍යකර්මයක් මුල් වරට අත්හදා බැලීම් තත්ත්වයේ සිදුකෙරෙන්නක් නිසාත්, ලෝකයේ කිසිම රෝහලක ලී මහතාට සීසර් ශල්‍යකර්මයක් කිරීමට භාර ගැනීමට නීතිමය අවසරයක් නොමැති බවත්ය. ලෝකයේ මුල්වරට නළ දරු වකු බිහිකර ඇත්තේ 1978 වර්ෂයේදීය. අත්හදා බැලීමක් වශයෙන් කරන ලද ඒ පළමු නළ දරු උපතෙන් පසුව එවන් දරුවන් බිහි කිරීමට නීතිය ඉඩ නුදුන්නේද ඊට සාධාරණ හේතුන් ඉදිරිපත් කරමිනි. එබැවින් ස්වභාව ධර්මයට එරෙහි වීමක් නොමැතිව ලොව පවතින නීතියද සැලකිල්ලට ගෙන අනාගතයේදී මුහුණ දීමට මතු විය හැකි ප්‍රශනයක් නිසා මෙවන් දරු උපත් ලෝකයේම තහනම් කර ඇත.

ලී මහතා පවසන්නේ කෙසේ හෝ දරුවෙකු බිහිකර ගැනීමට තමා බොහෝ කාලයක සිට බලාපොරොත්තුව සිටි බවත්, අද ලෝකයේ වෛද්‍ය විද්‍යාව ඉතාමත් දියුණු තත්ත්වයක පවතින මෙවන් යුගයක තමා පැතූ ආකාරයට තම කුසින් දරුවෙකු බිහිකර ලොවට ගෙන ඒමට ලැබීම ජීවිතයේ ලබන විශාලම සතුට බවත් ඔහු පවසා ඇත. එසේම තමා දරුවෙකු මේ ආකාරයට ලොවට බිහිකර පෙන්වන්නේ ස්ත්‍රියක් විසින් දස මසක් කුස තුල ගැබ් බරක් දරා වේදනා විඳ, දරුවකු ලොවට බිහිකර දුන් වේදනා බර පැත්ත පිරිමියෙකු දැනගත යුතු බවද ''ලී'' මහතාගේ අදහසයි. එසේම දරු ගැබක් තමාගේ කුස තුළ දරා සිටීම අසම්මත දෙයක් වීමත්, එනිසාම තමාට සමාජයෙන් එන උසුළු විසුළු මෙන්ම නින්දා පවා අසන්නට සිදුවී ඇතැයි ඔහු පවසා ඇත. දරුවා බිහිවීමෙන් පසු දරුවාගේ උප්පැන්නයේ පියාගේ හා මවගේ විස්තර කෙසේ සටහන් වේද? දරුවාට සමාජයේ කුමන තැනක් හිමිවේද? කුමන නම් සාමාජීය ගැටළු වලට ඉදිරියේදී ඔහුට මුහුණ පාන්නට සිදුවේද? ප්‍රශ්ණ රාශියකි.

**පොත පත හා අන්තර් ජාලය ඇසුරෙන්**

# ලොවට එපාවී ලොවම කළකිරී හිඳිනා යුද්ධය

ඝන කැළෑ .......කටු වදුල්
ගිරි දුර්ග.......ඇළ දොළින්.........
බාධකව.......නිවී නැතිව........
දෙපයින්ම........ හතිදමා........
යුධ ඇඳුම් ගත පැළඳ..........
විසල් බර කර දරා.........
දෑත් වල අවි දරා.......
නිතැතින්ම.......විමසිල්ලෙන්........
දහඩියෙන් ගත තෙමී.........
රුධිරයද සිරුණු තැන.........
කුසට නිසි වෙලාවට......
අහර...ජල....පවා හැර.......
විඩා බර ඇත්කර.......
සතුරු බල බිඳලන්න.......
හෙළ දෙරණ රැකා ගන්න........
රැකා දුන්න.......
විවිධ මෙහෙයුම් තුලින්......
යුද බිමෙහි ඉදිරියට........
පා නැගූ පෙර දවස.......
සිත මැවේ....පැහැදිලිව.....
ටක...ටකස්...වෙඩි හඬක්.....
වර....බරස්.....බර... වෙඩියි....
භූමියම දෙදරා යයි.....
රුධිර ධාරා ගලායයි.....
තුරු ලතා ඇද වැටෙයි.....
පරිසරය අඳුරුවෙයි.......
සිවුපාවො......කුරුළු කැල්......
සැම බියෙන්.......පසු තැවෙයි........
වණ අසිරි වියැත යයි........
වටිනා දිවි නිවී යයි........
දුබල අය ගොඩ ගැසේ........
හෙළ වරුන් අඩුව යයි......
යුද්ධයේ ගිනි දැලින්.......
ලකඹරම අඳුරු වෙයි.......
අතලොසක් දණ සැලෙයි......
පසුතැවෙයි..සදාකල්......
රට මගෙයි....... දය අපෙයි.......
බොහෝ දෙනා හඬ නගයි.......
හෙළ බිමට රණ විරුන්........

*බනි1 බීඩී සුජීව - විශ්‍රාමික (8 ශ්‍රීලපාහ)*



**2000.04.22 වන දින අලිමංකඩ දී අතුරුදන්වූ 6 ශ්‍රීලපාහ සී කණ්ඩායමේ සෙ /307870 ලාකෝ සම්පත් රණවිරු අයියාට උපහාර පිණිස.........**

# සත්තයි අයියේ නුඹ වෙනුවෙන් දිවි දෙන්නම්............

ලොවටම අඳුර දී හිරු ක්ෂිතිජයේ හැංගී
ආ හැටි එළිය දී සඳ සාවිය සැංගී
කඳුලැල් තබාගෙන නිති ඇස් යට සැංගී
මේ කවි පද ගොතන මම සම්පත් ගේ නංගී

අම්මා නැතිව මා සිටියේ කුඩා කල
තාත්තා නැතිව සිටියේ මා කුඩා කල
තනියක් දැනුනේ නෑ අයියා සිටින කල
මට දෙවි කෙනෙකි පහළ වු ඔහු මේ ලකල

පියා නැති වුනත් දුක නෑ සිත රැඳුනේ
කාලය ගෙව්වේ සතුටිනි අප නුඹ සෙවනේ
යුධ අවි අතදරා නුඹ සිටි විට තල් සෙවනේ
සිටිනා අපව සිහිවිද මිත්තනියගේ සෙවනේ

ආදර සිනාවක් නිතරම මුව රන්දා
දිවි ගැට ගසා ගන්නට නුඹ දුක් වින්දා
ඒ දුක අනේ අපහට නුඹ නොම දුන්නා
බුදු රුව මැවුනි නුඹගේ රුව සිත රන්දා

උරුම නොවුනි සොඳුරු ලොවක් අනෙ ඔහුට
උරුම කරන්නට සිතුවා ඒ ලොව නංගිලට
පණ වුනි නිති අප තිදෙන අනෙ ඔහුට
ළඟවත් නෑනෙ අනෙ ඔහු පාමුල වැටෙන්නට

අවුරුදු හයක් ගෙවුනා නොදැනිම අයියේ
අද එනවාද හෙට එනවාද නුඹ අයියේ
පෙර මග බලා සිට නුඹ එනතුරු අයියේ
අම්මත් වියපත් වෙලා ආදර බර අයියේ

අම්මේ බය නෑනේ මා මෙහි මිය යන්ට
එනමුත් බෑ අනේ මට දුක් විඳින්නට
නංගිලා සමග සිහිවෙයි නුඹ විටින් විට
එනමුත් දෙන්නේ නෑ මම රට බෙදන්නට

එඩිතර වදන් නුඹ නිතරම තෙපලාලා
බිය රැඳි අපේ සිත් සැමවිට සනසාලා
කල් ගෙව්වානේ නුඹ මුර කුටියට වීලා
අයියේ දැන් නුඹ තුන්ලොවේ වීරයා වීලා

නුඹ දුක් වින්දේ අප සතුටින් තබන්නට
නුඹ කැප වුනා අප ලොව මල් පුදන්නට
ආදර නුඹේ සිහිනය ඉටු කරලන්නට
කැප වුනේ අනේ මා මගෙ දිවි දෙවැනි කොට

හිරු කුමරුගෙන් නුඹ සිටිතැන අහන්නද
සඳ සාවගෙන් නුඹ සිටිතැන අහන්නද
පියාසලාවත් එන්නට බැරිවාද
අප පණ රැක්ක නුඹ අද කොහි සිටිනවද

ආදර අයියා නැති වුවා අනෙ අපට
සෙබළෙකු නැති වුනා අපගේ ලක් මවට
නුඹ නැති අඩුව දැනෙනව මට විටින් විට
එන්නද අයියේ පියඹා මා නුඹ ලගට

බත් වෙනුවට අද ගින්දර කන අපට
පැන් වෙනුවට උණු කඳුලැලි බොන අපට
සතුටක් වුවත් දුකසේ දැනෙනා අපට
එනු මැන අයියේ සිසිලක් වී අප ලගට

අයියේ නුඹ බත් කටක් වත් අද කෑවාද
පවුලේ සැවොම නුඹේ මතකෙට එනවාද
කොතනද නුඹ ඉන්නේ කියලා මට එවනවද
මගෙ ජීවිතේ දෙන්නම් නුඹ එනවාද

සරසවි සිහිනයක් සිතතුළ තිබුනාට
ඒ ගැන සිත සිතා නිති දුක් වින්දාට
අයියා නැති අඩුව පුරවන්නට රටට
යුධ සෙබළියක් වී එන්නෙමි යුධ බිමට

සතුරන් අතට නුඹේ ජීවිතය පත් වීනම්
නුඹ කල් ගෙවන්නේ සිර කුටියට වී නම්
නුඹගේ තැනට මට පැමිණෙන්නට ඇත්නම්
සත්තයි අයියේ නුඹ වෙනුවෙන් දිවි දෙන්නම්

ලාකෝ සම්පත්ගේ
නැගණිය ශානිකා
උණවටුන - ගාල්ල.





## රණවිරු සේවා අධිකාරිය


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1999 අංක 54 දරණ පාර්ලිමේන්තු පනත මගින් සම්මත කෙරුණු ආයතනයකි.

### දැක්ම

රණවිරු නාමයට ජාතියේ කෘතගුණ දැක්වීම.

### මෙහෙවර

ශ්‍රී ලංකාවේ ඒකීයභාවය සුරක්ෂිත කරනු වස් ජීවිත පුදකළ, අතුරුදන්,ආබාධිත, රණවිරුවන්ගේ පවුල්වල මානසික හා සමාජීය ස්ථාවරත්වයක් ඇති කිරීම හා සේවයේ නියුතු රණවිරුවන් සහ එම පවුල්හි මානසික ප්‍රබෝධයක් ඇති වන අයුරින් ක්‍රියා කිරීම........




# රණවිරු අභිමන

2000 වර්ෂයේ දී ආරම්භ කළ රණවිරු අධිකාරිය මේ දක්වා රණ විරුවන් හා රණවිරු පවුල් සමාජිකයන් ගේ මනෝ සමාජීය සුභසාධන සේවාවන් ව්‍යාපෘතීන් ගණනාවක් ඔස්සේ ක්‍රියාත්මක කර ඇත.

## රණවිරු සේවා අධිකාරිය මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- සංසද ව්‍යාපෘතිය
- මනෝ සමාජීය ව්‍යාපෘතිය
- ඉඩම් ව්‍යාපෘතිය
- නිවාස ව්‍යාපෘතිය
- අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය
- නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය
- ආබාධිත රණවිරු සුභසාධන ව්‍යාපෘතිය
- රණවිරු ගම්මාන ව්‍යාපෘතිය
- සහන ණය අරමුදල ව්‍යාපෘතිය
- ජාතික රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය සහ යහසාදන



### සංසද ව්‍යාපෘතිය

දිවයින පුරා විසිරී සිටින රණවිරු පවුල් ප්‍රාදේශිය මට්ටමින් ඒකරාශි කර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 267 ක රණවිරු සංසද පිහිටුවමින් සෑම පළාත් ආණ්ඩුකාර කාර්යාලයකම සේවයේ රඳවා ඇති අධිකාරියේ පළාත් නිලධාරීන් හරහා රණවිරු සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාලය හා නිවැරදි මාර්ගෝප දේශකත්වයක් මගින් සේවාවන් ලබාගැනීමට යොමුකරවීම.

### මනෝ සමාජීය ව්‍යාපෘතිය

ආත්ම විශ්වාසයෙන් යුතු තෘප්තිමත් රණවිරු පවුල් සාමාජික පිරිසක් බිහිකිරීම පෙරදැරි කරගනිමින් රණවිරු පවුල් සාමාජිකයන්ගේ සුවිශේෂී ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා සහය ලබාදීමත් ඔවුන්ව නිෂ්පාදන ක්‍රියාවලීන්ට යොමු කරවීමත් මඟින් යහපත් ජීවන පසුබිමක් සැකසීම එමගින් රණවිරු කාන්තා සවිබල කරණයත් / අසරණභාවයට පත් රණවිරු දෙමාපියන්ට රැකුලක් වන කැපකරු මාපිය ආධාර වැඩසටහනත් මනෝ - උපදේශන සේවාවත් ක්‍රියාත්මක කෙරේ.

### නිවාස ව්‍යාපෘතිය

සෑම රණවිරුවෙකු සඳහාම ස්ථිර නිවසක හිමිකම ලබාදීමේ දැක්මෙන් යුතුව ඇරඹි මෙම ව්‍යාපෘතිය මගින් ඉඩමක හිමිකම ඇති රණවිරුවන්ට හා ලඟම ඥාතීන්ට මූල්‍යමය ආධාර ලබාදීම හා ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය තාක්ෂණික උපදෙස් මඟපෙන්වීම මගින් නිවාස ඉදිකිරීමකට /ප්‍රතිසංස්කරණයට සහ ආපදා අවස්ථාවලදී නිවාස ඉදිකිරීමට සහය වීම.

### ඉඩම් ව්‍යාපෘතිය

තම වාසයට සුදුසු නිවසක් සාදා ගැනීම සඳහා ඉඩමක් නොමැති රණවිරුවන් හා එම පවුල්වල සාමාජිකයන්ට නිවසකට සුදුසු රජය සතු ඉඩමක් ලබා දීම හෝ පුද්ගලික ඉඩමක් මිළදී ගැනීම සඳහා සහන ණය ලබාදීම.

### අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

ආර්ථික අපහසුකම් ඇති රණවිරු පවුල්වල දරුදැරියන්ගේ අධ්‍යාපන කටයුතු නිසි අයුරින් පවත්වා ගනිමින් සාර්ථක ප්‍රතිපල අත්කර ගැනීමට අත්වැලක් වීමත් ඔවුන්ව උසස් අධ්‍යාපන කටයුතු සඳහා යොමු කිරීමත් මෙමගින් අපේක්ෂිත අරමුණකි.

### නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය

රණවිරු පවුල් සාමාජිකයන්ගේ ආත්ම විශ්වාසය වර්ධනය කරමින් ඔවුන්ගේ හැකියාවන් සහ සහජ කුසලතාවන් අනුව විවිධ ක්ෂෙත්‍රයන් ඔස්සේ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබාදෙමින් හැකියාවන් වර්ධනය කර ආදායම් ඉපයීමේ වෘත්තීන් හා මාර්ග වලට යොමු කිරීම.

### ආබාධිත රණවිරු සුභසාධන ව්‍යාපෘතිය

රට දැය වෙනුවෙන් කැපවී කටයුතු කිරීමේදී තම ශරීරාවයව අහිමිවූ රණවිරුවන්ගේ ගැටළු හා අවශ්‍යතා සොයාබලා ඒ සඳහා උපකාර කිරීමත් ඔවුන්ගේ හැකියාවන් හා කුසලතාවන් වර්ධනය කර ආර්ථික ප්‍රගමනයකට දායක කරමින් දේශයේ සංවර්ධනයට දායක විය හැකි පිරිසක් බවට මානසිකව ශක්තිමත් කරමින් ආත්ම විශ්වාසයෙන් කටයුතු කළ හැකි පිරිසක් බවට පත්කිරීම.

### රණවිරු ගම්මාන ව්‍යාපෘතිය

අන්‍යෝන්‍ය අවබෝධයකින් හා සුහද තාවයකින් යුතුව සහජීවනයෙන් කටයුතු කළ හැකි ආදර්ශ ගම්මාන ලෙස මෙම රණවිරු පවුල් වලින් සැදුම්ලත් රණවිරු ගම්මාන රණවිරු නාමය මූර්තිමත් වන සේ පවත්වාගෙන යාම.

### සහනදායී ණය ව්‍යාපෘතිය

නව නිවසක් ඉදිකරගැනීමට නිවස වැඩි දියුණු කිරීම සහ නිවාස අළුත්වැඩියා කර ගැනීමට,ඉඩමක් මිලදී ගැනීමට, ස්වයං රැකියා,හදිසි ප්‍රතිකාර,ආබාධිත උපකරණ මිලදී ගැනීමට හා කුසලතාවන් වැඩි දියුණු කරගැනීමට සියයට තුනක සේවා ගාස්තුවක් පමණක් අයකර උපරිම ලක්ෂ දෙකක් වනසේ ණය ලබාදීම.


### ජාතික රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය සහ යහසාදන

අප මාතෘභූමියෙත් ජනතාවගේත් ආරක්ෂාව හා සුබ සිද්ධිය සඳහා ජීවිත පරිත්‍යාග කළ සහ ක්‍රියාන්විතයේදී අතුරුදන් අපේ යුගයේ රණවිරුවන් ජනතාවගේ සිත් සතන් තුලින් නොමැකී සදානුස්මරණය වන ලෙසත් අනාගත පරපුරට එම මහඟු කැපවීම සම්බන්ධ අවබෝධයක් හා හැඟීමක් ඇතිවන ලෙස ජනතාව දැනුවත් කරමින් ජාතික රණවිරු අනුස්මරණ දින ජාතික උත්සවය පැවැත්වීම සහ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් ජාතික රණවිරු අනුස්මරණ උද්‍යානය පවත්වාගෙන යාමත් මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.



මෙම ව්‍යාපෘතීන්ට අමතරව රණවිරුවන්ගේ සහ රණවිරු පවුල් සාමාජිකයන්ගේ පොදු සුබ සාධන සේවාවන් දුරකථන පහසුකම් /ස්ථාන මාරු/ දරුවන් පාසල්වලට ඇතුලත් කිරීම් / ජල, විදුලිය පහසුකම් සහ නීති සේවාවන් ලබාදීම කරනු ලබයි.

**රණවිරු සේවා අධිකාරියේ**
**රණවිරු අභිමත ඇසුරෙන්.......**



# වොලිබෝල් නීති රීති (අත් පන්දු)

වොලි බෝල් ක්‍රීඩාවට ඉතාමත් දිගු ඉතිහාසයක් තිබෙනවා. ඒ වගේම ලෝකයේ දෙවැනියට ප්‍රසිද්ධියක් උසුලන ක්‍රීඩාව ලෙසද, දෙවනියට වැඩිම නරඹන්නන් පිරිසක් සහභාගී වන ක්‍රීඩාව ලෙසද, හඳුන්වන්න පුළුවන් ලංකාවේ ජන සමාජයේ බහුතර කොටසක් කරන ක්‍රීඩාවක් හෙයින්ද ලංකාවේ ජාතික ක්‍රීඩාව හෙයින්ද මෙහි නීති රීති අප සැවොම දැන සිටීම ඉතාමත් වැදගත් වෙන බව මම දනිමි. මෙම ක්‍රීඩාවේ නිවැරදි නීති රීති නොදැන ක්‍රීඩා කිරීමේදී ක්‍රීඩාව වගේම ක්‍රීඩාවේ විනයද පිරිහීමට හේතු වෙයි.

අප ඒකක වල ශාරීරික අභ්‍යාස උපදේශකයින් බොහොමයක් සිටියත් ඔවුන් මෙහි නිවැරදි නිති රීතින් නොදැන සිටීම හේතුවෙන් විනිසුරුවකු ලෙස ක්‍රියා කිරීමට ඔවුන් අකමැත්තක් දක්වයි. ඔබ අතුරින් නිලධාරියෙකු හෝ සෙසු නිල ශාරීරික අභ්‍යාස උපදේශකයකු මෙම නීති රීති ඉතා හොඳින් දැන සිටින්නේනම් කිසිදු ගැටළුවකින් තොරව තරඟාවලියක් සංවිධානය කර නිවැරදි විනිශ්චයක් ලබාදී එම තරඟාවලිය සාර්ථක කර ගැනීමට මඟ පාදා ගත හැකිය.

එමෙන්ම වොලිබෝල් ක්‍රීඩකයකු ලෙස ක්‍රීඩා කරන සැමටත් වොලිබෝල් ක්‍රීඩාව පිළිබඳව උනන්දුව දක්වන සැමටත් මෙම නිතිරීති පෙළ උපයෝගී වේ යැයි මම විශ්වාස කරමි. මෙහි වොලිබෝල් ඉතිහාසය පිළිබඳවත් ජාත්‍යන්තර වොලිබෝල් නිති රීති ඉතා සරළවත් ඉදිරිපත් කිරීමට උත්සාහ කරමි. මෙම වොලිබෝල් නීති රීති පෙළ ජාත්‍යන්තර නීති රීති ඇසුරින් මෙන්ම ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාවේද (1995/1996) ඉගෙන ගත් නීති රීති දැනුම ඇසුරෙන් සකස් කරමි.

## වොලි බොල් ක්‍රීඩාවේ ඉතිහාසය

මෙම ක්‍රීඩාව ප්‍රථමයෙන් ලෝකයට හඳුන්වාදෙන ලද්දේ ක්‍රි.වඃ 1895 දී විලියම් ජී. මෝගන් මහතා විසිනි. එහිදී බාස්කට් බෝලයේ රබර් කෝෂය යොදා අඩි 06 ක් ඉහළින් කණු දෙකක දැලක් බැඳ ක්‍රීඩකයින් දෙපෙළට යොදා දැලට ඉහළින් බෝලය එහා මෙහා යවමින් ක්‍රීඩාව ආරම්භ කරන ලද අතර මුලින් මෙය "මිනිටො නෙට්" නමින් හඳුන්වන ලදි. 1896 දී මහාචාර්ය ඇල්ෆ්‍රෙඩ් හාල්ස්ටඩ් මහතා විසින් මෙම ක්‍රීඩාවේ ස්වරූපය අනුව මෙය "මිනිටෝ නෙට්" නොව වොලිබෝල් යනුවෙන් නම්කල යුතු බව යෝජනා කර එතැන් සිට වොලිබෝල් නමින් මෙය හඳුන්වන ලදි.

වොලිබෝල් ක්‍රීඩාව ලංකාවට හඳුන්වා දෙන ලද්දේ 1916 දී කොළඹ තරුණ ක්‍රිස්තියානි සංගමයේ ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂක වරයෙකු වූ රොබට් වෝලිටර් මහතා විසිනි. ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනයේ සභාපති ධුරය 1984 සිට මේ දක්වා හොබවන්නේ මැක්සිකන් ජාතික රූබ-න් ඩී ඇකොස්තා මහතාය. මූල්ම ජාත්‍යන්තර තරඟාවලිය 1949 දින චෙකොස්ලෝවැකේනියාවේදී පැවැත්වූ අතර එය පිරිමින් සඳහා පමණක් පැවැත්විණි. එහිදී සෝවියට් රුසියාව ශූරතාවය දිනාගත් අතර කාන්තාවන් සඳහා මුල්ම තරඟාවලිය 1952 දී පැවැත්විණි. එහිදී ද සෝවියට් රුසියාව ශූරතාවය දිනාගන්නා ලදි.

## පහසුකම් හා අවශ්‍ය උපකරණ


### නීති 01 ක්‍රීඩා ප්‍රදේශය

1. ක්‍රීඩා පිටිය හා නිදහස් කලාපය ක්‍රීඩා ප්‍රදේශය අයත් වෙයි.

### 1.1 ක්‍රීඩා පිටියේ මට්ටම

1.1.1 ක්‍රීඩා පිටිය මීටර් 18 දිග මීටර් 9 ක් පළල සෘජුකෝණාශ්‍රයක් විය යුතු අතර එය සීමාවෙන් පිටත නිදහස් ප්‍රදේශය අවම වශයෙන් මීටර් 3 ක් වත් විය යුතුය. ක්‍රීඩා ප්‍රදේශය මතුපිට නිදහස් ප්‍රදේශය ඇතුළු අවම වශයෙන් මීටර් 7 ක් දක්වා ඉහලට බාධක වලින් තොර විය යුතුය.

1.1.2 පිළිගත් ජාත්‍යන්තර තරඟ සඳහා නිදහස් ප්‍රදේශය පැති රේඛා වල සිට මීටර් 6 ක්ද පිටුපස රේඛාවල සිට මීටර් 9 විය යුතු අතර ක්‍රීඩා පිටිය සහ නිදහස් කලාපය මතුපිට සිට ඉහලට අවම වශයෙන් මීටර් 12.5 බාධක රහිත විය යුතුය.




### 1.2 ක්‍රීඩාංගනයේ මතුපිට

1.2.1 ක්‍රීඩාංගනයේ මතු පිට සමකල තිරස් සහ ඒකාකාරී විය යුතුයි.

1.2.2 ජාත්‍යන්තර තරඟ සඳහා මතුපිට දැව හා සින්තටික් වලින් සැකසීම පමණක් අනුමත කරනු ඇත.

1.2.3. ක්‍රීඩාංගනයේ මතුපිට ක්‍රීඩකයින්ට කුමණ හෝ අනතුරක් නොවන ආකාරයෙන් තිබිය යුතු අතර මතුපිට රළු හා ලිස්සන සුළු ජාත්‍යන්තර තරඟ සඳහා භාවිතා කිරීම තහනම් වේ.

1.2.4 ගෘහස්ත ක්‍රීඩාංගන වල ක්‍රීඩා පිටිය ලා පැහැති වර්ණයකින් තිබිය යුතුය.

1.2.5 එළිමහන් ක්‍රීඩාංගනවල දිය බැස යාම මීටර් 1 කට මිලිලීටර් 5 ක් බැගින් විය යුතුය. පිටියේ මායිම් රේඛා සහ ද්‍රව්‍යයකින් සෑදීම තහනම්ය.

## 1.3 පිටියේ රේඛා

1.3.1 සියළුම මායිම් රේඛා සෙ.මී.5 ක් පලළ විය යුතු අතර එම රේඛා දෙකකින් පිටිය හා අනෙකුත් රේඛාවලට වඩා ලා පැහැයකින් තිබිය යුතුය.

1.3.2. මායිම් රේඛා පැතිරේඛා දෙකකින් හා පසු පස රේඛා දෙකකින් පිටිය සළකුණු කර ඇති අතර ඒ රේඛා පිටියේ මුළු දිග හා පළලට ඇතුලත් විය යුතුය.

1.3.3 මාධ්‍ය රේඛා මධ්‍ය රේඛාවේ හරි මැදින් ක්‍රීඩා පිටියේ 9 x 9 මීටර් සමාන කොටස් දෙකකට බෙදන සේ දළට යටින් ක්‍රීඩා පිටියේ පැති රේඛා දෙක අතර සළකුණු කර තිබිය යුතුය.

## 1.4 ක්‍රීඩා පිටියේ කලාප

1.4.1 ඉදිරි කළාපය මධ්‍ය රේඛාවට සමාන්තරව වන ලෙස එහි අක්ෂයේ සිට මීටර් 3 ක් දුරින් පැති රේඛා දෙක අතර ඇදි ප්‍රහාරක රේඛාවෙන් (එම රේඛාවන් ඇතුළත්ව) ඉදිරි කලාපය වෙන් කෙරේ එම කලාපය සීමා රහිතව අවිනිශ-'චිත ලෙස පැති රේඛාවන් ඉක්මවා දීර්ඝ වූ බව සැළකේ.

1.4.2 පිරිනැමීමේ කලාපය මේ කලාපය ලකුණු කරන්නේ පසු-පස රේඛාවේ සිට එයට ලම්බකව සෙන්ටිමීටර 20 ක් දුරින් සෙන්ටි මීටර 15 දිග රේඛා දෙකකිනි. එක් රේඛාවකින් දකුණුපස ඇති රේඛාවට කෙලින් විය යුතු අතර අනෙක් රේඛාව මීටර් 9 ක් ඒ රේඛාවට ඈතින් විය යුතුය. රේඛා දෙකද කලාපයට අයත් වෙයි. පිරිනැමීමේ කලාපය නිදහස් කලාපයේ කෙළවර තෙක් දීර්ඝ ව ඇත.

1.4.3. ආදේශ කලාපීය දිර්ඝ කරන ලද ලෙස සලකා ප්‍රහාරක රේඛා දෙකක් සීමා වූ නිදහස් කලාපයේ ලකුණු සටහන් කරුගේ මේසය දක්වා ඇති ප්‍රදේශය ආදේශ කලාපය ලෙස හදුන්වයි.

## 1.5 උෂ්ණත්වය

ක්‍රීඩා පිටියේ අවම උෂ්ණත්වය 10°C කට වඩා අඩු නොවිය යුතුය. ජාත්‍යන්තර ගෘහස්ත තරග සඳහා ගෘහස්ත ක්‍රීඩාංගනයේ උෂ්ණත්වය 16°C ට වඩා අඩු නොවූ මෙන්ම 25°C ට වඩා නොවැඩි විය යුතුය.


1.6 ජාත්‍යන්තර තරග සඳහා ගෘහස්ත ක්‍රීඩාංගනයේ ආලෝකය ලක්ස් 1000 - 1500 අතර තිබිය යුතුය ඒ මිනුම ක්‍රීඩා පිටියේ මතුපිට සිට මීටර් 1 ක් ඉහළින් ගනු ලැබේ.

### නීති 2 - දැල සහ කණු

2.1 දැල

දැලේ දිග මීටර් 9.5 ක් ද පලල මීටර් 1 ක්ද විය යුතු අතර එය මධ්‍ය රේඛාවේ අක්ෂයට සිරස්ව තිබිය යුතුයි.

**නි/ 64600 කපිතන් පතිරණ ශ්‍රීලපාභ**
6 ශ්‍රීලපාභ



# විවාහය.......... අන්ධයා....... සහ කොරා

*විවාහයට පෙර ආදරය කියන්නේ කඩෙන් කෑමක්.......
ගියා...කෑවා....ආවා....ඒත් ? විවාහය තුල තියෙන ආදරය තියෙන්නේ උයාගෙන කෑම.. ඒක කඩෙන් කන තරම් ලේසි නැහැ.. බඩු ගන්න ඕනෙ.. ගෙදර ගෙනත් ඒදන්න ඕන... කෑම ඉදෙනකල් බලා ඉන්න ඕනෙ.. කෑම බෙදා ගන්න ඕනා.. පිඟන් සෝදන්න ඕනා.. ඒත් උයාගෙන කද්දි රසයි පිලිවෙලයි කඩෙන් කනකොට ලෙඩ හැදෙනවා ගෙදර උයන් කද්දී එහෙම නැහැ හොඳම දේ තමයි ටිකක් කල් ගියත්... ටිකක් මහන්සි උනත්...උයාගෙනම කන එක*

*විවාහයට පෙර ආදරය කරද්දි වගකීමක් නැහැ... හරියට පාරේ යන බස් එකේ යනවා වගේ නැග්ගා.. බැස්සා... ආවා.. ඒත්.. විවාහයේදී වගකීම් වැඩියි බැදීම් වැඩියි හරියටම තමන්ගේම වාහනයකින් යනවා වගේ...... එතකොට තෙල් ගහන්න ඕනා.. ඔයිල් මාරු කරන්න ඕනා.... රක්ෂණය කරන්න ඕනා... ලයිසන් ගන්න ඕනා..... මාර්ග නීතිරීති පිළිපදින්න ඕනා..... හප්පන්නේ නැතුව යන්න ඕනා.... වාහනේ සෝදන්න ඕනා..... හරි අභිමානවත් ඉක්මනට යන්නත් පුළුවන්*

*විවාහය කියන්නේ ක්‍රීඩාවක් එකට දෙන්නෙක් ඉන්නම ඕනා.... පොඩි තරගයකුත් තියෙනවා.... තරගයට අදාල නීති රීතිත් තියෙනවා... ඒ තරගය ආරම්භ වෙන්නේ බැදපු දවසේ ඉදලා ඒ තරගයෙන් දෙන්නටම දිනන්නත් පුළුවන් නැත්නම් දෙන්නටම පරදින්නත් පුළුවන්.... දිනුවත් දෙන්නම එකට පැරදුනත් දෙන්නම එකට*

*විවාහය කියන්නේ කොරා පිටේ අන්ධයා යාමක් නෙමේ මොකද කොරාට ඇවිදින්න බැහැ අන්ධයාට පේන්නෙ නැහැ ඒ ගමන අසාර්ථකයි විවාහය කියන්නේ අන්ධයා පිටේ කොරා යාමක් අන්ධයාට පේන්නේ නැති උනාට ඇවිදින්න පුළුවන් කොරාට ඇවිදින්න බැරි උනාට පේනවා එතකොට අන්ධයා පිටේ තමයි කොරා යන්න ඕනා අන්ධයා යනවා...... කොරා අන්ධයාගේ පිටේ ඉදගෙන පාර කියනවා එතකොට ගමන සාර්ථකයි නේද?*

*ආදරය ගනු දෙනුවක් නෙමෙයි දෙයක් දීලා තව දෙයක් ගන්න බැහැ කිසිවක් බලාපොරොත්තු නොවී ආදරය කරන්න එවිට ඔබට ලැබිය යුතු දේ ලැබෙනවා*

**සෙ/5ඩී01670 ලාකෝ ජයරත්න ඩීඑන්**
**5 ශ්‍රීලපාභ සී කණ්ඩායම**

# 3 ලක්ක ගත ලක්කයක්

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ ස්වර්ණමය අවස්ථාවන් සනිටුහන් කරමින් පාබල හමුදා වෙඩිතැබීම් ඛණ්ඩය විසින් 2007 වර්ෂයේ ජූලි 02 සිට ජූලි 07 දක්වා පැවති අන්තර් රෙජිමේන්තු ප්‍රායෝගික පිස්තෝල තරඟාවලියට ඉදිරිපත් වෙමින් විශිෂ්ඨ අන්දමින් තම රෙජිමේන්තුව වෙත කීර්තියක් අත්කර දීමට සමත් වූහ.

ඒ අනුව 2007 වර්ෂයේ පැවති අන්තර් රෙජිමේන්තු ප්‍රායෝගික පිස්තෝල තරඟාවලියට ඉදිරිපත් වෙමින් රෙජිමේන්තු කණ්ඩායම් 14 ක් අභිබවමින් ලකුණු 1230.467 ලබා ගනිමින් අප රෙජිමේන්තු ආධුනික අංශ කණ්ඩායම ප්‍රථම ස්ථානය හා විවෘත අංශ කණ්ඩායම සිව් වන ස්ථානය හිමිකර ගන්නා ලදි. එම ශූරතාවය හිමිකර ගැනීමට එවකට සේනාවිධායකව සිටි බ්‍රිගේඩියර් ඩීඒ අමුණුගම ගේ අධීක්ෂණය යටතේ මේජර් ඒකනායක ගේ මුලික මග පෙන්වීම යටතේ නොපසුබට උත්සාහය තුලින් පුහුණුවීම් ලබා ගැනීමෙන් අප රෙම වෙඩි තැබීම් ඛණ්ඩය තරඟාවලියේ ප්‍රථම ස්ථානය හිමිකරගන්නා ලදි.

එසේම මෙම පිස්තෝල වෙඩි තැබීම අප රෙජිමේන්තුවට හඳුන්වාදීමට මූලිකව කටයුතු කල අපගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වන, **මේජර් ජෙනරාල් එන් මල්ලවආරච්චි, මේජර් ජෙනරාල් එන්ඒ ජයසූරිය , ලුතිතන් කර්නල් අම්පෙමොහොට්ටි** යන නිලධාරීන් මේ අවස්ථාවේ සිහිපත් කිරීම ඉතා වැදගත්ය

එසේම මෙම තරඟාවලියට ඉදිරිපත් වූ තරඟ කරුවන් වූයේ

| | | | |
|---|---|---|---|
| ආධුනික අංශය | | | |
| 1. | නි/65038 | කපිතන් ඩීඑම්ආර්සීඑල් දිසානායක | - 4 ශ්‍රීලපාහ |
| 2. | සෙ/13670 | බනි II හේරත් එච්එම්පීබී | - 6 ශ්‍රීලපාහ |
| 3. | සෙ/309332 | කෝප්‍රල් ලසන්ත පීකේඑච්එම් (ආර්එස්පී) | - 4 ශ්‍රීලපාහ |
| 4. | සෙ/312564 | ලා/කෝප්‍රල් වික්‍රමපාල ඩබ්ඩීබ්ච් | - 1 ශ්‍රීලපාහ |
| විවෘත අංශය | | | |
| 1. | සෙ/1468 | කෝප්‍රල් ලන්සක්කාර එච්ච්එස් | - 4 ශ්‍රීලපාහ |
| 2. | සෙ/317314 | කෝප්‍රල් නන්දසේන කේඑම් | - 10 ශ්‍රීලපාහ |
| 3. | සෙ/316908 | ලා/කෝප්‍රල් නන්දසේන ඩීජී | - 6 ශ්‍රීලපාහ |
| 4. | සෙ/5 ඩී 02578 | සාසෙ විජේරත්න ජීඑච්ජී | - 5(සෙව්) ශ්‍රීලපාහ |



**තරඟාවලිය පුරාවට දස්කම් දක්වා විවිධ අංශ වලින් රන්පදක්කම් 8ක් දිනා තරඟාවලියේ හොඳම වෙඩි තබන්නා ලෙස ශූරතාවය දිනාගත් කෝප්‍රල් ලසන්ත පීකේඑච්එම් (ආර්එස්පී)**

එසේම මෙම තරඟවලියේ විශේෂ ලක්ෂණය වූයේ බනි II හේරත් විසින් තරඟාවලියේ පැවැති තරඟ අදියර 7 න් අදියර 2ක් ප්‍රථම ස්ථානයත් අදියර 2 ක් දෙවන ස්ථානයත් අදියර 2 ක් තුන්වන ස්ථානයත් හිමිකර ගැනීමයි මෙම ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරි දැනට යුධ හමුදා සංචිතයේ 98 වර්ෂයේ සිට ශ්‍රී ලංකා යුධ හමුදාව නියෝජනය කරමින් ශ්‍රී ලංකා යුධ හමුදාවට මෙන්ම අප පාබල රෙජිමේන්තුව වෙත විශාල කීර්තියත් අත්කර දුන් බලළත් නිලධාරියෙකි.

එසේම මෙම තරඟයේ තවත් විශේෂ අවස්ථාවක් වූයේ විවෘත හා ආධුනික අංශ වලින් යුධ හමුදා පිස්තෝල සංචිතය සඳහා තෝරා ගනු ලැබූ 16 දෙනා අතරට අප රෙජිමේන්තුවේ වැඩි සංඛ්‍යාවක් තේරීපත් වීමයි.

ඒ අනුව

| | | | |
|---|---|---|---|
| විවෘත අංශයට | | | |
| 1. | නි/61065 | මේජර් ජීඑම්සීකේබී ඒකනායක ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ | - 11 වන ස්ථානය |
| 2. | සෙ/13670 | බනි II හේරත් එච්එම්පීබී - 6 ශ්‍රීලපාහ | - 2 වන ස්ථානය |
| 3. | සෙ/14863 | කෝප්‍රල් ලන්සක්කාර එච්ච්එස් - 4ශ්‍රීලපාහ | - 13 වන ස්ථානය |
| 4. | සෙ/312564 | ලා/කෝප්‍රල් වික්‍රමපාල එච්ඩබ්ලිච්ච් | - 5 වන ස්ථානය |
| ආධුනික අංශයට | | | |
| 1. | නි/65038 | කපිතාන් ඩීඑම්ආර්සීඑල් දිසානායක ශ්‍රීලපාහ | - 11 වන ස්ථානය |
| 2. | සෙ/309332 | කෝප්‍රල් ලසන්ත පීකේඑච්එම් (ආර්එස්පී) -4 ශ්‍රීලපාහ | - 1 පළවන ස්ථානය |
| 3. | සෙ/316908 | ලා/කෝප්‍රල් නන්දසේන ඩී - 6 ශ්‍රීලපාහ | - 14 වන ස්ථානය |
| 4. | සෙ/5 ඩී 02578 | සාසෙ විජේරත්න ජීඑච්ජී.- 5 (සෙව්) ශ්‍රීලපාහ | - 3 වන ස්ථානය |

තවද මෙම තරඟා වලියේ 2007 වර්ෂයේ ආධුනික අංශයේ අතිදක්ෂ පිස්තෝල වෙඩි තබන්නා වශයෙන් සෙ /309332 කෝප්‍රල් ලසන්ත ජීකේඑච්එම් විසින් කුසලානය හිමි කරගනිමින් මෙම රෙජිමේන්තුව වෙත කීර්තියක් ගෙන දීමට සමත් වූහ.



රෙම ශ්‍රීලපාහ වෙත කීර්තියක් ලබාදුන් වෙඩිතැබීමේ කණ්ඩායම

**නි/65038**
**කපිතන් ඩීඑම්ආර්සී දිසානායක ශ්‍රීලපාහ**



# කොටියා
## වරද්ද ගත්ත තැන

තොප්පිගල නැගෙනහිරෙන් කොටිනට තිබූ ප්‍රබල තැන
සාම්පූර් ගැහුවට පසු කොටියා මැරුනේ මුහුදෙ පැන
වන් ඟයු ටූ දමා දිව්වේ වාකරෙන් බැරීම තැන
මාවිල්ආරු තමයි කොටියා වරද්ද ගත්ත නියම තැන

සෙ/309170
කෝප්‍රල් ටිකිරිබණ්ඩා කේඒ
4 ශ්‍රීලපාහ

## පැතුම සාමයයි.

රටේ කොනක යුධ ගිනිදල් ඇවිලෙද්දී
වටේ සමහරුන් නින්දෙන් ගොරවද්දී
බැටේ දෙන්න කොටියා දත නියවද්දී
කටේ පස් වැටෙයි සාලය දෙදරද්දී

සෙ/315889 සාසෙ තිස්සපාල කේබීජී
ඒ කණ්ඩායම 8 ශ්‍රීලපාහ

## උපන් දිනය ළඟයි පුතුගේ

උපන් දිනය ලඟ එනවා හරි සතුටුයි පුතු හට
තෑගි අරන් ඔබ එනවා හැමදාමත් ඒ දිනයට
මගෙන් ඇහුව උපන් දිනය දා ඔබ එනවද නිවාඩුවට
ඔබ එන්නැති බව කීවා දුක හිතුණා පුතු සිතට

හයිටි රාජ්‍යයේ සේවය කරන බනි 11 චන්ද්‍රසෝම ඩීඑල්ආර් ගේ
බිරිඳ ඉන්දි දිසානායක

## ප්‍රහේලිකා අංක 35

**නිවැරදි විසඳුම්පත් 2008 අප්‍රේල් මස**
**15 වන දිනට පෙර එවිය යුතුය.**
තරඟ කූපනය සහ තරඟ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

### වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 35

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 3 | | | | 1 | | | 4 |
| | 8 | | | | | | | 2 |
| | | | | 7 | | | | |
| | | | 5 | | 2 | | | |
| | 1 | | | | | | | |
| | 6 | | | | | | 3 | 9 |
| 9 | | | | | 6 | | | |
| | | 4 | | | | | | 8 |
| | | | | | 9 | | 5 | |

1. කුඩා කොටු නවය කින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.
2. කුඩා කොටු නවය තුල 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුලත් විය යුතු අතර එය පිළිවෙලකට අවශ්‍ය නොමැත.
3. කුඩා කොටු නවය ඇතුලත් විශාල කොටු නවය සම්පූර්ණ කල පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුලත් විය යුතුය.
4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, ආනත අතටද 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුලත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.
5. කුඩා කොටු නවය ඇතුලත් විශාල කොටුවක හා සිරස්, තිරස්, ආනත අතට එකතුවේ අගය 45 ක් විය යුතුය.

## ප්‍රහේලිකා අංක 32 නිවැරදි විසඳුම

**ප්‍රහේලිකා අංක 32**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 4 | 6 | 8 | 3 | 7 | 1 | 2 | 9 | 5 |
| 1 | 9 | 7 | 8 | 5 | 2 | 6 | 4 | 3 |
| 2 | 5 | 3 | 6 | 4 | 9 | 7 | 1 | 8 |
| 5 | 7 | 4 | 2 | 6 | 3 | 9 | 8 | 1 |
| 6 | 1 | 9 | 7 | 8 | 4 | 5 | 3 | 2 |
| 3 | 8 | 2 | 1 | 9 | 5 | 4 | 6 | 7 |
| 7 | 3 | 6 | 9 | 2 | 8 | 1 | 5 | 4 |
| 8 | 2 | 5 | 4 | 1 | 6 | 3 | 7 | 9 |
| 9 | 4 | 1 | 5 | 3 | 7 | 8 | 2 | 6 |

**ප්‍රහේලිකා අංක 32**
**ජයග්‍රහණය කර නොමැත.**



## සම්බුදු පියාණනී

සියපත් සේ සතර විලේ............
අරහත් ගුණ බෙදා දෙන්න....
හදවත පුදසුනට මගේ හිමියනි වැඩ වදාරන්න
රෑට පිපෙන පුන්සඳ සේ ආලෝකය ලබාදෙන්න.

පාට හයෙන් බැබළි බැබළි හිමියනි වැඩ වදාරන්න
අමිල දහම් පදවල ඇත සිත් සනසන නාද රිද්ම
නළල තබා දෝත නගා..........
වඳිනෙමු මුණි සිරි පාද පද්ම.

සෙ/ 2 ඩී 03197
සාසෙ දයාරත්න ඩී ඒ ටී
2(සෙවි) ශ්‍රීලපාහ

### තරඟ කොන්දේසි :

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සමාජිකයන් හට සහභාගි විය නොහැක.
3. පළමුවන, දෙවන, හා තුන්වන ජයග්‍රහණ හිමි කර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙලින් රු. 1000/- රු. 750/- රු500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයයේ තීරණය අවසාන තීරණය ලෙස සැලකේ.
5. ප්‍රහේලිකා අංක 35 හි නිවැරදි විසඳුම් පත් 2008 අප්‍රේල් මස 15 වන දිනට පෙර එවිය යුතුයි.
6. නිවැරදි පිළිතුරු තුනකට වඩා ඇත්නම් කුසපත් ඇදීමෙන් තෝරාගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි දීම සිදු කෙරේ.
7. පිළිතුරුපත් එවන ලියුම් කවරයේ වම්පස උඩ කෙලවරේ, වයිට් හැකල් ප්‍රහේලිකා අංක 35, යනුවෙන් සඳහන් කළ යුතුයි.

**ලිපිනය :** වයිට් හැකල් කර්තෘ
වයිට් හැකල් ප්‍රකාශන අංශය
රෙම ශ්‍රීලපාහ
යුද්ධ හමුදා ජනපදය
පනාගොඩ
හෝමාගම

## වයිට් හැකල් ප්‍රහේලිකාව

**අංක 35**

### කූපනය

අංකය :........................................
නිලය :........................................
නම :........................................
රාජකාරී ලිපිනය :........................................
........................................
........................................
ඒකකය :........................................
හැ.පත් අංකය :........................................



# සහනදායී මිලට සුඛෝපභෝගී බස් සේවාවක්

ඔබගේ සහ පවුලේ සාමාජිකයින් ගේ විනෝදගමන්, වන්දනා ගමන් සහ වෙනත් ගමන් අවශ්‍යතා උදෙසා රෙම ශ්‍රීලපාහ වෙතින් සහනදායී ගාස්තු යටතේ සුඛෝපභෝගී බස් රථයක සේවය ලබා ගැනීමට අවස්ථාව සලසා දී ඇත.



ආසන 28 කින් යුත් වායු සමනය සහිත.
කිලෝමීටරයක ධාවන අයකිරීම
පහත සඳහන් පරිදි වන අතර,
වෙළඳපලේ ඉන්ධන මිල
වෙනස් වීම අනුව අයකිරීම්
ගාස්තුව වෙනස් විය හැකිය.

රෙජිමේන්තු නිලධාරීන් / සෙසු නිලයන්
සඳහා අයකිරීම රු 30.00
වෙනත් රෙජිමේන්තු නිලධාරීන් /
සෙසු නිලයන් සඳහා රු 40.00
සිවිල් අයවළුන් සඳහා රු 50.00
කිලෝමීටර 100 ට වඩා අඩු ධාවනයකදී
එක් දිනක ධාවන වියදම රු  රු 4000.00

## වෙන්කරවා ගැනීම සඳහා විමසීම්


ප්‍රවාහන අංශය - රෙම ශ්‍රීලපාහ

0114866172
0112748286
0112855204



අන්තර් රෙජිමේන්තු එල්ලේ තරඟාවලිය 2007 ශූරතාවලිය හිමිකරගත් ශ්‍රීලපාහ කණ්ඩායම

# රෙජිමේන්තු සේනාවිධායක ශ්‍රීලපාහ විසින් ඒකක සංචාරය සිදුකිරීම.



**2007** අගෝස්තු මස 27 දින මිහින්තලය යුද හමුදා කඳවුරේදී හා 2007 සැප්තැම්බර් මස 08 සහ 09 දිනයන් වල 552 බළසේනා මූලස්ථානයේදී රෙජිමේන්තු සේනාවිධායක ශ්‍රීලපාහ වන කර්නල් ඩබ්ලිව් වීරක්කොඩි හා ඒකක අණදෙන නිලධාරීන් අතර, සාකච්ජාවක් පැවති අතර, එම සාකච්ජාවන් හිදී රෙජිමේන්තුවේ ඉදිරි අභිවෘර්ධිය තකා ඉතා වැදගත් කරුණු රාශියක් පිළිබඳව විමසුමට ලක්වන ලදි. තවද සාකච්ජාවට බඳුන් වූ කරුණු අතරින් පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්වීම සිදුවිය.

**● ක්‍රියාන්විත රාජකාරීන්ට අදාලව ඒකකවල පවතින ගැටළු ● නිලධාරී උසස් කිරීම්/ නිල ස්ථිර කිරීම් ● සෙසුනිල උසස් කිරීම්/ නිල ස්ථිර කිරීම් ● විශ්‍රාම ගොස්, අස්ව ගොස් ඇති අයවළුන්ගේ නිරවුල් නොවී පවතින ගැටළු සහ ඉදිරි ක්‍රියාමාර්ග ● අරෙසේ නිලධාරී/ සෙසු නිල ගැටළු හා දීර්ඝ කාලීනව අරෙසේ අයවලුන් මුදවාලීම ● මිය ගිය අතුරුදන් අයවළුන්ගේ යැපෙන්නන්ගේ දීමනා ලබාදීම සබැඳි දැනට ඇති ගැටළු ● නව ශ්‍රීලපාහ ඒකක ස්ථාපනය කිරීම සඳහා හට පිරිස් ලබා ගැනීමේ සැලසුම් ● නිමනොවී පවතින මුපද ගැටලු සහ ගත යුතු ක්‍රියාමාර්ග ● සහනාධාර ණය යෝජනාක්‍රම පිළිබඳව හා රෙජිමේන්තු සුභසාධක කටයුතු ● ආධුනික සෙබළුන් බඳවා ගැනීම් ● පාඨමාලාවන් සඳහා සෙබලුන්ව ලබාදීමේදී ඒකක දායකත්වය.**



මෙම සාකච්ජාවන් වලදී ඒකක අණදෙන නිලධාරීන් හට පැන නැගුණු ගැටළු රාශියකටම විසඳුම් ලබාදීමට හැකිවූ අතර, එමගින් ඒකකයන් හි රාජකාරී කරණු ලබන අයවළුන්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමෙහිලා ඉමහත් පිටුවහලක් විය.

මෙවැනි සාකච්ජා වලදී ගැටළු සහගතව පවතින ප්‍රශ්න රාශියකට විසඳුම් ලබාගත්තා සේම ඉදිරියේදී ද මෙවැනි සාකච්ජා පැවැත්වීමෙන් මෙයට වඩා කාර්යක්ෂමව ඒකකයන්ට රාජකාරී කිරීමට හැකිවනවා සේම රෙජිමේන්තු මධස්ථානය වෙතින් ඒකකයන් වෙත විශාල මෙහෙයක් සිදුකිරීමට හැකිවන බැව් සතුටින් යුතුව සටහන් තබමි. එම සංචාරයන් වලදී කාචයට හසුවූ විශේෂ දසුන් කිහිපයක් නම්............

වයිටි හැකල් ප්‍රකාශන අංශය
රෙම ශ්‍රීලපාහ

